

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

(වැය ශීර්ෂ අංකය 123)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

8 සහ 17 මහල, සුහුරුපාය, බත්තරමුල්ල
දුරකථන 011 2080 633
ෆැක්ස් 011 2 080 639
විද්‍යුත් තැපෑල : info@moudh.gov.lk
වෙබ් අඩවිය : www.moudh.gov.lk

පටුන

පිටු අංකය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ..... 1 - 41

1. **නාගරික සංවර්ධන අංශය** ..... 42 - 76
(පෙර පැවති නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම
හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය)

2. **නිවාස හා ඉදිකිරීම් අංශය** ..... . 77 - 115
(පෙර පැවති ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත
රාජ්‍ය අමාත්‍යාංශය)

3. **වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන අංශය** ..... 116 - 154
(පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය)

4. **වතු නිවාස අංශය** ..... 155 - 196
(පෙර පැවති වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම්
රාජ්‍ය අමාත්‍යාංශය)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

01.පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ..... 1 - 6
1. හැඳින්වීම.....
2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන් .....
3. සංවිධාන සටහන.....
4. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු.....
5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන.....
6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු.....

02.පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... 7 - 21
2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග .....
2.2. ඉදිරි ඉලක්ක.....

03.පරිච්ඡේදය

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය..... 22 - 27

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය.....
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය.....
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.....
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්.....
3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය.....
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය.....
3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන .....
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය.....
3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව.....

04. පරිච්ඡේදය

4. කාර්යසාධන දර්ශක..... 28 - 28

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

05.පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ..... 29 - 30

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු.....
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....

06.පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ ..... 31 - 31

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.....
6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය.....
6.3. මානව සම්පත් සංවර්ධනය.....

පරිච්ඡේදය 07

7. අනුකූලතා වාර්තාව..... 32 - 41

05.පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

සුවපහසු සහ සුපිරිසිඳු නගර ඇති කිරීම සඳහා ජනතාවට අවශ්‍ය නේවාසික හා නාගරික පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින් 2020 අගෝස්තු 09 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පිහිටුවන ලදී. 2022.04.28 දිනැති හා අංක 2277/53 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, නිවාස රාජ්‍ය අමාත්‍යාංශය, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය හා වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් කාර්යයන් හා කර්තව්‍යයන් පවරන ලදී.

2022.05.27 දිනැති අංක 2281/41 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නැවතත් ඉහත කැබිනට් අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශ ඒකාබද්ධ කරමින් දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන 21කින් සමන්විත වූ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පිහිටුවන ලදී.

ඉන් අනතරුව 2022 ජූලි 22 වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යළි ගැසට් කරන ලදී.

ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමන් විසින් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 21 හා සියලු ම ව්‍යාපෘතිවල සමස්ත වගකීමගෙන කටයුතු කරන අතර අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාවය වැඩිකිරීමේ අරමුණින් අංක 2304/17 හා 2022.11.01 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය අමාත්‍යවරුන් දෙදෙනෙකු වෙත එනම්, ගරු නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ මැතිතුමා වෙත ආයතන හයක් හා ගරු නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා වෙත ආයතන අටක් වශයෙන් වගකීම පවරන ලදී.

2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/RED/COPA/2019/01 හා 2020.01.30 දිනැති ලිපියෙන් හඳුන්වාදෙනු ලැබ ඇති විශේෂ ආකෘති පත්‍රයට අනුව 2022 මූල්‍ය වර්ෂයට අදාළව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබ ඇති කාර්යයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

දැක්ම

තිරසර නගර සහ සැමට නිවාස

මෙහෙවර

නාගරික සංවර්ධනය ක්‍රමවත් කිරීම, සියලු ප්‍රජාවන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් ලබාදීම, භෞතික සැලසුම්කරණය, ඉදිකිරීම් කර්මාන්තය සඳහා පහසුකම් සැපයීම, වෙරළ සංරක්ෂණය සහ සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම, ගංවතුර පාලනය සහ තෙත්බිම් කළමනාකරණය, ඉඩම්

සංවර්ධනය සහ සභාධිපත්‍ය කළමනාකරණය තුළින් නාගරික සංවර්ධනය හා නිවාස ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සැකසීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය ලබාදීම.

ප්‍රධාන කාර්යයන්

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා නාගරික සංවර්ධන හා නිවාස විෂයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදාගනිමින් සියලු ම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- මහනගර, උපනගර හා තදාසන්න නගර සැලසුම්කරණය හා සංවර්ධනය.
- නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරීම හා නියාමන කටයුතු.
- පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස සංකීර්ණ ඉදිකිරීම හා සංවර්ධනය.
- මධ්‍යම පාන්තිකයන් ගේ නිවාස ගැටලු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ණය පහසුකම් සැලසීම.
- කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රම හඳුන්වා දීම.
- නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායී මිල යටතේ ඉඩම් ලබාදීම මගින් නව නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දිරිමත් කිරීම.
- නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.
- වගකීම් රහිත කසළ බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම.
- සියලු ම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූලව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම.
- සියලු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන හා ආබාධිත අය සඳහා ප්‍රවේශ පහසුකම් ඇති කිරීම සහතික කිරීම.
- ජාතික භෞතික සැලසුම් හා ප්‍රාදේශීය භෞතික සැලසුම් පිළියෙල කිරීම.
- ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනමේ කර ගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා නියාමනය සිදුකිරීම.
- සභාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ නියාමන කටයුතු.
- මහජන සභාධිපත්‍ය ප්‍රතිසංස්කරණය කිරීම සහ කාර්යක්ෂම සහ කඩිනම් ලෙස නිවාසවල අයිතිය පැවරීම.
- පහත්බිම් සංවර්ධනය කිරීමට අදාළ කටයුතු.
- නාගරික ප්‍රදේශවල පිහිටි සේවා හා පහසුකම් අඩුපාඩු සහ වගුරු බිම් පොදු සැලැසුමකට අනුව සංවර්ධනය කිරීමට අවශ්‍ය මගපෙන්වීම.
- රජයේ නිල නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි සඳහා ප්‍රමිති හා ප්‍රතිමාන නියාමනය කිරීම.
- අඩු ආදායම්ලාභීන් සහ විශේෂිත ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පරිසර හිතකාමී ලෙස පිරිවැය ඵලදායී නිවාස තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳ ග්‍රාමීය ජනතාවට මග පෙන්වීම.

- රජයේ ආයතනවලට යාන්ත්‍රික ඉංජිනේරු සේවා සැපයීම.
- අදාළ නීති රීති හා ප්‍රමිතීන්වලට අනුව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය.
- ඉදිකිරීම් කර්මාන්තයට උපදේශනය හා නියාමන සේවා සැපයීම.
- බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.
- උචිත තාක්ෂණය උපයෝගි කර ගනිමින් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තය දියුණු කිරීම.
- දේශීය ඉදිකිරීම්කරුවන් ශක්තිමත් කිරීම.
- දේශීය සුළු හා මධ්‍යම පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන් ශක්තිමත් කිරීම හා ආරක්ෂාව සැලසීම.
- ඉංජිනේරු උපදේශන සේවා හා ඉදිකිරීම් කටයුතු.
- සමුද්‍ර දූෂණ නිවාරණ කටයුතු.
- සමුද්‍ර සහ සමුද්‍රාශ්‍රිත දූෂණ නිවාරණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- වෙරළ සංරක්ෂණය හා ආරක්ෂණය.
- අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් මුහුදු තීරයට සහ මුහුදු පතුලට සිදු වී ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රජයේ සහ පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් නව ගම්මාන සහ නගර නිර්මාණය කිරීම.
- වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශය පියවර ගැනීම.
- ග්‍රාමීය වතු අංශයන් හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන "ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන" පිහිටුවීම.
- වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

1.3. සංවිධාන සටහන


නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
ලේකම්
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා පාලන) ශ්‍රී.ප.සේ (විශේෂ)
අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) ශ්‍රී.ඉ.සේ (විශේෂ)
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා මෙහෙයුම්) ශ්‍රී.ක්‍ර.සේ (විශේෂ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී ශ්‍රී.ග.සේ (විශේෂ)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී.ප.සේ (I)
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) ශ්‍රී.ප.සේ (I)
අධ්‍යක්ෂ (සංවර්ධන) ශ්‍රී.ඉ.සේ (I)
අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) ශ්‍රී.ක්‍ර.සේ (I)
ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ග.සේ (I)
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ග.සේ (I)
සහකාර ලේකම් ශ්‍රී.ප.සේ (III/II)
ස.අ/නි.අ ශ්‍රී.ප.සේ (III/II)
ස.අ/නි.අ ශ්‍රී.ප.සේ (III/II)
ස.අ/ නි.අ ශ්‍රී.ඉ.සේ (III/II)
ස.අ/නි.අ ශ්‍රී.ක්‍ර.සේ (III/II)
ස.අ/නි ශ්‍රී.ක්‍ර.සේ (III/II)
ගණකාධිකාරී ශ්‍රී.ග.සේ (III/II)
අභ්‍යන්තර විගණක ශ්‍රී.ග.සේ (III/II)
පරිපාලන නිලධාරී රා.ක.සේ සුප්‍රා
ස.නි 06
රා.ක.සේ 06
සිළුගැනීමේ නි 01
රියදුරු 12
ක.ක.ස 03
වීඩියෝ දර්ශන ශිල්පී 01
ඡායාරූප ශිල්පී 01
සහායක ඡායාරූප ශිල්පී 01
ස.නි 03
ක.ක.ස 01
ස.නි 03
රා.ක.සේ 01
ක.ක.ස 01
ස.නි 03
රා.ක.සේ 01
ක.ක.ස 01
ස.නි 03
රා.ක.සේ 01
ක.ක.ස 01
ස.නි 03
රා.ක.සේ 01
ක.ක.ස 01
ස.නි 02
රා.ක.සේ 04
ක.ක.ස 01
ස.නි 06
රා.ක.සේ 02
ක.ක.ස 01

1.4. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- සභාධිපත්‍ය අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
- හොටෙල් ඩිවලෙපර්ස් (ලංකා) සමාගම
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය
- වැවිලි මානව සංවර්ධන භාරය
- සෞම්‍යාමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම
- වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල

➢ **අමාත්‍යාංශය යටතේ පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශ**

- නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
- නිවාස රාජ්‍ය අමාත්‍යාංශය
- වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
- වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

2022 මැයි 27 දින අංක 2281/41 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් වීමෙන් අනතුරුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ කාර්යයන් විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා ඉහත පැවති රාජ්‍ය අමාත්‍යාංශ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පවතින පහත පරිදි අංශ 4ක් ලෙස ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

- නාගරික සංවර්ධන අංශය
- නිවාස හා ඉදිකිරීම් අංශය
- වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන අංශය
- වතු නිවාස අංශය

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

	ව්‍යාපෘතියේ නම		දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම		ව්‍යාපෘති කාල සීමාව
				විදේශීය	දේශීය	
1	කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය*		ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව)	213 (ඇ.ඩො.මි)	108 (ඇ.ඩො.මි)	2012 - 2021
2	උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති	නුවර සහ ගාල්ල*	ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව)	68 (ඇ.ඩො.මි)	34 (ඇ.ඩො.මි)	2014 - 2021
		යාපනය*		28 (ඇ.ඩො.මි)	10 (ඇ.ඩො.මි)	2016 - 2021
		අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය	52.0 (යූරෝ මි.)	10.4 (යූරෝ මි.)	2016 - 2023
3	කොළඹ නාගරික පුනර්ජීව ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය		ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)	200 (ඇ.ඩො.මි)	87 (ඇ.ඩො.මි)	2019 - 2025

* මෙම ව්‍යාපෘතීන්හි භෞතික කාර්යයන් 2021.12.31 දින නිම කරන ලද අතර මූල්‍ය කටයුතු 2022.06.30 දින නිම කරන ලදී.

02.පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

I. දෙපාර්තමේන්තු/ ආයතන

<u>ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව</u>

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික භෞතික සැලසුම සකස් කිරීම සහ ජාතික භෞතික සැලසුම මත පදනම්ව කලාපීය හා ප්‍රාදේශීය සැලසුම් සකස් කිරීමයි. ඊට අමතරව,

- කුඩා නගර සඳහා සැලසුම් යාවත්කාලීන කිරීම, සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර සඳහා සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- පූජා භූමි සඳහා සැලසුම් යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ආගමික ස්ථාන සහ ආයතනවල භෞතික සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ජාතික සැලසුම් තොරතුරු පදනම නඩත්තු කිරීම යන කාර්යයන් ද සිදු කරනු ලබයි.

2022 වසරේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

#	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුව (රු.මි.)	ප්‍රතිලාභ	වෙන්කරන ලද මුදල - 2022 (රු.මි.)	2022.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය	
					භෞතික (%)	මූල්‍ය (රු.මි.)
1	භෞතික සැලසුම් - ජාතික සැලස්ම සහ කලාපීය සැලසුම් දෙකක් (නැගෙනහිර සහ මධ්‍යම)	5.2	• මනාව සැලසුම් කළ යටිතල පහසුකම් සංවර්ධනය සහ රට තුළ නිසි මහජනෙන්වීමක් සහිත නාගරීකරණ රටාව	5.2	67	2.89
2	නගර සංවර්ධන සැලසුම්- අනුරාධපුර ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය	1450	• පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස රාජධානියෙහි පුරාවිද්‍යා කැණීම් සහ සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම • අනුරාධපුර පූජා නගරය කෙරෙහි දෙස් විදෙස් සංචාරකයන්ගේ සහ වන්දනාකරුවන්ගේ ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම	1.5	10	-

#	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුව (රු.මි.)	ප්‍රතිලාභ	වෙන්කරන ලද මුදල - 2022 (රු.මි.)	2022.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය	
					භෞතික (%)	මූල්‍ය (රු.මි.)
			• අනුරාධපුර පූජා නගරය අවට වෙසෙන දේශීය ජනතාව සඳහා ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීම			
3	කතරගම පුදබිමේ වන්දනාකරුවන්ගේ විවේකය සඳහා නවාතැන් සැපයීමේ ගොඩනැගිලි අලුත්වැඩියාව	50	• කතරගම පුදබිමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සහ බැතිමතුන්ට සහනදායී මිලකට නවාතැන් ලබා දීම මගින් එහි ආකර්ශනය ප්‍රවර්ධනය කිරීම • කතරගම පූජා නගරය අවට වෙසෙන දේශීය ජනතාවට ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීම	17.7	2.45	0.50

❖ **විශේෂ ජයග්‍රහණ**

- ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කිරීම අවසන් කර ඇති අතර, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.
- නැගෙනහිර සහ මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රාදේශීය සැලසුම් කමිටු පත්කිරීම සඳහා විෂය භාර අමාත්‍යවරුන්ගේ කැමැත්ත ලබාගෙන ඇති අතර, අදාළ ආයතන සමග දත්ත රැස් කිරීම, තත්ත්ව විශ්ලේෂණය සහ වැඩමුළු පැවැත්වීමේ කටයතු සිදුකරමින් පවතී.
- 2021.12.21 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සභා සීමාව තුළ නාගරික ප්‍රදේශ හඳුනාගෙන සීමා නිර්ණය කිරීම ආරම්භ කර ඇත. මිණුම් දඩු සැකසීම අවසන් කර ඇති අතර, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සහ ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඇතුළත්ව ක්‍රියාකාරී කමිටුවක් පත්කර ඇත.
- අනුරාධපුර ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය යටතේ ජාතික ස්වේච්ඡා නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව පූජාභූමියේ පදිංචි ජනතාව සඳහා නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීම ආරම්භ කිරීම හා පුරාවිද්‍යාත්මක භූමිය සංරක්ෂණය සහ සංචාරක ආකර්ෂණය සහතික කිරීම පිණිස සියලු නාගරික පහසුකම්වලින් යුත් සහ ජනතාවගේ ජීවනෝපායන්ට අවම අවහිරතා සහිත නව නගරයක් පූජා භූමිය ආසන්නයේ සංවර්ධනය කිරීම මගින් ඇතුල් නුවර ජීවත් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම ආරම්භ කිරීම.

- පූජා භූමි ප්‍රකාශයට පත් කිරීමේ දී නිර්ණායක ජාතික වශයෙන්, කාලපීය වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් වන ස්ථාන යන නිර්ණායක තුනක් යටතේ තෝරාගනු ලබන පූජා භූමි 26ක් 2023 වසරේ දී ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් ආයතනය, 100% කොටස්වල හිමිකාරීත්වය මහා භාණ්ඩාගාරය සතු රාජ්‍ය ව්‍යාපාරයකි. එම ආයතනය ආගන්තුක සත්කාර ව්‍යාපාරයෙහි විශිෂ්ටතම ස්ථානයක ඉහළ ම ගුණාත්මකභාවයකින් යුතුව තිරසර අන්දමින් කටයුතු කරනු ලබයි.

ජාත්‍යන්තර මට්ටමේ හොටෙල් මෙහෙයුම් මගින් අඛණ්ඩව වටිනාකම් වැඩිදියුණු කරමින් අමුත්තන් උපරිම අන්දමින් තෘප්තිමත් කිරීම,කොටස්කරුවන්ගේ ප්‍රතිලාභ ඉහළ නැංවීම,අඛණ්ඩ පුහුණු සහ සංවර්ධනය කිරීම තුළින් වෘත්තිමය ප්‍රවීනතාවයන්ගෙන් සපිරුණු ආගන්තුක සත්කාරයෙන් යුත් කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සහ සක්‍රිය අන්දමින් ශ්‍රී ලංකාව නැගී එන සංචාරක කළාපීය ගමනාන්තයක් බවට ප්‍රවර්ධනය කිරීම මෙම ආයතනයේ ප්‍රධාන මෙහෙවරයි.

❖ **විශේෂ ජයග්‍රහණ**

- වාර්ෂික ආදායම 2021 වසරේ රු.බිලියන 1.1 සිට 2022 වසරේ දී රු.බිලියන 2.8 දක්වා වැඩි වීම.
- 2021 වර්ෂය තුළ බදු, ක්ෂය සහ පොලී අඩු කිරීමට පෙර මෙහෙයුම් අලාභයක් වූ රු.මිලියන 441ක ප්‍රමාණය 2022 වර්ෂය වන විට මෙහෙයුම් ලාභයක් ලෙස රු.මිලියන 159 දක්වා ඉහළ යාම.
- ISO 22000: 2018 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකය ලබාගැනීම.

❖ **අභියෝග**

- 2023 සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය ව්‍යාපෘතින්හි ඉදිරි කටයුතු සඳහා බලපානු ඇත.
- ඉන්ධන, විදුලිබල සැපයුමේ බිඳවැටීම් හා ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම ඉලක්ක කරා ලගාවීමට අපහසු වීම.

II. ව්‍යාපෘති

<u>කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය</u>

කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සංරචක දෙකකින් සමන්විත විය. එයින් පළමු සංරචකයේ ඉලක්කය වූයේ ඉහළ සමාජ-ආර්ථික පිරිවැයක් සහිත කොළඹ නාගරික ප්‍රදේශයේ ආර්ථිකය නිතිපතා අඩාල කෙරෙන ගංවතුර මඟින් ඇති කෙරෙන ගැටලු හඳුනා ගැනීමයි. කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අධ්‍යයනයකින් පසුව ප්‍රමුඛතා ව්‍යාපෘති ලෙස හඳුනාගෙන තිබූ ගංවතුර පාලනය සහ ජලාපවහන කළමනාකරණය සම්බන්ධ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියාකාරකම් සඳහා එමඟින් මූල්‍යාධාර සපයන ලදී. දෙවන සංරචකය මඟින් කොළඹ අගනගර ප්‍රදේශය ලෝක මට්ටමේ නගරයක් බවට සංවර්ධනය කිරීම, මහජනතාවට එහි සේවාවන් වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා අඩිතාලම දැමීම සහ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර තිබුනි.

- ව්‍යාපෘතියේ අරමුණු

කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සංරචක මඟින් ප්‍රධාන අරමුණු දෙකක් ඉලක්ක කරන ලදී.

1) කොළඹ ජල ද්‍රෝණියේ ජල පෝෂක ප්‍රදේශවල ගංවතුර අවම කිරීම.

2) තෝරාගත් ආදර්ශන ආයෝජන හරහා දේශීය යටිතල පහසුකම් සහ සේවාවන් ප්‍රතිසංස්කරණය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා කොළඹ මහනගර සභාවට අයත් පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය මඟින් බල ප්‍රදේශ 4ක් ආවරණය කරනු ලැබී ය; කොළඹ මහනගර සභාව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව, දෙහිවල ගල්කිස්ස මහනගර සභාව සහ කොළොන්නාව නගර සභාව.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, කොළඹ මහනගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහාය ඇතිව ව්‍යාපෘති 54ක් සම්පූර්ණ කර ඇති අතර අවසන් කළ ව්‍යාපෘතීන් අතරට පොම්පාගාර 3ක්, වැසි ජලාපවහන උමං මාර්ග 2ක්, ඇළ මාර්ග සහ ඇළ හැරවුම් යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම, ගංවතුර දොරටු සහ ජලාපවහන දොරටු, තෙත්බිම් උද්‍යාන සහ රේඛීය උද්‍යාන සංවර්ධනය කිරීම ඇතුළත් වේ. ගංවතුර හා ජලාපවහන කළමනාකරණය යටතේ ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම ද යටිතල පහසුකම් සංවර්ධනය යටතේ උද්‍යාන වැඩිදියුණු කිරීම, මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ පදිකයන්ගේ පහසුකම් ප්‍රවර්ධනය හා පොදු පහසුව සඳහා අනෙකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළත් විය. අර්ධ වශයෙන් නිම කළ ව්‍යාපෘතීන් ගණන 02කි. භාණ්ඩ ආනයන සීමා හේතුවෙන් ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියේ වැඩ කටයුතු ද පදිංචිකරුවන් ඉවත් කිරීමේ ගැටලුවක් මත නොරිස් ඇළ ව්‍යාපෘතියේ ද වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.

මෙම ව්‍යාපෘතියේ භෞතික කටයුතු 2021 දෙසැම්බර් 31 දින නිම කරන ලද අතර මූල්‍යමය කටයුතු 2022 ජුනි 30 දින නිම කරන ලදී.

❖ **මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම	**2022 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මී.)**	**වියදම (රු. මී.)**
කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය	3120.49	2937.42

❖ **විශේෂ ජයග්‍රහණ**

ඒකාබද්ධ මෙහෙයුම් මගින් කොළඹ අගනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද පහසුකම් මඟින් 2021 සහ 2022 වර්ෂ කාලවල දී ගංවතුර අවම කරන ලදී.

<u>උපාය මාර්ගික නගර සංවර්ධනය ව්‍යාපෘතිය</u>

මහනුවර, ගාල්ල හා යාපනය

ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය නංවාලීමේ ප්‍රයත්නයක් වශයෙන් තරඟකාරී, පාරිසරික වශයෙන් තිරසර හා මනාව සම්බන්ධිත නගර පද්ධතියක් ලෙස ද්වීතීක නගර සංවර්ධනය කිරීමේ නාගරික දැක්ම පෙරදැරිව රජය විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාශය යටතේ උපායමාර්ගික නගර සංවර්ධන වැඩසටහන ආරම්භ කරන ලදී.

සෑම නගර කලාපයක් තුළ ම ඒකාබද්ධ නාගරික සේවාවන් වැඩිදියුණු කිරීම සහ පොදු නාගරික අවකාශය වැඩිදියුණු කිරීම වැනි පුළුල් උපාය මාර්ගික ආයෝජන කාණ්ඩ දෙකක් ඉලක්ක කරගනු ලබන අතර එමගින් නගරයේ ක්‍රියාකාරී අංශ මෙන් ම නගරයේ ආකර්ශණීය බව සහ ජීවත් වීමේ හැකියාව වැඩිදියුණු වේ. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලැබුවේ ලෝක බැංකුව විසිනි.

මූලික ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 147ක් වූ අතර මහනුවර සහ ගාල්ල නගරයන්හි සංවර්ධන මැදිහත් වීම් සඳහා (ශ්‍රී ලංකා රජයේ) දායකත්වය ඇමරිකානු ඩොලර් මිලියන 34ක් විය. මව් ව්‍යාපෘතිය 2014 ඔක්තෝබර් 16 දින ආරම්භ විය. පසුව, 2016 ඔක්තෝබර් 19 දින ආරම්භ කරන ලද යාපනය නගරයේ සංවර්ධන මැදිහත්වීම් සඳහා අතිරේක මූල්‍යයනයක් ලෙස එක්සත් ජනපද ඩොලර් මිලියන 10ක් සහ ශ්‍රී ලංකා රජයේ දායකත්වය සහිතව ඩොලර් මිලියන 55ක ණය මුදලක් ලබා දී ඇත.

2020 දී ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය (KMTT) සඳහා තනි ව්‍යාපෘතියක් ලෙස අරමුදල් සැපයීම සඳහා ඩොලර් මිලියන 65ක ණය අවලංගු කරන ලදී. ඉන් අනතුරුව, ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි KMTT ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මහාමාර්ග අමාත්‍යාංශය වෙත පැවරිණි. 2021 දී පස්වන ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ යාපනයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එහි අතිරේක මූල්‍ය ණයවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 27ක් අවලංගු කර එම අරමුදල් වෙන ම නව හදිසි කොවිඩ් 19 IDA ණය සඳහා වෙන් කරන ලදී.

ව්‍යාපෘතියේ භෞතික කටයුතු 2021 දෙසැම්බර් 31 දින නිම කරන ලද අතර මූල්‍යමය කටයුතු ද 2022 ජූනි 30 වැනි දින අවසන් කරන ලදී.

- ව්‍යාපෘතියේ අරමුණු

ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මහනුවර, ගාල්ල සහ යාපනය යන නගර කලාපවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික අවකාශයන් වැඩි දියුණු කිරීමයි.

ව්‍යාපෘතියේ සමස්ත අවධානයට ලක් වූ අංග

(අ) නාගරික සේවා සහ පොදු විවෘත අවකාශ වැඩිදියුණු කිරීම

- ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සහ රථවාහන කළමනාකරණය
- ජල සම්පාදන පද්ධතිය පුළුල් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම
- ප්‍රධාන කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම
- තෝරාගත් වීදී සහ පොදු ස්ථාන වැඩිදියුණු කිරීම සහ ඓතිහාසික මෙන් ම විශේෂිත වැදගත්කමක් සහිත ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය තුළින් නාගරික වැඩිදියුණුව ඇති කිරීම
- නගර සංවර්ධන උපාය මාර්ගයක් සකස් කිරීම.

(ආ) ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය

නාගරික යටිතල පහසුකම් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ව්‍යාපෘති හවුල්කාර ආයතන වෙත ධාරිතා වර්ධන සහාය සැපයීම.

❖ මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම		2022 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.)	වියදම (රු. මි.)
උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය	මහනුවර සහ ගාල්ල	9.898	9.526
	යාපනය	1480.10	1418.48

❖ විශේෂ ජයග්‍රහණ

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ කරන ලද උප ව්‍යාපෘතීන් පහත පරිදි වේ.

අංකය	සම්පූර්ණ කරන ලද උප ව්‍යාපෘති	ඒකකය	ඉලක්කය	ජයග්‍රහණ	%
මහනුවර					
1.	ජල පවිත්‍රාගාර	සංඛ්‍යාව	01	01	100
2.	අපජල පවිත්‍රාගාර	සංඛ්‍යාව	01	01	100
3.	ඉදිකරන ලද සහ ආරම්භ කරන ලද මතුපිට ජලාශ	සංඛ්‍යාව	03	03	100
4.	ජල සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පයිප්පවල දිග ප්‍රතිස්ථාපනය	කි. මී.	13.00	13.73	100
5.	Supply of Valves, Bulk flow meters, High lift Pumps etc.	ඔව් / නැත	ඔව්	ඔව්	100
6.	මහනුවර වැවේ රොන්මඩ අවම කිරීම සඳහා ඉදිකරන ලද රොන් මඩ උගුල්	සංඛ්‍යාව	05	05	100
7.	භූගත හා මතුපිට වැසි ජල අපවහන පද්ධතිවල දිග ප්‍රතිසංස්කරණය	ව්‍යාපෘතීන් සංඛ්‍යාව කි. මී.	5 4.0	5 4.38	100 100

අංකය	සම්පූර්ණ කරන ලද උප ව්‍යාපෘති	ඒකකය	ඉලක්කය	ජයග්‍රහණ	%
8.	ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගවල දිග	කි. මී.	9.0	9.0	100
9.	ආරක්ෂිත දැල්, ධර්මපාල මාවතේ පස් නැංගුරම් සහිත බෑවුම් ස්ථාවර කිරීම	ඔව් / නැත	ඔව්	ඔව්	100
10.	මාර්ග නිවැරදි කිරීමේ කටයුතු, (DI පයිප්ප, PE පයිප්ප. බෝක්කු, රැඳවුම් බිත්ති ආදිය)	ඔව් / නැත	ඔව්	ඔව්	100
11.	මහනුවර ඇතුළුව ප්‍රතිසංස්කරණය කරන ලද බස් පහසුකම් (පර්යන්ත) සංඛ්‍යාව	ව්‍යාපෘතීන් සංඛ්‍යාව	03	03	100
12.	උපයෝගිතාවය බැලීම, අවශ්‍ය ප්‍රවේශ මාර්ග, බස් හුවමාරු මෙහෙයුම් සඳහා ආධාරක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම	ඔව්/නැත	ඔව්	ඔව්	100
13.	ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර යන්ත්‍ර ලබා දීම	සංඛ්‍යාව	1650	1650	100
14.	Global Navigation Satellite System (GPS)	සංඛ්‍යාව	2380	2380	100
15.	ගෘහ භාණ්ඩ සහ උපකරණ සහිත බස් පාලන මධ්‍යස්ථානය	සංඛ්‍යාව	01	01	100
16.	සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශ (නැරඹුම් තට්ටුව, ටොම්ලින් උද්‍යානය, රථ ගාලෙහි වහල මුදුන සහ ජෝර්ජ් ද සිල්වා උද්‍යානය)	වර්ග මීටර්	30,775	30,775	100
17.	දේශීය සහ විදේශීය අමුත්තන් සඳහා ප්‍රතිසංස්කරණය කරන ලද නගර නැරඹුම් තට්ටුව (Arthur's Seat)	සංඛ්‍යාව	01	01	100
18.	ප්‍රතිසංස්කරණය කරන ලද ඇවිදීමේ ප්‍රදේශය	වර්ග මීටර්	15000	15000	100
19.	දේශීය වන්දනාකරුවන් සහ දේශීය හා විදේශීය අමුත්තන් සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි ගණන	සංඛ්‍යාව	01	01	100
20.	මහනුවර ශ්‍රී ලංකා දුම්රිය සඳහා නව මහල් හතර (04) ගොඩනැගිල්ල	සංඛ්‍යාව	01	01	100
21.	නව දැව වැඩමුළු ගොඩනැගිල්ල සහ ප්‍රවේශ මාර්ගය	සංඛ්‍යාව	01	01	100
22.	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර මහනගර සභාව හා සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට උපකරණ ලබා දීම	කොන්ත්‍රාත් සංඛ්‍යාව රු. මී.	15 ගිවිසුම් 411.2	15 ගිවිසුම් 411.2	100 100
ගාල්ල					
1.	ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ඇළ මාර්ග සහ ප්‍රාදේශීය කාණුවල දිග වැඩි දියුණු කිරීම	කි. මී.	14.00	13.65	97.5
2.	පාලම් ප්‍රතිසංස්කරණය කිරීම	සංඛ්‍යාව	07	08	100
3.	සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශය (උද්‍යාන, සාගර මාර්ගය, කොටුව බලකොටුව)	වර්ග මීටර්	91,128	91,128	100
4.	පොදු උද්‍යාන ප්‍රතිසංස්කරණය (ධර්මපාල උද්‍යානය)	සංඛ්‍යාව	01	01	100
5.	අලුතින් ඉදි කරන ලද හෝ	කි. මී.	2.0	2.0	100

අංකය	සම්පූර්ණ කරන ලද උප ව්‍යාපෘති	ඒකකය	ඉලක්කය	ජයග්‍රහණ	%
	ප්‍රතිසංස්කරණය කරන ලද බැම්ම / පැති ඇවිදීමේ දිග				
6.	අලුතින් ඉදි කරන ලද හෝ ප්‍රතිසංස්කරණය කරන ලද සාගර මාර්ගයේ දිග	කි. මී.	1.2	1.5	100
7.	ගාල්ල මහනගර සභාව සඳහා ගබඩා ගොඩනැගිල්ල	සංඛ්‍යාව	01	01	86
8.	ගාල්ල මහනගර සභාව සහ PID වෙත ඔවුන්ගේ වාහන සහ ඇළ නඩත්තු වැඩසටහන් සඳහා උපකරණ (වත්කම්) ලබා දීම.	කොන්ත්‍රාත් සංඛ්‍යාව රු. මී.	09 158.83	09 158.83	100 100
යාපනය					
1.	මාර්ගවල දිග ප්‍රතිසංස්කරණය කිරීම	කි. මී.	25.0	21.56	86
2.	වැසි ජල අපවහන පද්ධතියේ දිග ප්‍රතිසංස්කරණය කිරීම	කි. මී.	1.63	1.63	100
3.	ඉදිකරන ලද හෝ ප්‍රතිසංස්කරණය කරන ලද පොදු පහසුකම් (පොදු වැසිකිළි) ගණන	සංඛ්‍යාව	06	06	100
4.	යාපනයේ Pocket Parks ප්‍රතිසංස්කරණය කිරීම	සංඛ්‍යාව	03	03	100
5.	සාමාන්‍ය ජනතාව සඳහා ප්‍රතිසංස්කරණය ක කරන ලද ප්‍රදේශය	චර්ග මීටර්	9,295	9,295	100
6.	ප්‍රතිසංස්කරණය කරන ලද පොදු පොකුණු සංඛ්‍යාව	සංඛ්‍යාව	02	02	100
7.	යාපනය මහ නගර සභාව වෙත ඔවුන්ගේ නඩත්තු වැඩසටහන සඳහා උපකරණ ලබා දීම (ගලි බවුසර්, කසළ එකතු කරන ට්‍රක් රථ, ට්‍රැක්ටර් ආදිය)	ඔව්/ නැත	ඔව්	ඔව්	100
8.	යාපනය මහ නගර සභාව වෙත කසළ සහ මළාපවහන එකතු කිරීමේ සහ බැහැර කිරීමේ වැඩසටහන්වලට භාවිතා කිරීම සඳහා උපකරණ (වත්කම්) ලබා දීම	කොන්ත්‍රාත් සංඛ්‍යාව රු. මී.	09 178.8	09 178.8	100 100

අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය පිළිබඳ ප්‍රංශ නියෝජිත ආයතනයේ (AFD) ණය පහසුකමක් ඇතිව ක්‍රියාත්මක කරනු ලැබූ ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිවලින් එකක් ලෙස අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP) ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වූයේ අනුරාධපුර පූජා නගරය හා නව නගරය අතර සමබරව සිදුකරන සංවර්ධනයක් ඇති කිරීම මගින් ආර්ථිකය ප්‍රේරණය කරමින් නගරයේ සංස්කෘතික උරුමයෙන් උපරිම වාසි සලසා ගැනීමයි.

මෙම ව්‍යාපෘතිය අනුරාධපුර මහනගර සභා බල ප්‍රදේශයට අයත් වේ. පහත දැක්වෙන උපායමාර්ගික පෙළගැස්ම මත පදනම් ව ඒකාබද්ධ නාගරික සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු විය.

1) සංස්කෘතික උරුමයන්හි ආකර්ෂණය ශක්තිමත් කිරීම තුළින් ප්‍රධාන ආර්ථික මර්මස්ථානය බවට අනුරාධපුර නගරය පත් කිරීම.
2) අනුරාධපුර භූමිය පරිශීලනය කරන සියලු දෙනාගේ - වැසියන්ගේ, වන්දනාකරුවන්ගේ සහ සංචාරකයින්ගේ ප්‍රයෝජනය සඳහා ඔවුන්ගේ භාවිතාවන් සහ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම.
3) පහසුවෙන් අස්ථාවරභාවයට පත්විය හැකි අනුරාධපුර භූමි භාගයේ තිරසාර සහසංවර්ධනය සඳහා අදාළ වන මූලික ම සාධකය වන්නේ පාරිසරික සංරක්ෂණය සහ සම්ප්‍රදාය ආරක්ෂා කිරීමයි.

- ව්‍යාපෘතියේ අරමුණ

මෙම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වන්නේ අනුරාධපුර නගරයේ ආකර්ශණයට හේතුවන ප්‍රධානතම සාධකය වන සංස්කෘතික සහ ස්වභාවික උරුමය ආරක්ෂා වන පරිදි, එහි පූජනීය සහ නවීන ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් සිදු කිරීමයි.

ව්‍යාපෘති සංරචක සහ උප සංරචක පහත පරිදි වේ.

- සංරචකය 1 : තිරසාර යටිතල පහසුකම්
  අ) ගංවතුර අවදානම අවම කිරීම සඳහා නාගරික ජලාපවහනය වැඩිදියුණු කිරීම
  ආ) නාගරික සංචලනය වැඩිදියුණු කිරීම - ප්‍රවේශය, සංසරණය සහ රථවාහන කළමනාකරණය වැඩිදියුණු කිරීම
  ඇ) පොදු අවකාශය වැඩිදියුණු කිරීම - පොදු අවකාශයේ හා ස්ථානීය ආකර්ශනයේ ගුණාත්මක බව පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
  ඈ) මූල්‍යමය යටිතල පහසුකම්හි තිරසාර කළමනාකරණය සඳහා වත්කම් හිමියන් සඳහා ධාරිතා ගොඩනැගීම

- සංරචකය 2 : ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම
  අ) ශක්‍යතා අධ්‍යනය
  ආ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පිරිවැය
  ඇ) අධීක්ෂණය හා මෙහෙයුම් ක්‍රියාවලිය
  ඈ) නාගරික සැලසුම්කරණය සහ උරුම කළමනාකරණය සඳහා ධාරිතා ගොඩනැගීම

❖ **මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම	**2022 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මි.)**	**වියදම (රු. මි.)**
අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය	976.53	890.48

❖ **විශේෂ ජයග්‍රහණ**

සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති

- දුම්රිය ප්ලාසා ගොඩනැගිල්ල සංවර්ධනය
- සිංහ කණුව වටරවුම නැවත සංවර්ධනය කිරීම
- ශ්‍රී මහාබෝධිය නැගෙනහිර රථගාල ඉදිකිරීම

ඒ හැරුණු විට පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.

	ව්‍යාපෘතිය	භෞතික ප්‍රගතිය (%)
1	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා එළිමහන් රංග පීඨය නැවත සංවර්ධනය කිරීම	83
2	සුරපුර එළිමහන් රංග පීඨය නැවත සංවර්ධනය කිරීම	79
3	ධර්මපාල මාවතේ භූමි අලංකරණ කටයුතු	95
4	මිරිසවැටිය රථගාල සංවර්ධනය කිරීම	85
5	ලංකාරාමය රථගාල සංවර්ධනය කිරීම	78
6	ශ්‍රී මහා බෝධි දකුණු දොරටු රථගාල සංවර්ධනය කිරීම	95
7	දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම (ව්‍යාපෘතියේ විෂය පථය අඩු කිරීමෙන් අනතුරුව)	90

<u>නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය</u>

කොළඹ නගරයේ ජනගහනයෙන් සියයට පනහකට වැඩි පිරිසක් ජීවත් වන්නේ නගරයේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට නවයක් වූ අඩු පහසුකම් සහිත ජනාවාස හෝ අබලන් වූ පැරණි නිවාස යෝජනා ක්‍රමවල ය. 2010 වසරේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද සමීක්ෂණයකින් මානව වාසයට සුදුසු සෞඛ්‍ය සම්පන්න වාතාවරණයක් සහ පිරිසිදු ජලය, විදුලිය, සනීපාරක්ෂාව වැනි මූලික යටිතල පහසුකම් සඳහා ප්‍රවේශයක් නොමැති ප්‍රජා පොකුරු 1,499 ක (අඩු පහසුකම් සහිත ජනාවාස) ජීවත් වන පවුල් 68,812ක් දැනට හඳුනාගෙන තිබේ. නගර සංවර්ධන සැලසුම් අරමුණු සපුරාලීම සඳහා පිළිගත හැකි ප්‍රමිතීන් සහිත නව නිවාස යෝජනා ක්‍රමවල මෙම පවුල් නැවත පදිංචි කිරීම පිරිසිදු හා ප්‍රසන්න වාතාවරණයක් සහිත ලොව පිළිගත් නගරයක් බවට කොළඹ නගරය පත්කිරීමේ මෙහෙයුමෙහි එක් ප්‍රධාන පියවරකි.

මෙම අරමුණු සපුරාලීම සඳහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය විසින් කොළඹ නගරයේ සහ එහි ආසන්න තදාසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස නැවත ස්ථානගත කිරීම සඳහා නිවාස ඒකක 50,000 ක් ඉදිකිරීමේ වැඩසටහනක් දියත් කර තිබෙන අතර එකී අරමුණ වෙනුවෙන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.

මේ වන විට ඉහත වැඩසටහන යටතේ ව්‍යාපෘති 22ක් අවසන් කර ඇති අතර ඒ අනුව නිවාස ඒකක 13,814ක් අවසන් කර ඇති අතර පවුල් 11,269ක් ඔවුන්ගේ නව නිවාසවල නැවත පදිංචි කර ඇත. ව්‍යාපෘති දෙකක (601 වත්ත නිවාස ඒකක 450 හා කොළොන්නාව නිවාස ඒකක 336) තවත් නිවාස ඒකක 786ක් නිම කිරීමේ විවිධ අදියරවල පවතී.

	ව්‍යාපෘතියේ නම	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
1	601 වත්ත නිවාස ඒකක 450ක් ඉදිකිරීම	99
2	කොළොන්නාව නිවාස ඒකක 336ක් ඉදිකිරීම	96
3	කොළඹගේමාවත නිවාස ඒකක 615ක් ඉදිකිරීම* (ශේෂ වැඩ නැවත ප්‍රදානය කිරීම)	39
4	ටොරින්ටන්හි නිවාස ඒකක 115 ක් ඉදිකිරීම**	11

*39%ක ප්‍රගතියක් සහිතව කොන්ත්‍රාත්තුව අවසන් විය. භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැති වීම නිසා ඉදිකිරීම් කටයුතු නතර කර තිබේ.

** කොන්ත්‍රාත්තුව අවසන් වී ඇත. ඉතිරි වැඩ සඳහා එක් ලංසුවක් ලැබී ඇත. භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැති වීම නිසා ඉදිකිරීම් කටයුතු නතර කර තිබේ.

වත්මන් ආර්ථික අර්බුදයට සමගාමීව, රට සාමාන්‍ය තත්ත්වයට පත් වන තෙක් නාගරික පුනර්ජීවන ව්‍යාපෘති වැඩසටහන දිගටම කරගෙන යාමට, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය හරහා ඉදිකරන ලද නිවාස විවෘත වෙළෙඳපොළේ අලෙවි කර අරමුදල් උත්පාදනය කිරීම හරහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට නියමිත මුදල් ගෙවීමට හා දැනට තාවකාලිකව අත්හිටුවා ඇති නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා රජයේ මූල්‍ය පහසුකම් ලැබෙන තුරු ස්වයංමූල්‍යකරණ යාන්ත්‍රණය නමින් නාගරික පුනර්ජීවන වැඩසටහන ඉදිරියට යාමට(CP No:22/1500/618/020 දින 23-09-2022) අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුමැතිය සඳහා යොමු කරන ලදී.

❖ **මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම	**2022 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මි.)**	**වියදම (රු. මි.)**
නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය	1190.0	1189.88

❖ **විශේෂ ජයග්‍රහණ**

- නිවාස ඒකක 450ක් ඉදිකරනු ලබන 601 වත්ත නිවාස ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 99.68%කි.
- නිවාස ඒකක 336ක් ඉදිකරනු ලබන කොළොන්නාව නිවාස ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 96%කි.

<u>කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය</u>

කොළඹ නගරය ආශ්‍රිත ව අඩු ආදායම් ජීවන තත්වයන් යටතේ ජීවත් වන පවුල් 50,000ක් පදිංචි කිරීම සඳහා 2010 දී නාගරික පුනර්ජීවන වැඩසටහන ආරම්භ කරන ලදී. ඉහත නිවාස වැඩසටහන වේගවත් කිරීම සඳහා 2025 වන විට තවත් නිවාස 5,500 ක් ඉදි කිරීමට අපේක්ෂා කෙරේ. එම නිසා 2019 අප්‍රේල් සිට බලපැවැත්වෙන පරිදි කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට ආධාර කිරීම ආරම්භ කරන ලදුව මෙම ව්‍යාපෘතිය, ව්‍යාපෘති 09ක් යටතේ නිවාස ඒකක 5500 ක් ඉදිකිරීමට යෝජිතව ඇති නමුත් ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ එයින් නිවාස ඒකක 4074 ක් ව්‍යාපෘති 06ක් යටතේ කොන්ත්‍රාත්තු පිරිනමා වැඩ ආරම්භ කර ඇත. නාගරික සැලසුම්, නැවත පදිංචි කිරීම් සහ පශ්චාත් පදිංචි කිරීමේ ප්‍රතිපත්ති, නිවාස නඩත්තු කටයුතු, නැවත සංවර්ධනය කිරීමේ ප්‍රවේශයන්හි නවෝත්පාදනයන් සහ නිවාස සඳහා මහජන මැදිහත්වීම්වල දිගු කාලීන තිරසාරභාවය සමාලෝචනය කිරීම වැනි සැලකිය යුතු අංශ වැඩිදියුණු කිරීම කොළඹ නාගරික පුනජීවන ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. ව්‍යාපෘතිය සංරචක තුනකින් සමන්විත වේ.

පළමු සංරචකය - නිවාස ඉදිකිරීම: අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා දැරිය හැකි මිලකට බහු මහල් නිවාස ගොඩනැගිලිවල නිවාස ඒකක 4,074 ක් පමණ ඉදි කිරීමට සහාය ලබා දීම;

දෙවැනි සංරචකය - ඉඩම් නැවත සංවර්ධනය : අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට අයත් කුටුම්භයන් නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ ඉදිකරන ලද නව මහල් නිවාස ඒකකයන්හි පදිංචියට ගිය පසු ලබා ගත හැකි ඉඩම්වලින් ලබාගත හැකි ආදායම මෙම සංරචකය මගින් උපරිම කෙරේ.

තෙවැනි සංරචකය - තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය: නාගරික පුනර්ජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය සහ වෙනත් ක්‍රියාමාර්ග සඳහා සහාය ලබා දීම.

- ව්‍යාපෘතියේ අරමුණු

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ නිවාස තත්වයන් වැඩිදියුණු කිරීම සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති හා පද්ධති වැඩිදියුණු කිරීම් සමඟ දැරිය හැකි මිලකට නිවාස ඉදිකිරීමේ හා ඉඩම් නැවත සංවර්ධනය කිරීමේ ආයෝජන තුළින් කොළඹ ඉඩම් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමයි. ව්‍යාපෘතියට ඇතුළත් වන්නේ: දැරිය හැකි මිලකින් යුත් නිවාස ඒකක 5,500 ක් පමණ ඉදි කිරීම (වර්තමානයේ, ප්‍රතිව්‍යුහගතකිරීම යටතේ නිවාස ඒකක 4,074 ක් යෝජනා වී ඇත); ඌන සංවර්ධිත ප්‍රජාවන්හි කුටුම්භ නව මහල් නිවාස ඒකකයන්හි පදිංචියට ගිය පසු ලබා ගත හැකි ඉඩම්වලින් ලබාගත හැකි ආදායම උපරිම කිරීම සහ තාක්ෂණික සහාය හා ප්‍රතිපත්තීන් වැඩි දියුණු කිරීමයි.

- ව්‍යාපෘති පිරිවැය සහ මූල්‍ය සැලැස්ම

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) ඇමරිකානු ඩොලර් මිලියන 130 ක් සහ ශ්‍රී ලංකා රජය ඇමරිකානු ඩොලර් මිලියන 28 ක් අරමුදල් සපයයි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 158 කි.

අයිතමය	පිරිවැය (රු. මි.)	මූල්‍යන මූලාශ්‍ර (රු. මි.)			
		ආසියානු පහසුකම් ආයෝජන බැංකුව (AIIB)		ශ්‍රී ලංකා රජය	
1 වන සංරචකය	127.0	108.0	85%	19.0	15%
2 වන සංරචකය	11.0	10.0	91%	1.0	9%
3 වන සංරචකය	14.0	6.0	42%	8.0	58%
ශුද්ධ ව්‍යාපෘති පිරිවැය (බදු සහ තීරු බදු හැර)	152.0	124.0	81%	28.0	19%
ප්‍රාග්ධනිත ආරම්භක ගාස්තුව,බැඳීම් ගාස්තු සහ IDC (ඉදිකිරීම් අතරතුර ඇති පොළිය)	6.0	6.0	100%		
එකතුව	158.0	130.0	82%	28.0	18%

❖ **මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ නම	2022 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මි.)	වියදම (රු. මි.)
කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය	5529	5849.82

ක්‍රියාත්මක තත්වයේ පවතින නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති

	ව්‍යාපෘතිය	**2022.12.31** දිනට සමස්ත භෞතික ප්‍රගතිය (%)
1.	ඇපල්වත්ත II අදියරෙහි නිවාස ඒකක 700ක් ඉදිකිරීම	22
2.	කොළඹගේ මාවත නිවාස ඒකක 624ක් ඉදිකිරීම	52
3.	ෆර්ගියුසන් පාරේ නිවාස ඒකක 750ක් ඉදිකිරීම	07
4.	ස්ටෙඩියම්ගම නිවාස ඒකක 1000ක් ඉදිකිරීම	77
5.	මාදම්පිටිය නිවාස ඒකක 700ක් ඉදිකිරීම	15

සංරචකය 2

අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට අයත් කුටුම්භයන් නාගරික පුනර්ජීවන වැඩසටහන (URP) යටතේ ඉදිකරන ලද නව මහල් නිවාස ඒකකයන්හි පදිංචියට ගිය පසු ලබා ගත හැකි ඉඩම්වලින් ගත හැකි ආදායම මෙම සංරචකය මගින් උපරිම කෙරේ. දැනට, ප්‍රතිව්‍යුහගත කිරීමට අනුකූලව උපදේශණ සේවා ලබාගැනීමට අදාළ "යොමුකිරීමේ අනුදේශ" ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙත අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇත. 2023 වසරේ අපේක්ෂිත අයවැය ප්‍රතිපාදන විදේශ මූල්‍ය වලින් රුපියල් මිලියන 593.7 කි.

සංරචකය 3

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය සහ අනෙකුත් ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ පියවරයන් සඳහා මෙම සංරචකය මගින් සහාය වනු ඇති අතර පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

1. නාගරික සංවර්ධන අධිකාරියේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි නිළධාරීන්ගේ කුසලතා හා හැකියාවන් තවදුරටත් වර්ධනය කිරීම.
2. මෙම ව්‍යාපෘතිය මගින් හිමිකම් ලබන ප්‍රතිලාභීන් සඳහා සහාය වීම.
3. ව්‍යාපෘතියට අදාළ නාගරික පුනර්ජීවන හා ජාතික නාගරික නිවාස ප්‍රතිපත්ති සැකසීම.
4. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා වන මූලික සමාජ ආර්ථික තොරතුරු රැස්කිරීමේ සමීක්ෂණය හා කුසලතා ප්‍රවර්ධන හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම.
5. "කොළඹ නගරයේ නගර නියාමන සැලැස්ම" යන උප ව්‍යාපෘතිය වෙනත් විදේශ ආධාර සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීමේ හැකියාව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් පවතින අතර එසේ නොවුවහොත් එම ව්‍යාපෘතිය "කොළඹ නගරයේ නාගරික පුනජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයවීමේ ව්‍යාපෘතිය" තුළින් ම ඉටුකිරීමට කටයුතු කිරීම.

<u>චීන ආධාර යටතේ ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිය</u>

ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි, අඩු ආදායම්ලාභීන් සඳහා සහනාධාර සහිත නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර සැපයීමට චීන සමූහාණ්ඩු රජය එකඟ විය. මෙම ව්‍යාපෘතිය අඩු ආදායම්ලාභීන් සඳහා අවශ්‍ය පහසුකම් සහිත සහනාධාර නිවාස ඒකක 1996කින් සමන්විත

විය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිකිරීම් පිරිවැය යුවාන් මිලියන 552 කි. මෙම වැඩසටහන යටතේ නිවාස සංවර්ධන ඉදිකිරීම් සඳහා පහත ස්ථාන හඳුනාගෙන තිබුනි.

- පැලියගොඩ නිවාස ඒකක 615ක් ඉදිකිරීම
- දෙමටගොඩ නිවාස ඒකක 586ක් ඉදිකිරීම
- මහරගම නිවාස ඒකක 112ක් ඉදිකිරීම
- පලතුරුවත්තේ නිවාස ඒකක 108ක් ඉදිකිරීම
- මොරටුව නිවාස ඒකක 575ක් ඉදිකිරීම

- ව්‍යාපෘතියේ අරමුණ

කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ලබාදීම

❖ **විශේෂ ජයග්‍රහණ**

- Letter of Exchange මුදල් අමාත්‍යාංශය සහ චීන ජාත්‍යන්තර සංවර්ධන සංස්ථාව විසින් අත්සන් කර ඇත.
- චීන පාර්ශවය විසින් එවන ලද කෙටුම්පත් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචනය කර දෙපාර්ශවය විසින් සාකච්ඡා කර එකඟ වී ඇත.
- මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර එයින් 40%ක් පමණ මෙ වන විට අවසන් කර ඇත. ඒ අනුව, ලංසු ලේඛනය දක්වා සැලසුම් කිරීම සහ ලේඛනගත කිරීම බොහෝ දුරට අවසන් වී ඇත. කෙසේ වෙතත් ලංසු තැබීම සහ ඉදිකිරීම් කටයුතු තවමත් ආරම්භ කර නොමැත.

<u>නාගරික ව්‍යාපෘති සකස් කිරීමට පහසුකම් සැපයීම - තිරසර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය</u>

ත්‍රිකුණාමලය, දඹුල්ල, කුරුණෑගල හා රත්නපුර යන නගර 4 සඳහා ව්‍යාපෘති සැලැස්ම සකස් කිරීම මෙමඟින් සිදු කිරීමට අපේක්ෂිත ය.

- ව්‍යාපෘතියේ අරමුණ

සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

❖ **විශේෂ ජයග්‍රහණ**

1. තාවකාලිකව අත්හිටුවන ලද ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති කාලය 2024 මාර්තු මස දක්වා දීර්ඝ කිරීම.
2. ක්‍රියාත්මක කිරීමේ ණය (Implementation Loan) ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත ඇමරිකානු ඩොලර් මිලියන 30 – 40ක මුදලක් ප්‍රදානය කිරීමට නියමිත ය. එමඟින් සංචාරක අමාත්‍යාංශයේ උපදේශනය යටතේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා ප්‍රමුඛගත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට නියමිත ය.

2.2. ඉදිරි ඉලක්ක

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ජාතික භෞතික සැලැස්ම - 2022 ක්‍රියාත්මක කිරීම හා නැගෙනහිර හා මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලසුම් සකස්කොට අවසන් කිරීම
- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් කුරුණෑගල සහ මහරගම නිවාස ඒකක 900ක් ස්වයං අරමුදල් යාන්ත්‍රණයෙන් ඉදිකිරීම.
- 2023 වර්ෂය තුළ දී කොළඹ නාගරික පුනර්ජීව ව්‍යාපෘතිය සඳහා සහාය ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන කොළඹගේ මාවත නිවාස ඒකක 624 සහ ස්ටේඩියම්ගාම නිවාස ඒකක 1000කින් යුතු නිවාස ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් දෙක 2023 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.
- චීන ආධාර යටතේ ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාව සහ චීන සමූහාණ්ඩුව අතර ද්විපාර්ශවීය ගිවිසුම අත්සන් කිරීම.
- හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් වෙතින් හිල්ටන් සන්නාම ප්‍රමිතියට සහ වෙළඳපොළ තරගයට ගැලපෙන පරිදි අමුත්තන්ගේ කාමර නවීකරණය කිරීම හා බහුවිධ උත්සව සඳහා පහසුකම් සහිත ආපනශාලා වැඩි දියුණු කිරීම.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

ඩබ් .එස් .සත්‍යානන්ද
ලේකම්

2023.02. 28

03.පරිච්ඡේදය

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

ACA - F

Ministry of Urban Development and Housing
Statement of Financial Performance
for the period ended 31st December 2022

Rs.

Budget 2022 Rs.		Note	Actual 2022 Rs.	Actual 2021 Rs.	
-	**Revenue Receipts**		-	-	
-	Income Tax	1	-	-	ACA-1
-	Taxes on Domestic Goods & Services	2	-	-	
-	Taxes on International Trade	3	-	-	
-	Non Tax Revenue & Others	4	-	-	
-	**Total Revenue Receipts (A)**		-	-	
-	**Non Revenue Receipts**		-	-	
-	Treasury Imprests		6,307,498,094	4,994,616,298	ACA-3
-	Deposits		427,477,186	205,428	ACA-4
-	Advance Accounts		38,353,746	3,421,169	ACA-5
-	Other Main Ledger Receipts		-	3,478,798	
-	**Total Non Revenue Receipts (B)**		6,773,329,027	5,001,721,693	
-	**Total Revenue Receipts & Non Revenue Receipts C = (A) + (B)**		6,773,329,027	5,001,721,693	
	Remittance to the Treasury (D)		40,000,000	-	
	Net Revenue Receipts & Non Revenue Receipts E = (C) -(D)		6,733,329,027	5,001,721,693	
	Less: Expenditure				
-	**Recurrent Expenditure**		-	-	
607,636,703	Wages, Salaries, & Other Employment Benefits	5	567,176,934	47,408,776	
547,717,990	Other Goods & Services	6	510,581,147	73,576,521	ACA-2(ii)
1,003,970,696	Subsidies, Grants and Transfers	7	955,996,169	381,085	
-	Interest Payments	8	-	-	
550,000	Other Recurrent Expenditure	9	134,980	15,000.00	
2,159,875,389	**Total Recurrent Expenditure(D)**		**2,033,889,230**	**121,381,382**	
	Capital Expenditure				
35,298,488	Rehabiliation & Improvement of Capital Assets	10	22,931,058	3,590,873	
119,927,851	Acquisition of Capital Assets	11	117,151,017	1,463,703	
1,597,786,947	Capital Transfers	12	1,505,427,311	-	ACA-2(ii)
-	Acquisition of Financial Assets	13	-	-	
2,070,000	Capacity Building	14	1,616,818	47,000	
22,258,525,568	Other Capital Expenditure	15	20,770,366,720	15,943,439,758	
24,013,608,854	**Total Capital Expenditure (G)**		**22,417,492,924**	**15,948,541,334**	
	Deposits Payments		643,409,407	210,866	ACA-4
	Advance Payments		134,576,837	4,719,796	ACA-5
	Other Main Ledger Payments		-	-	
	Total Main Ledger Expenditure (H)		**777,986,244**	**4,930,661**	
-	**Total Expenditure I=(F+G+H)**		24,829,368,398	16,074,853,377	
-	**Balance as at 31st December J = (E-I)**		**(18,096,039,371)**	**(11,073,131,684)**	
	Balance as per the Imprest Reconciliation Statement		18,096,039,371	11,073,131,684	ACA-7
	Imprest Balance as at 31st December		-	-	ACA -3

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ACA - P

Ministry of Urban Development and Housing
Statement of Financial Position
As at 31st December - 2022

	Note	Actual 2022 Rs.	2021 Rs.
Non Financial Assets			
Property, Plant & Equipments		1,227,667,019	107,181,385
Work In Progress	ACA-6	921,278,867	-
Intangible Assets		572,500	572,500
Financial Assets			
Advance Accounts	ACA-5/5(a)	275,505,526	6,341,179
Cash & Cash Equivalents	ACA-3	20,000,000	-
Total Assets		**2,445,023,912**	**114,095,064**
Non Assets / Equity			
Net Worth to Treasury		-1,869,074,699	6,341,179
Property, Plant & Equipment Reserve		1,227,667,019	107,181,385
Intangible Assets Reserve		572,500	572,500.00
Work In Progress		921,278,867	
Rent and Work Advance Reserve	ACA-5(b)	172,941,256	
Current Liabilities			
Deposits Accounts	ACA-4	1,971,638,969	
Imprest Balance	ACA-3	20,000,000	-
Total Liabilities		**2,445,023,912**	**114,095,064**

Detail Accounting Statements in ACA format Nos. 1 to 7 presented in pages from 07 to 67 and Notes to accounts presented in pages from 68 to 90 form and integral parts of these Financial Statements. The Financial Statements have been prepared in complying with the Generally Accepted Accounting Principles whereas most appropriate Accounting Policies are used as disclosed in the Notes to the Financial Statements and hereby certify that figures in these Financial Statements, Notes to accounts and other relevant accounts were reconciled with the Treasury Books of Accounts and found to in Agreement.

We hereby certify that an effective internal control system for the financial control exists in the Reporting Entity and carried out periodic reviews to monitor the effectiveness of internal control system for the financial control and accordinghly make alternations as required for such system to be effectively carried out

.....
Chief Accounting Officer
Name :
Designation :
Date: 28/02/2023
W.S. Sathyananda
SLAS (SPECIAL GRADE)
MBA(Ballarat), PGD(La Trobe), B.Sc (Sri Jayawardenepura)
Secretary
Ministry of Urban Development and Housing
17th Floor, "Suhurupaya" Battaramulla

.....
Accounting Officer
Name :
Designation :
Date:

.....
Chief Financial Officer/Chief Accountant/
Director (Finance)/Commissioner (Finance)
Name:
Date:
G.A.I. Lelwala
Chief Financial Officer
Ministry of Urban Development & Housing
17th Floor, "Suhurupaya"
Battaramulla.

2

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ACA-C

Ministry of Urban Development and Housing
Statement of Cash Flows
for the Period ended 31st December - 2022

		Actual	
		2022 Rs.	2021 Rs.
Cash Flows from Operating Activities			
Total Tax Receipts		-	-
Fees, Fines, Penalties and Licenses		-	-
Profit		-	-
Non Revenue Receipts		400,733,092	3,478,798
Revenue Collected on behalf of Other Revenue Heads		-	-
Imprest Received	Note 1	6,307,498,094	4,994,616,298
Recoveries from Advance		116,788,225	2,628,203
Deposit Received		185,090,592	205,428
Total Cash generated from Operations (A)		7,010,110,004	5,000,928,726
Less - Cash disbursed for:			
Personal Emoluments & Operating Payments		6,195,389,751	4,994,153,277
Subsides & Transfer Payments		40,997,025	381,085
Expenditure incurred on behalf of Other Heads		106,190,035	-
Imprest Settlement to Treasury		40,000,000	-
Advance Payment		127,199,520	4,719,796
Deposits Payment		425,553,352	210,866
Total Cash disbursed for Operations (B)		6,935,329,683	4,999,465,023
NET CASH FLOW FROM OPERATING ACTIVITIES (C) = (A) - (B)		74,780,322	1,463,703
Cash Flows from Investing Activities			
Interest		-	-
Dividends		-	-
Divestiture Peoceeds & Sale of Physical Assets		-	-
Recoveries from On Lending			-
Total Cash generated from Investing Activities (D)		-	-
Less - Cash disbursed for:			
Purchase or Construction of Physical Assets & Acquisition of Other Investment		74,780,322	1,463,703
Total Cash disbursed for Investing Activities (E)		74,780,322	1,463,703
NET CASH FLOW FROM INVESTING ACTIVITIES(F) = (D) - (E)		(74,780,322)	(1,463,703)
NET CASH FLOWS FROM OPERATING & INVESTMENT ACTIVITIES (G)=(C)+(F)		(0)	(0)
Cash Flows from Financing Activities			
Local Borrowings		-	-
Foreign Borrowings		-	-
Grants Receieved		-	-
Total Cash generated from Financing Activities (H)		-	-
Less - Cash disbursed for:			
Repayment of Local Borrowings		-	-
Repayment of Foreign Borrowings		-	-
Total Cash disbursed for Financing Activities (I)		-	-
NET CASH FLOW FROM FINANCING ACTIVITIES (J)=(H)-(I)		-	
Net Movement in Cash (k) = (G) - (I)		(0)	-
Opening Cash Balance as at 01st January		-	-
Closing Cash Balance as at 31st December		(0)	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම්.

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

- රු.මිලි. 356.38ක වාර්ෂික ආදායම් ඉලක්කයට සාපේක්ෂව රු.මිලි. 261.28ක මුදලක් එකතු කරගැනීමටmසභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හැකි වූ අතර එය ඉලක්කගත ආදායමෙන් 73%ක කාර්යසාධනයකි.
- 2022 වර්ෂයේ දී බදුවලට පසු ලාභ ඉලක්කයෙන් 97%ක ප්‍රතිශතයක් ළඟාකර ගැනීමට හැකි විය.
- අයවැයගත පුනරාවර්තන ව්‍යයම්වලට සාපේක්ෂව සම්පූර්ණ ව්‍යයම 40%කින් අඩු කරගැනීමට හැකි විය.
- ජාතික ආර්ථිකයට සවියක් වීම සඳහා 2022 වාර්ෂික ලාභයෙන් රු.මිලි. 50ක මුදලක් අය බදු ලෙස මහා භාණ්ඩාගාරය වෙත ලබාදීමට හැකි විය.
- 2022 වර්ෂය සඳහා ශුද්ධ ලාභ ආන්තිකය 48%ක් සහ මෙහෙයුම් ව්‍යයම් 52%ක් ලෙස වාර්තා විය.
- පැමිණිලි කළමනාකරණය සම්බන්ධයෙන් පැමිණිලි 1,757ක් ලැබී ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලයේ දී ඉන් 1,510ක් සම්පූර්ණයෙන්ම විසඳන ලදී.
- සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 54කින් 45ක් සඳහා විසඳුම් ලබාදීමට හැකි විය.
- සභාධිපත්‍ය සහතික හා මූලික සැලසුම් නිශ්කාෂන ලිපි නිකුත් කිරීමේ වාර්ෂික ඉලක්කය වූ 134ක ප්‍රමාණය ඉක්මවා සහතිකපත් සහ මූලික සැලසුම් නිශ්කාෂන ලිපි 180ක් නිකුත් කිරීමට හැකි විය.
- කාලීන අවශ්‍යතාවයක් වන සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් වන නව රෙගුලාසි සැකසීම සඳහා මූලික ආකෘතියක් සකසා ගැනීමට හැකි විය.

- සභාධිපත්‍ය දේපළවල නීත්‍යානුකූල පරිපාලන ව්‍යූහය වන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා/ කමිටු ලියාපදිංචිය, කළමනාකරණ සංස්ථා/ කමිටු ලියාපදිංචිය අලුත් කිරීම, අක්‍රීය කළමනාකරණ සංස්ථා කමිටු සක්‍රීය කිරීමේ වාර්ෂික ඉලක්ක අභිබවා යෑමට හැකි විය.
- අධිකාරිය පාලනය කරනු ලබන්නේ අංක 10 දරණ පොදු පහසුකම් නීතිය සහ 1973 මහල් නිවාස අයිතිය පිළිබඳ නීතිය සහ ඊට අදාළ සංශෝධන මගිනි. එම නීති සමාලෝචනය කෙරෙමින් පවතින අතර අවශ්‍ය සංශෝධන සඳහා යෝජනා අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කරන ලද විශේෂඥ නීති මණ්ඩලයකට ඉදිරිපත් කර ඇත.

2.1.5 සෙලෙන්දිවා අයෝජන සමාගම

- සීමාසහිත ඇකියුටි පාට්නර්ස් (Acuity Partners (Pvt) Limited) පුද්ගලික සමාගමේ සහයෝගය ඇතිව පහත සඳහන් වත්කම් සඳහා ශක්‍යතා වාර්තා පිළියෙල කරන ලදී.
    - කොළඹ හිල්ටන් හෝටලය
    - කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය
    - ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය සහ යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල
    - කොළඹ ග්‍රෑන්ඩ් හයට්

- සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා කොටස්වලින් 100%ක් දක්වා පුද්ගලික ස්ථානගත කිරීම මගින් එක් එක් වත්කම් කළඹ බෙදා හැරීම් තුළින් ඉදිරියට ගෙන යාමට 2022 මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

කොළඹ හිල්ටන් සහ ක්‍රීඩා සංකීර්ණය

- කොළඹ හිල්ටන් සහ ක්‍රීඩා සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම් කැඳවා ඇති අතර ඒ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලික ආයෝජකයින් 8 දෙනෙකු කෙටි ලැයිස්තු ගත කර ඇත.
- ආහාරපාන අලෙවිය, රැස්වීම් සඳහා අවකාශ ලබාදීම සහ අමුත්තන්ගේ කාමර වැඩිදියුණු කිරීම තුළින් වෙළඳපොළ සමග තරඟ කිරීමට සහ ලාභදායී ආයතනයක් බවට පරිවර්තනය කිරීම සඳහා කෙටි/ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත.
- 2023 දී අවසන් කිරීම සඳහා අමුත්තන්ගේ කාමර 253ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
- හිල්ටන් ක්‍රීඩා මධ්‍යස්ථානයේ අලුතින් Hilton All Day Club සහ Night Club විවෘත කිරීම.

කොළඹ ග්‍රෑන්ඩ් හයට්

- ග්‍රෑන්ඩ් හයට් කෝපරේෂන්හි හෝටල් ක්‍රියාකරුගේ මූලික එකඟතාවය සහිතව ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය රු.බිලි. 59 සිට රු.බිලි. 51 දක්වා නැවත සකස් කර ඇත.
- කොවිඩ් වසංගතය නොතකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදුකර ඇති අතර ඉන් 60%ක් සඳහා රු.බිලි. 25ක් වැය වූ අතර ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.බිලි. 26ක් විය.
- බෙදා හැරීම අවසන් වන තෙක් රු.බිලි. 6ක් කොටස් වශයෙන් මූල්‍යනය කිරීම සඳහා ප්‍රධාන කොටස්කරුවා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග ගිවිසුමකට එළඹ ඇත. ඒ මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් සඳහා රු.බිලි. 2ක අතිරේක ප්‍රාග්ධන සම්භාරයක් මූලික වශයෙන් යොදවා ඇත.

ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය

- මෘදු අලුත්වැඩියා කිරීම අවසන් කර ඇත.
- ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ මෙහෙයුම් කටයුතු සඳහා දෙවැනි පදනම මත ප්‍රධාන පුද්ගලයන් පත්කරන ලෙස වෝටර්ස් එජ් වෙතින් ඉල්ලීමට තීරණය විය. ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ කාර්යය මණ්ඩලයේ විශේෂඥතාව ඉහළ නැංවීමට සහ ප්‍රතිව්‍යූහගත කිරීම අවසන් වන තෙක් පවතින සම්පත් ප්‍රයෝජනයට ගැනීමට වෝටර්ස් එජ් වෙතින් ලබා දුන් පුහුණුව මත පදනම්ව සලකා බලන ලදී.

2.1.6 කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වන චයිනා හාබර් ඉංජිනියරින් කොම්පැනි ලිමිටඩ් විසින් හිමිකම් 3ක් ආරවුල් විනිශ්චය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු අතර මේ සඳහා ව්‍යාපෘතියේ නිලධාරීන් පමණක් ඉදිරිපත් වී එහි පළමු හා තෙවන හිමිකම් සඳහා ඔවුන් විසින් ඉල්ලා තිබූ හිමිකම නිෂ්ප්‍රභා කර ගන්නා ලදී. මෙහි පළමු හිමිකමේ වටිනාකම රු.මිලි. 151ක් වන අතර තෙවන හිමිකමේ වටිනාකම ඇ.ඩො.මිලි. 16.5 (රු.මිලි. 6,300.00) කි. දෙවන හිමිකම සඳහා වූ අලාභය රක්ෂණ වන්දි මුදලින් ලබා ගත හැකි වන පරිදි තීරණය විය.

ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

#	ව්‍යාපෘතිය	ව්‍යාපෘති කාලය	ඇස්තමේන්තුගත මුළු වියදම (රු.මිලි.)	2022 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන (රු.මිලි.)	2022.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය	
					භෞතික (%)	මූල්‍ය (රු.මිලි.)
1	කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	2017 ජන. - 2023 දෙසැ.	24,092.79	2,700.00	90%	21,045.04
එකතුව			**24,092.79**	**2,700.00**		**21,045.04**

2.2 අභියෝග

2.2.1 පෙර පැවති නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

- ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම සහ ඒවායේ මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යෑම.
- ඉන්ධන හිඟය සහ මිල ගණන් ඉහළ යෑම.
- කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය මුදල් නිසි වේලාවට අමාත්‍යාංශයට නොලැබීම.
- අත්‍යවශ්‍ය ව්‍යාපෘති හඳුනා ගෙන ඒ සඳහා මුදල් මහා භාණ්ඩාගාරය මගින් ලබා ගැනීම.
- ව්‍යාපෘතිවලට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම.

2.2.2 නාගරික සංවර්ධන අධිකාරිය

- 2022 වර්ෂයේ රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය මගින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට විවිධ බාධා ඇති වූ අතර විශේෂයෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඒවායේ ප්‍රගතිය සඳහා මෙම තත්ත්වය විශාල වශයෙන් බලපාන ලදී.
- ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟ වීම, ඒවයේ මිල අධික ලෙස ඉහළ යාම හා ශ්‍රමය හිඟවීම හේතුවෙන් අදාළ මිල ගණන් යටතේ නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීම සඳහා මෙම තත්ත්වය විශාල අභියෝගයක් විය.
- ආර්ථික අර්බුදය හේතුවෙන් විවිධ පාර්ශව වෙතින් අධිකාරිය වෙත ලැබීමට නියමිත බදු ආදායම් ඉතා සීඝ්‍ර ලෙස අඩුවීම හේතුවෙන් ආයතනයේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු බලපෑමක් සිදුව ඇත.

- **මධ්‍යම ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘති**

- පන්නිපිටිය - වීර මාවත, කොට්ටාව - කුලසෙවණ වත්ත නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මනින් අවසන් කොට නිවාසලාභීන් වෙත ලබාදීමට පියවර ගනිමින් පවතී. මුහුණ පා ඇති අභියෝග අතර ඉදිකිරීම් අමුද්‍රව්‍ය ගෙන්වීමට අදාළ ණයවර ලිපි විවෘත කිරීම ගැටලුවකි. පෙර විකිණුම් පදනම යටතේ නිවාස ඒකක විකිණීමෙන් ඉදිකිරිමිකරුවන් හට මුදල් ගෙවීම සිදුකරන බැවින් ව්‍යාපෘති අවසන් කිරීම සඳහා සියලුම නිවාස ඒකක අලෙවි කළ යුතු වේ. එහෙත්, රටේ පවතින වත්මන් ආර්ථික අවපාත තත්ත්වය හමුවේ අලෙවි කිරීමට නියමිත නිවාස ඒකක සඳහා ගැණුම්කරුවන් සොයා ගැනීමේ අභියෝගය ද පවති.

- "දැරිය හැකි මිලකට ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතිය" ලෙස ඇරඹී නිවාස ඒකක 3,000ක් ඉදිකිරීමේ වැඩසටහනේ ඉදිකිරීම් කටයුතු කරගෙන යන අතරතුර රටේ උද්ගත වූ ආර්ථික අවපාතය හමුවේ යෝජනා කර තිබූ මිල ගණන් යටතේ නිවාස අලෙවි කිරීමට නොහැකි වූ අතර ඉදිකිරීම් අමුද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම, රජයෙන් ලබා දී තිබූ බදු සහන, නිවාස මිලදී ගැනීමේ දී පැවති බැංකු ණය පොළී සහන ආදිය නවතාලීම හමුවේ ව්‍යාපෘති තාවකාලිකව නවතාලීමට සිදු විය. ඉහළ යනු ලැබූ ඉදිකිරීම් පිරිවැය නැවත අධ්‍යනය කිරීමෙන් පසු සාමන්‍ය මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති (ඔරුගොඩවත්ත, පැලියගොඩ, බොරලැස්ගමුව, ස්ටෙඩියම්ගම, අනුරාධපුරය) ලෙස වෙළඳපොළ වර්තමාන මිල ගණන් යටතේ නව ක්‍රමවේද ඔස්සේ අලෙවි කිරීම ආරම්භ කිරීම හා නව බදු (වැට්) ඉහළ අගයන් අයකිරීම මත නිවාස ඒකක අලෙවි කිරීමේ දී නිවාස මිලදී ගැනීමට ගැණුම්කරුවන් සොයා ගැනීම අභියෝගයකි .

2.2.3 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලි. 5,000.00ක් වුවද එම අරමුදල් මෙතෙක් අධිකාරිය වෙත ලැබී නොමැති වීම.

- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 16(ඉ) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස සඳහන් කර ඇති දේපළ සංවර්ධනය කරන්නන්ගේ සේවා ගාස්තුව 2011 ජනවාරි මස 06 දිනැති අමප/10/2951/504/012 දරණ පත්‍රිකාව මගින් අවලංගු කර ඇත. එබැවින්, අධිකාරියට ප්‍රධාන ආදායම් මාර්ගයක් නොමැති වීම අධිකාරියේ ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාදාවක් වී ඇත.

2.2.4 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

- සභාධිපත්‍ය දේපළවල ඉදි කර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට යාමේ දී බාහිර පාර්ශවයන්ගෙන් අධිකාරිය වෙත සිදු කරනු ලබන බලපෑම්
- පවත්නා ආර්ථික තත්ත්වය මත නව සභාධිපත්‍ය දේපළවල ඉදිකෙරෙමින් හා ඉදිකරමින් පවතින සභාධිපත්‍ය දේපළවල ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදුවීම නිසා අධිකාරියේ ප්‍රධාන ආදායම් මූලෝපාය වන සභාධිපත්‍ය සහතික නිකුත් කිරීමේ 2023 භෞතික හා මූල්‍ය වාර්ෂික ඉලක්ක වෙත ලඟාවීමට ඇති දුෂ්කරතාවය
- කාලීන අවශ්‍යතාවයක්ව ඇති සභාධිපත්‍ය දේපළ පනත් සංශෝධනය ප්‍රමාද වීම නිසා මතුව ඇති ප්‍රායෝගික ගැටලුවලට ප්‍රමාණාත්මක විසඳුම් ලබාදීමට ඇති අපහසුතාවය

2.2.5 සෙලෙන්දිවා අයෝජන සමාගම

වාණිජ සහ ආර්ථික අවදානම්

- බෙදා හැරීම අවසන් කිරීමට ප්‍රමාද වීමෙන් ආයෝජකයින්ගේ ආකර්ෂණය අඩුවීම සහ වෙළඳපොළේ වෙනත් විකල්ප සෙවීමේ දී ආකර්ශනීය මිල ගණන් සඳහා ඇති අවස්ථාව අහිමි වීම.
- රජය සතු ආගන්තුක සත්කාර වත්කම් බෙදා හැරීමට පහසුකම් සැලසීම සහ කඩිනම් කිරීමට ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම සඳහා සමාගම රුපියල අවප්‍රමාණය වීමේ උපරිම විභව ප්‍රතිලාභය ලබා ගත යුතු වීම.
- රජය සතු වත්කම් බෙදා හැරීමේ කටයුතු සිදු කිරීමේ තීරණ ගැනීම ප්‍රමාද වුවහොත් විදේශීය ආයෝජකයින් වෙනත් කලාපීය රටවල ආයෝජන අවස්ථා සලකා බලනු ඇත.
- ආයෝජකයන් වෙත වත්කම් අලෙවි කිරීම, ආයෝජකයින්ගේ විශ්වාසය ලබා ගැනීම සහ ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා සුදුසු වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති පිළිබඳව පැහැදිලි අවබෝධයක් සහිත වීම වැදගත් වේ.

2.2.6 කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

- ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන චයිනා හාබර් ඉංජිනියරින් කොම්පැනි ලිමිටඩ් වෙත ගෙවීමට ඇති සියලු හිඟ මුදල් ගෙවා අවසන් කිරීම.
- අරුවක්කාලු ව්‍යාපෘති භූමියේ සිට කලපුව වෙත ඉදිකිරීමට නියමිත වැසි ජල කාණුව සඳහා පවතින ජනතා විරෝධතා හමුවේ ක්‍රමවත් වැසි ජල පද්ධතියක් ඉදිකිරීම .

2.3 ඉදිරි ඉලක්ක

2.3.1 පෙර පැවති නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

- නගර සංවර්ධන හා ඇවිදින මං තීරු ව්‍යාපෘති ඇතුළු දැනට සිදු කෙරෙමින් පවතින පසුගිය වසරවල කොන්ත්‍රාත් ප්‍රදානය කළ ව්‍යාපෘති අධීක්ෂණය සහ අදාළ අනුමැතීන් ලබාදීම.
- පසුගිය වසරවල අවසන් කරන ලද ව්‍යාපෘතිවල රූඳවුම් මුදල් නිදහස් කිරීමට අදාළ අනුමැතීන් ලබාදීම.

2.3.2 නාගරික සංවර්ධන අධිකාරිය

- 2023 වසර තුළ සංවර්ධන සැලසුම් 44ක් සහ 2024 වර්ෂය තුළ සංවර්ධන සැලසුම් 40ක් වශයෙන් මෙම වසර 2 තුළ සංවර්ධන සැලසුම් 84ක් ගැසට් කර අවසන් කිරීම.
- ආයතනයේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම හා රටේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති ආයතනය සතු ඉඩම් පෞද්ගලික අංශය හා එක්ව සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. තවද, දැනට ආයතනය වෙත ආදායම් ලැබෙන ක්‍රමවේද ශක්තිමත් කර එම ආදායම් නියමිත කාලය තුළ ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නිවාස ව්‍යාපෘති ඇතුළුව ක්‍රියාත්මක වෙමින් පවතින සියලු ව්‍යාපෘති නිසි කලට අදාළ ඉලක්ක කරා මෙහෙය වීම.
- අනුමත සේවක ව්‍යූහයට අනුව සියලු සේවකයින් ඔවුනට සුදුසු සේවක හා වැටුප් තල මත පිහිටුවීම.
- මහජනතාව සඳහා කාර්යක්ෂම හා සුහදශීලී සේවාවක් ලබාදීමට හැකි වන පරිදි ආයතනික සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ඒවාට අදාළ සුදුසු නිලධාරීන් පත්කර එම අංශ ශක්තිමත් කිරීම.
- සේවකයින් සඳහා පුහුණු වැඩසටහන්, සුභසාධන වැඩසටහන් හා ක්‍රීඩා හා වෙනත් කෞශල්‍යයන් වර්ධනය කරගත හැකි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කාර්යක්ෂම, දක්ෂ හා ගුණාත්මක සේවක සංවර්ධනයක් ආයතනය තුළ ඇති කිරීම.
- ශ්‍රී ලංකාවේ භෞතික සංවර්ධනය වෙනුවෙන් දායකත්වයක් දක්වන ආයතන අතරින් ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.

- **මධ්‍යම ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘතිය**

- පන්නිපිටිය - වීර මාවත හා කොට්ටාව - කුලසෙවණ වත්ත නිවාස ව්‍යාෘපෘතිවල ඉදිකිරීම් කටයුතු අවසන් කොට නිවාසලාභීන්ට භාරදීමට පියවර ගැනීම.
- බොරැල්ල - එලියට් පෙදෙස, මාලඹේ, අනුරාධපුරය, මාකුඹුර, බොරලැස්ගමුව, ඔරුගොඩවත්ත, පැලියගොඩ ආදී අතරමග නැවතී ඇති ව්‍යාෘපෘතිවල ඉදිකිරීම් කටයුතු නව ක්‍රමවේද ඔස්සේ නැවත ආරම්භ කිරීම.
- නිවාස අලෙවියෙන් ඇ.ඩො.මිලි. 1.5ක ඉලක්කගත ආදායමක් ලබා ගැනීම ඉලක්ක කිරීම.
- බොරුල්ල - ඕවල් වීවී නිවාස ව්‍යාපෘතියේ නිවාසලාභීන් වෙත ඔප්පු ලබා දී අවසන් කිරීම.

2.3.3 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

- ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ජීවිතයේ වැඩි කොටසක් කැපකරන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයන් හා වෘත්තිකයන්ගේ සෑදෑ සමය තෘප්තිමත්ව හා විවේකීව ගත කිරීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කර ග්‍රාමීය නගර සංකල්පය යටතේ ව්‍යාපෘතියක් සැලසුම් කරමින් ඔවුන්ට ගෞරවනීය ලෙස ජීවත්වීමට හැකි වන පරිදි බද්ධ නිවාස හෝ තනි නිවාස ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දී විශේෂයෙන් ශ්‍රී ලාංකික කීර්තිය ලොවට ගෙන ගිය ජේෂ්ඨ පුරවැසියන්ට ද නිසි ඇගයීමක් ලබාදීමේ

අරමුණින් මෙම වැඩසටහන ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. මෙය වැඩිහිටි නිවාස සංකල්පයෙන් ඔබ්බට ගිය සමාජ ආරක්ෂණ වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකි අතර ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක සහිතව එම මුදල් කළමනාකරණය කිරීමට අවශ්‍ය අත්වැල ඔවුන්ට සපයා දෙනු ඇත.

- මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි රාජ්‍ය - පෞද්ගලික ක්‍රමවේදය යටතේ අදායම් උත්පාදන ව්‍යාපෘති ලෙස මධ්‍යම පාන්තික නිවාස සඳහා විසඳුම් ලබාදෙමින් ස්වාධීන ආයතනයක් ලෙස ඉදිරි කාර්යයන් ඉටු කිරීමට ඉලක්ක කර ඇත.

2.3.4 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

- සේවාලාභීන්ට වඩාත් කඩිනම් සේවාවක් ලබාදීම සඳහා ආයතනික මෙහෙයුම් හා පරිපාලන කටයුතු පරිගණකගත කිරීම.
- සභාධිපත්‍ය දේපළ සම්බන්ධ නව රෙගුලාසි හඳුන්වා දෙමින් ඒවා ගැසට් කිරීම සඳහා කටයුතු කිරීම.
- පනත් සංශෝධනය අනුමත කරගැනීම කඩිනම් කර ක්ෂේත්‍රයේ මතුව ඇති ගැටලු සඳහා විසඳුම් ලබාදීම.
- දිවයින පුරා ඇති සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් දීපව්‍යාප්ත සංගණන කටයුතු ආරම්භ කිරීම.

2.3.5 සෙලෙන්දිවා අයෝජන සමාගම

කොළඹ ග්‍රෑන්ඩ් හයට්

- හෝටලයේ කොටස් සහ සංවර්ධන කටයුතුවලින් 100%ක් ග්‍රෑන්ඩ් හයට් බෙදා හැරීම සමග ක්‍රියාත්මක කිරීම.
- විකල්පයක් ලෙස අදියර I යටතේ කාමර 220ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ඉතිරි රු.බිලි. 4ක මුදල ප්‍රධාන කොටස්කරුවා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් මූල්‍යනය කරගැනීම.

ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය සහ යෝර්ක් වීදියේ ගොඩනැගිල්ල

- 100%ක බෙදා හැරීම සඳහා පුවත්පත් දැන්වීම් හරහා නව ලංසු යෝජනා කැඳවීම.

කොළඹ හිල්ටන් සහ ක්‍රීඩා මධ්‍යස්ථානය

- 100%ක බෙදා හැරීම සඳහා පුවත්පත් දැන්වීම් හරහා නව ලංසු යෝජනා කැඳවීම.
- අමුත්තන්ගේ කාමර 253ක අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කිරීම.
- ශ්‍රී ලංකා ආපනශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීම.

2.3.6 කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

- 2023 වසර තුළ චයිනා හාබර් ඉංජිනියරින් කොම්පැනි ලිමිටඩ් වෙත ගෙවීමට ඇති සියලු හිඟ මුදල් ගෙවා ව්‍යාපෘතියේ වැඩ අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

ඩබ් .එස් .සත්‍යානන්ද
ලේකම්

2023.02. 28

03. පරිච්ඡේදය

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

කරුණාකර පිටු අංක 22 බලන්න.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 23 බලන්න.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 24 බලන්න.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

කරුණාකර පිටු අංක 25 බලන්න.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

කරුණාකර පිටු අංක 27 බලන්න.

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

- කරුණාකර ඇමුණුම් අංක 01 බලන්න

04. පරිච්ඡේදය

4. කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මධ්‍යම ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම	-	-	29%
සනීපාරක්ෂක කසල රැඳවුම ඉදිකිරීම	-	-	60.4%
නගරවල සුහුරු යටිතල පහසුකම් ස්ථාපනය කිරීම	-	76%	-
මූලික නිශ්කාෂන ලිපි නිකුත් කිරීම	106%	-	-

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
1. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	11.1 - 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත්, ආරක්ෂාකාරී සහ අඩුම මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම	මධ්‍යම ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම	29%		
	11.6 - 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම	සනීපාරක්ෂක කසල රැඳවුම ඉදිකිරීම		60.4%	
	11.7 - 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනා අන්තර්ගත වූ සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයක් ලබාදීම	නගරවල සුහුරු යටිතල පහසුකම් ස්ථාපනය කිරීම			106%

5. 2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අංශය	ඉලක්ක	ජයග්‍රහණ	අභියෝග
නිවාස	11.1 - 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත්, ආරක්ෂාකාරී සහ අඩුම මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම	- නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ඒකක විදෙස්ගත පිරිසට ඩොලර් මගින් වෙන්කර ගැනීමට අවස්ථාව සැලසීම. - එමගින්, 2022 වර්ෂය අවසන් වන විට ඇ.ඩො. ලක්ෂ 5ක ආදායමක් උපයා ගැනීම. - නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් නාගරික ප්‍රදේශයන්හි නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට වැඩපිළිවෙළක් ආරම්භ කිරීම.	- රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කර අතරමග නවතා දැමීමට සිදුවූ මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති නව ක්‍රමවේද ඔස්සේ නැවත ආරම්භ කිරීම. - නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකිරීම් ආරම්භ කරන ලද පන්නිපිටිය - වීර මාවත හා කොට්ටාව - කුළුසෙවණ වත්ත මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම.
ඝන අපද්‍රව්‍ය	11.6 - 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම	- ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල 90%ක භෞතික ප්‍රගතියක් ලභාකර ගැනීම. - කසල බහාලුම් පෙට්ටි 94ක් මිලදී ගැනීම.	- කොන්ත්‍රාත්කරුගේ (CHEC - SMEDRIC) හිඟ මුදල් නොගෙවීම නිසා 2022 ජූනි 30 දින සිට කොන්ත්‍රාත්කරු විසින් තාවකාලිකව ඉදිකිරීම් කටයුතු නැවත්වීම නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක වෙත ලභාවීමට නොහැකි වීම.
නාගරික සංවර්ධ-නය	11.7 - 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනා අන්තර්ගත වූ සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයක් ලබාදීම	- නාගරික සංවර්ධන ප්‍රකාශිත ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් 9ක් නිම කර ගැසට් කිරීම. - 2022 වර්ෂයේ දී නාගරික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 156ක් අවසන් කර ඇත.	- රටේ පැවති ආර්ථික අර්බුදය හා කොවිඩ් - 19 වසංගත තත්ත්වය ව්‍යාපෘතිවල ප්‍රගතිය කෙරෙහි බලපෑම් ඇති කිරීම. - ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟ වීම, අමුද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම හා ශ්‍රමය හිඟ වීම.

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

#	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	33	24	09
තෘතීයික	05	01	04
ද්විතියික	77	102	36
ප්‍රාථමික	34	27	07

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

පවත්නා මානව සම්පත් හිඟය සඳහා පහත සඳහන් පරිදි කටයුතු කර ඇත.

- ජ්‍යෙෂ්ඨ තනතුරු හිඟය සඳහා නිලධාරීන් රාජකාරි ආවරණය සඳහා පත්කිරීම.
- ද්විතියික තනතුරු හිඟය සඳහා උපාධිධාරි අභ්‍යාසලාභීන් යොදවා ගැනීම.
- ප්‍රාථමික තනතුරු හිඟය සඳහා බහුකාර්යය සංවර්ධන කාර්යය සහායකයින් යෙදවීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

#	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
01	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් සේවා ස්ථානයේ ඵලදායීතාව වැඩිදියුණු කිරීම	04	දින 2	-	-	දේශීය	ගුණාත්මක වැඩ පරිසරයක් පවත්වා ගෙන යාම
02	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	04	දින 1	-	-		රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම
03	සහායක කාර්යය මණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	දින 2	-	-		ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය
04	නවීකරණය කරන ලද පිරිවැය මධ්‍යස්ථාන ක්‍රමවේද හඳුන්වා දීම	15	පැය 1 1/2	-	-		නවීකරණය කරන ලද පිරිවැය මධ්‍යස්ථාන ක්‍රමවේද හඳුනා ගැනීම පිළිබඳව

- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් සේවා ස්ථානයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම**

  මෙම වැඩසටහන තුළින් Ms Word, Ms Excel සහ Google Apps වැනි පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීම හා ඒ තුළින් අමාත්‍යාංශයේ දෛනික රාජකාරි කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම අපේක්ෂා කෙරිණ. එමෙන්ම, තම දෛනික රාජකාරී කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම තුළින් එහි ගුණාත්මකභාවය වර්ධනය කිරීම ද අරමුණු විය.

- **රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම**

  මෙම පුහුණු වැඩසටහන තුළින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අර්ධ රාජ්‍ය ආයතනවල සියලුම වැටුප් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම හා එමගින් ආයතනික කටයුතු නිවැරදිව පවත්වා ගෙන යාම අරමුණු විය. තවද, මෙම පුහුණු වැඩසටහන රජයේ නිලධාරීන්ගේ වැටුප් ව්‍යූහය, වාර්ෂික වර්ධක ගෙවීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රම, වැටුප් පරිවර්තනය කිරීම, වැඩ බැලීමේ වැටුප් හා දීමනා සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඇත.

- **සහායක කාර්යය මණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

  මෙම වැඩසටහන තුළින් නිලධාරීන්ගේ රාජ්‍ය/ පළාත් සභා යන ආයතනවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරනු ලබන වැඩ, සේවා, සැපයුම්, බදු, විකිණීමේ හා උපදේශන සේවා කාර්යයන්හි විධිමත් බව, ඵලදායී බව හා වගවීම පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය ඉලක්ක කර ඇත.

- **නවීකරණය කරන ලද පිරිවැය මධ්‍යස්ථාන ක්‍රමවේද හඳුන්වා දීම**

  මෙම පුහුණු වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතනවල මාණ්ඩලික නිලධාරීන් සහභාගී විය. මෙම පුහුණු වැඩසටහනේ දී රාජ්‍ය වියදම් කළමනාකරණය, රාජ්‍ය වියදම් අයවැය සීමාව තුළ පවත්වා ගෙන යාම, රාජ්‍ය වියදම් අවම වන පරිදි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යන විෂයපථ සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම ඉලක්ක කර ඇත.

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්		-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්		-	-
1.6	වෙනත්		-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ (වාහන සඳහා)	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් සියලු වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය.	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්ම වන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයක් අනුව බඳවා ගත් සංවර්ධන නිලධාරීන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරනු ලැබූ බැවින් අනුමත සංවර්ධන නිලධාරී තනතුරු ප්‍රමාණය ඉක්මවා ඇත.	-
16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ලිඛිත ලියවිල්ලක් සම්පාදන නොකළ ද අමාත්‍යාංශය විසින් සැපයිය යුතු සේවාවන් කාර්යක්ෂමව හා අඛණ්ඩව ඉටුකිරීමට කටයුතු කර ඇත.	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	ප්‍රතිපාදන සීමා කිරීම, ප්‍රවාහන අපහසුතා සහ රටේ උද්ගත වී තිබූ ආර්ථික අර්බුදය හමුවේ නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීමෙන් සියලුම නිලධාරීන් හට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීමට නොහැකි විය.	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

මානව සම්පත් කළමනාකරණය, ආයතනික කටයුතු, උපයෝගී සේවා අඛණ්ඩව පවත්වා ගැනීම, තොරතුරු තාක්ෂණ පහසුකම් සේවා ඇතුළු පරිපාලන හා මෙහෙයුම් කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම පාලන අංශයේ අරමුණු විය.

අනිකාල සේවයේ යෙදුනු සියලුම රියදුරු මහතුන්ට ලබා දිය හැකි උපරිම අතිකාල දීමනා ලබාදීමටත් ගමන් වියදම් දීමනා ගෙවීමටත් කටයුතු කර ඇත. එසේම, අමාත්‍යාංශයේ නිලධාරීන් හා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය විසින් යොමු කර තිබූ අතිකාල වවුවර්පත් 294ක්, ගමන් වියදම් වවුවර්පත් 105ක් හා නිවාඩු දින සේවය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ වවුවර් පත් 30ක් සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය පාලන අංශයෙන් ලබා දී තිබිණ. එසේම, අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමට සංචිත වාහන වෙනුවෙන් 280කට අධික වාර ගණනක දී ඉන්ධන ඇණවුම් ඉදිරිපත් කරමින් ඉන්ධන ලබා ගැනීම, වාහන නිසියාකාර නඩත්තුවකින් කාර්යක්ෂමව පවත්වා ගත හැකි වන පරිදි අමාත්‍යාංශය සතු වාහන 16ක වාර සේවා නියමිත පරිදි සිදුකර ඇති අතර වාර්තා වූ සියලුම වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට අදාළ ක්‍රියාමාර්ග පාලන අංශයෙන් ගෙන ඇත. එසේම, 2022 වර්ෂයට අදාළව වාහන අනතුරු 02ක් වාර්තා වී ඇති අතර එක් අනතුරකට අදාළ සියලුම මූලික පරීක්ෂණ අවසන් කර විධිමත් පරීක්ෂණයට අදාළ කටයුතු ආරම්භ කර ඇත. අනෙක් වාහන අනතුර 2022.12.29 දින සිදුවී ඇති බැවින් එයට අදාළ මූලික පරීක්ෂණ මේ වන විට සිදුවෙමින් පවතී.

තවද, මෙම අමාත්‍යාංශ විෂයපථයට අදාළව ඉදිරිපත්ව තිබූ සියලු මහජන ඉල්ලීම් අදාළ ආයතන වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර එහි ප්‍රගතිය සම්බන්ධීකරණය කිරීම, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉදිරිපත්ව ඇති තොරතුරු ඉල්ලීම් 12ක් හා අභියාචනා අයදුම්පතක් සම්පූර්ණ කර තිබීම, අමාත්‍යාංශය වෙත ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ නාගරික සංවර්ධන අංශය යටතේ ඇති අදාළ අංශ හා ආයතන වෙත යොමු කිරීමේ කටයුතු සම්බන්ධීකරණය, විදේශ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිලධාරීන් හා ආයතන දැනුම්වත් කර ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද සියලුම නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා සලසා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පාලන අංශය කටයුතු කර ඇත. අමාත්‍යාංශයේ පාලන අංශය වෙත සාමාන්‍ය තැපෑල හා ලියාපදිංචි තැපෑල යන ක්‍රමවේදයන් මගින් ලද 8,243කට ආසන්න ලිපි අදාළ අංශ වෙත ප්‍රමාදයකින් තොරව බෙදා හැරීම, අමාත්‍යාංශ විෂයපථයන් වෙනස් වීම අනුව සියලුම නිලධාරීන් විධිමත්ව අනුයුක්ත කිරීම, අදාළ කාර්යය සාධන ඇගයුම් යොමු කර ඇති සියලුම නිලධාරීන්ට අදාළ වැටුප් වර්ධක ලබාදීම, නිලධාරීන් 02කු විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබීම, සියලුම සේවාවන්වලට අදාළ වාර්ෂික ස්ථාන මාරුවලට අදාළ රාජකාරි සිදුකර තිබීම. නිලධාරීන්ගේ නිවාඩු යාවත්කාලීන කිරීම හා වර්ෂයේ සියලුම පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරීමට පාලන අංශය කටයුතු කර ඇත. ආපදා ණය ඉල්ලීම් 62ක් සහ දේපළ ණය ඉල්ලීම් 01ක් සඳහා අදාළ අනුමැතිය ලබාදීම, අග්‍රහාර රක්ෂණ ඉල්ලීම් 60ක් සම්බන්ධයෙන් කටයුතු කර තිබීම හා ඉන් 75%ක ප්‍රතිලාභ ලැබී තිබීම, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභී නිලධාරීන් 19 දෙනෙකු සඳහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබීම, අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් (153) මාර්ගගත ක්‍රමයට අග්‍රහාර දත්ත පද්ධතිය යාවත්කාලීන කර ‘‘අග්‍රහාර රක්ෂණ සහතික පත්‍රය’’ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවට පිටපතක් ලබාදීමට කටයුතු සිදුකර ඇත.

2022 වසරේ නීති අංශයට නඩු 39ක ප්‍රමාණයක් ලැබී ඇති අතර සියලු නඩු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2. නිවාස හා ඉදිකිරීම් අංශය

02. නිවාස හා ඉදිකිරීම් අංශය

(පෙර පැවති ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය)

පිටු අංක

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය..... 77- 90

1.1 හැඳින්වීම.....

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු .....

1.3 සුවිශේෂී ප්‍රමුඛතා .....

1.4 සංවිධාන සටහන .....

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු .....

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන .....

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු .....

02. පරිච්ඡේදය

2. 2022 ප්‍රගතිය හා 2023 ඉදිරි දැක්ම ..... 91 -101

03. පරිච්ඡේදය

3. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය..... 102 - 103

04. පරිච්ඡේදය

4. කාර්යය සාධන දර්ශක ..... 104 - 104

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය ..... 105 - 105

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ ..... 106 - 109

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව ..... 110 - 115

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

පෙර පැවති ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

2019 නොවැම්බර් 16 වන දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව නව අමාත්‍යාංශ පිහිටුවීමත් සමග අංක 2158/41 හා 2020.01.17 දිනැති ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන, ජලසම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ලෙස මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක විය.

ඉන් අනතුරුව 2020 අගෝස්තු 05 වන දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයත් සමග අමාත්‍යාංශ විෂයන් සංශෝධනය වූ අතර, 2020.08.09 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2187 /27 දරණ ගැසට්පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස ක්‍රියාත්මක විය. එමගින් එතෙක් ක්‍රියාත්මකව පැවති නිවාස හා ඉදිකිරීම් විෂය පථයට අමතරව ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන විෂය මෙම අමාත්‍යාංශයට ඇතුළත් විය. මීට අමතරව 2020 අගෝස්තු 09 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව කැබිනට් අමාත්‍යාංශයක්ව පැවති පුනරුත්ථාපන, අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය ද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර ඇත. 2022 මැයි 27 වන දින නිකුත් කරන ලද 2281/41 දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු ,ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 21ක් ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර පෙර පැවති නිවාස රාජ්‍ය අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අංශයක් ලෙස ක්‍රියාත්මකව උක්ත රාජ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධව පැවති ආයතන මෙම අංශය යටතේ 2022 වසර අවසානය දක්වාම ක්‍රියාත්මක විය.

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියත්මක කරමින් ‘‘සැමට සුව පහසු නිවසක් ලබා දීමේ ජාතික වැඩසටහන’’ ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන කාර්යභාරය මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ සඳහා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටළුවට පිළියම් සෙවීමේ ‘‘ ඔබට ගෙයක් රටට හෙටක් ’’ නිවාස වැඩසටහන 2020 වර්ෂයේ දී නව අමාත්‍යාංශ පිහිටුවීමත් සමග ආරම්භ කර 2022 වසර තුලද අඛණ්ඩව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය.

මෙම වැඩසටහන යටතේ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුලකට රු. 650,000 ක ආධාර මුදලක් රජයේ ප්‍රදානයක් වශයෙන් සහ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් යුතුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ප්‍රතිලාභී පවුල විසින් නිවාස ඉදිකිරීම සිදු කරනු ලැබේ. මෙම වැඩසටහන මගින් 2022 වසර තුල දිවයින පුරා නිවාස 11,916 ඉදිකිරීම් ආරම්භ කළ අතර, ඉන් නිවාස 6,355 ක් අවසන් කර ප්‍රතිලාභීන් පදිංචි කරවීමට හැකි විය.

2022 වසර ආරම්භයේ අමාත්‍යාංශයට රු.මි. 3,713ක සංවර්ධන ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර පවතින පැවති ආර්ථික අර්බුදය හමුවේ අතුරු අයවැය මගින් එම ප්‍රතිපාදනය රු.මි. 3,488 දක්වා අඩු කරන ලදී. වසර අවසානයේ රු.මි. 2,684ක් වැය කරමින් 77% ක කාර්යසාධනයක් ලගා කර ගත හැකි විය. පුනරාවර්තන වියදම් ලෙස රු.මි. 452ක ප්‍රතිපාදනය අතුරු අයවැය මගින් රු.මි. 444ක් දක්වා සංශෝධනය වූ අතර ඉන් රු.මි. 416ක් වැය කරමින් 94%ක කාර්යසාධන මට්ටමකට ලගා වී තිබේ.

තමාටම නිවසක් අලුතින් ගොඩනැගීමේ උනන්දුව හා හැකියාව ඇති මෙන්ම ඉදිකිරීම් ආරම්භ කර අතරමග නැවතී ඇති බාහිර මූල්‍යාධාරයන් බලාපොරොත්තු වන පවුල් වෙත සහනදායී පොලී අනුපාතයක් යටතේ නිවාස ණය ලබා දීමේ වැඩසටහන්ද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් වසර ගණනාවක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ වල මැදි ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලු වලට පිළියම් සෙවීම සඳහා දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි නිවාස 100 කින් සමන්විත නිවාස සංකීර්ණ ඉදිකිරීම වෙනුවෙන් ආරම්භ කල " සියපත මහල් නිවාස වැඩසටහන " සඳහා මුලපිරීමට හැකි වූ අතර එහි මුල් අදියර ලෙස පළාත් 9 තුළ එක් මහල් නිවාසයක් බැගින් ආරම්භක පියවර ලෙස බස්නාහිර, සබරගමුව හා උතුරු මැද පළාත් ආවරණය වන පරිදි නිවාස සංකීර්ණ 03 ක වැඩ ආරම්භ කළද පවතින ආර්ථික අර්බුදය හමුවේ මුදල් අමාත්‍යාංශයේ 03/2022 චක්‍රලේඛය අනුව එම ඉදිකිරීම් තාවකාලිකව නවතා දැමීමට සිදුවිය.

ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ සඳහන් වන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී රාජ්‍ය අංශයට අයත් ව්‍යවස්ථාපිත ආයතන මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන අයුරින් පවත්වා ගෙන යාමට පසුගිය දෙවසර තිස්සේ ඉතා ඕනෑකමින් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට හැකි විය. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයද ස්වයං පැවැත්ම තහවුරු කර ගැනීමේ තත්වයට පත් වීම මෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවද ඉතා සාධනීය ලෙස තම පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා කටයුතු කලද 2022 වසර ආරම්භයේ සිටම පැවති ආර්ථික අර්බුද හමුවේ ලභාකර ගත් වර්ධනයන් අඛණ්ඩව පවත්වා ගැනීමට අපහසු විය.

උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පැවති ගැටුම් හේතුවෙන් අවතැන්වූවන් වෙනුවෙන් ක්‍රියාත්මක වූ නැවත පදිංචි කිරීමේ අංශයද මෙම අමාත්‍යාංශයට එක් වීම මගින් අමාත්‍යාංශයේ විෂය පථය තවදුරටත් පුළුල් විය.

නැවත පදිංචි කිරීමේ අංශය 2020-08-09 දිනැති අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය යටතට පත් කෙරිණි. මෙම අංශය මඟින් උතුරු හා නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

නිවාස හා ඉදිකිරීම් අංශයට අනුබද්ධ ආයතන,

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ඕෂන් වීව් සංවර්ධන (පුද්.) සමාගම
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

" සැමට නිවාස හා තිරසර ඉදිකිරීම් "

මෙහෙවර

නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන යන අංශවලට ජාතික නායකත්වය සැපයීම, නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයන් නියාමනය කිරීම, මූල්‍යකරණය, පහසුකම් සැපයීම සහ උපදේශනය තුලින් ජාතික නිවාස වැඩසටහනට සහාය වීම, මූල්‍ය, තාක්ෂණික, උපදේශන,

යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය අංශයන්ගෙන් ඉදිකිරීම් කර්මාන්තයට සහාය වීම, සහ රාජ්‍ය ආයතන සඳහා ඉදිකිරීම් සේවා, අවකාශය හා ගොඩනැගිලි නඩත්තු සේවා සැපයීම මෙම අංශයේ මෙහෙවර වේ.

අමාත්‍යාංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාළ ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස හා සංවර්ධන අංශය

1. නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, අණ පනත්, රෙගුලාසි, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අඩු ආදායම්ලාභීන්, මධ්‍ය ආදායම්ලාභීන් සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම, නිවාස මූල්‍යාධාර හා ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මහජනතාව විසින් සිදුකරන නිවාස ඉල්ලීම් සම්බන්ධ කටයුතු කිරීම.
3. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් හඳුනාගැනීම, අත්පත් කර ගැනීම, පවරා ගැනීම, බැහැර කිරීම හා ඔප්පු නිකුත් කිරීම සම්බන්ධ කටයුතු.

තාක්ෂණ අංශය

1. ඉදිකිරීම් විෂයට අදාලව ප්‍රතිපත්ති නීතිරීති සම්පාදනය හා පසු විපරම් කිරීම.
2. ඉදිකිරීම් කර්මාන්තය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. අමාත්‍යාංශය යටතේ වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි කටයුතු නියාමනය හා මගපෙන්වීම.
4. රජයේ සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු සඳහා ස්ථාවර තාක්ෂණ කමිටු වල කාර්යයන් ඉටුකිරීම.

ඉදිකිරීම් අංශය

1. අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන සම්බන්ධීකරණය සහ ප්‍රගතිය නියාමනය කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණිකමය නොවන ආයතන සඳහා ඉදිකිරීම් කටයුතු වලදී තාක්ෂණික මගපෙන්වීම් ලබාදීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රයන් අදාල විදේශීය වෘත්තිකයන් සහ පුහුණු වෘත්තිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම.

අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ අංශය

1. අවතැන්වූ පවුල් සඳහා ග්‍රාමීය නිවාස ඉදි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබාදීම.
2. බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ



1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ



ගණකාධිකාරි -ගණ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නි. අ.
සහකාර ලේකම් - ස.ලේ

සහකාර අධ්‍යක්ෂ -ස.අ
ඡායාරූප ශිල්පී - ඡා.ශි
නීති නිලධාරි - නි.නී

පරිපාලන නිලධාරි - ප.නි
භාෂා පරිවර්තක නිලධාරි -භා.පරි.
තොරතුරු තාක්ෂණ නිලධාරි -තොර.තා.නී

කැමිරා ක්‍රියාකරු - කැ.ක්‍රි
සංවර්ධන නිලධාරි - සං.නී
තාක්ෂණ නිලධාරි- තා.නී

විඩියෝ ඡායාරූප ශිල්පී - ඡා.ශී
කළමනාකරණ සේවා නිලධාරි- ක.සේ.නී
සහකාර ඡායාරූප ශිල්පී- ස.ඡා.ශී

රියදුරු -රි
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස

1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන්

1.5.1 පාලන අංශය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශයේ සාමාන්‍ය පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් හා මානව සම්පත් කළමනාකරණය පාලන අංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව ඊට අවශ්‍ය වන පසුබිම සකස් කිරීම, භෞතික හා මානව සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල සියලුම ආයතනික කටයුතු හා මානව සම්පත් කළමනාකරණය සඳහා මගපෙන්වීම පාලන අංශයෙන් සිදු කරනු ලබයි.

පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සියලුම පරිපාලන කටයුතු හා සියලුම නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු.
2. අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ආයතනික හා පරිපාලන කටයුතු.
3. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදු කරනු ලබන සියලුම ආයතනික හා පරිපාලන කටයුතු.
4. අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණයට අදාළව මු.රෙ 135 යටතේ පාලන අංශයේ නිළධාරීන් වෙත පවරන ලද බලතල ප්‍රකාරව කටයුතු කිරීම.
5. පාලන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය.
6. පාර්ලිමේන්තුව සම්බන්ධව අදාළ කටයුතු සම්බන්ධීකරණය.
7. මානව සම්පත් සංවර්ධනයට අදාළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු.
8. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා පිළිබඳ සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
9. රැස්වීම් හා විශේෂ වැඩසටහන් සංවිධානය.
10. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණයට අදාළ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සම්බන්ධීකරණ කටයුතු කිරීම.
11. ස්ථාවර වත්කම් කළමනාකරණය සම්බන්ධීකරණය හා නඩත්තු කටයුතු.

1.5.2 සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම් කළ පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ. නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ මෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සිදු වූ ගැටුම් වලින් අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ කටයුතු සහ යටිතල පහසුකම් සැපයීමේ කටයුතු වලදී සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීමද ඊට අයත්ය. තවද, ජාතික ප්‍රතිපත්ති හා කාලීන අවශ්‍යතාවයන් සාක්ෂාත් කර ගනිමින් නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් ඉලක්ක කරා මෙහෙයවීමේ කටයුතු පසු විපරම් කිරීම හා ඇගයීම් සිදු කිරීමත් සැලසුම් අංශය මගින් සිදු කෙරේ.

සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අනුගත වෙමින් අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.
2. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වලින් ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශ ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් ඇගයීමෙන් අනතුරුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
3. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
4. ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.

5. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මාසිකව, කාර්තුමය වශයෙන් හා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට අනුව වාර්තා කිරීම හා ඇගයීම.
6. අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාල අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම, පිළිබඳව පසුවිපරම් කිරීම.
7. අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
8. කාර්යය සාධන වාර්තාව සකස් කර නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කිරීම.
9. ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම, වාර්තා සකස් කිරීම හා පසුවිපරම් කිරීම.
10. විදේශාධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති අදාල ආයතන සමග සම්බන්ධීකරණය කිරීම හා පසුවිපරම් කිරීම.

1.5.3 නිවාස හා සංවර්ධන අංශය

1.5.3.1 නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලභා කර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟපෙන්වීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ප්‍රතිපත්ති සම්පාදනය

- නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
- නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම.
- නිවාස ක්ෂේත්‍රයට අදාළ පනත් සංශෝධනය හා රෙගුලාසි සම්පාදනය.
- නිවාස ක්ෂේත්‍රයට අදාළ වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිවාස අංශයට අදාළ නිරීක්ෂණය සකස් කර ඉදිරිපත් කිරීම.
- ගරු මැති ඇමතිවරුන් විසින් ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන පාර්ලිමේන්තු ප්‍රශ්ණ සඳහා පිළිතුරු හා නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.

2. නිවාස සංවර්ධනය

- සහභාගිත්ව ක්‍රමවේදය යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ණය / ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මධ්‍යම ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකර අලෙවි කිරීම. (පෙර විකුණුම් පදනම මත)
- මහල් නිවාස ප්‍රතිසංස්කරණ කිරීම හා නැවත සංවර්ධනය කිරීම සමබන්ධ කටයුතු.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමඟ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කටයුතු.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහජනතාවගෙන් ඉදිරිපත් වන නිවාස ඉල්ලීම් අදාළ ආයතන වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණය.

3. වෙනත් රාජකාරි

- ලෝක ජනාවාස දිනයට සමගාමීව නිවාස විෂය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සමඟ සිදුකරන අනෙකුත් සම්බන්කධීරණ කටයුතු සිදු කිරීම හා තොරතුරු වාර්තා සකස් කර යොමු කිරීම.

1.5.3.2 ඉඩම් අංශය

නිවාස වැඩසටහන් සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම, අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය සිදුකරමින් ඉඩම් අත්පත් කරගැනීම් සහ බැහැර කිරීමේ කාර්යයන් වේගවත් කිරීම, ඉඩම් විෂය සම්බන්ධව ඉදිරිපත් වන ගැටළු සහ ඉල්ලීම් සම්බන්ධ කටයුතු කිරීම මෙම අංශය මඟින් සිදුකරයි. තවද, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අවශ්‍ය ඉඩම් පවරා ගැනීම සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයකි.

ඉඩම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම /පවරා ගැනීම සම්බන්ධ කටයුතු.
2. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.
3. 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/ නිවාස වල නීතිමය අයිතිය ජනතාවට පවරා දීම සඳහා ගරු අමාත්‍යතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධීකරණය කිරීම.

4. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය යන ආයතන වලට අවශ්‍ය ඉඩම් පවරාගැනීම පිළිබඳ කටයුතු.

මැදි ආදායම් ව්‍යාපෘති ඒකකය

නාගරිකව හා උප නාගරිකව වෙසෙන මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස ලබාදීමේ වැඩසටහනක " මධ්‍යම ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන " නමින් ආරම්භ කර ඇත. එම වැඩසටහන යටතේ නාගරික හා උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව මැදි ආදායම්ලාභීන් උදෙසා සියළු පහසුකම් වලින් සපිරි මහල් නිවාස සාධාරණ මිලකට ලබාදීම සිදුකෙරේ. මෙහිදී ආයෝජනය, සැලසුම් කිරීම, ඉදිකිරීම, අලෙවිකරණය හා විකිණීම පුද්ගලික අංශය විසින් සිදුකල යුතු අතර රජය විසින් වැඩබිම දක්වා ජලය, විදුලිය හා මාර්ග පහසුකම් ලබාදීමත් නිවාස ව්‍යාපෘති ඉදිකරන ඉඩමේ සංවර්ධන මිල පමණක් අයකර ගනිමින් ව්‍යාපෘතිය සඳහා ඉඩම් ලබා දීමත් සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකයේ කාර්යය වේ.

1.5.3.3 ජාතික නිවාස කොමසාරිස් අංශය

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශයට අයත් ජාතික නිවාස කොමසාරිස් අංශය 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ බලතල හා වගකීම් පැවරී ඇත.

ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම.
2. ජාතික නිවාස කොමසාරිස්වරයා පවරාගත් නිවාසවල භිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
3. පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති දේපල සම්බන්ධයෙන් වරින්වර පැන නැගෙන ගැටළු නිරාකරණය කිරීම හා ඊට අනුශංගික කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

1.5.4 තාක්ෂණ අංශය

අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කටයුතු සඳහා සහයෝගය, සම්බන්ධීකරණය හා තාක්ෂණික මගපෙන්වීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

එමෙන්ම, ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම, ගුණාත්මක හා පරිසර හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් බිහි කිරීමට මැදිහත් වීම මෙම අංශය මගින් සිදු කෙරේ.

තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පනත් කෙටුම්පත් සහ පනත් සම්බන්ධ කටයුතු කිරීම.
3. තාක්ෂණ අංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තය නියාමනය සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
4. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සුදානම් කිරීම සඳහා කටයුතු කිරීම.
5. වෘත්තීයවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

1.5.5 ඉදිකිරීම් අංශය

අප අංශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රජයේ කර්මාන්තශාලාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම, මධ්‍ය අදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව , ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම කාර්ය භාරය වේ.

2022.03.16 දින සිට අමාත්‍යාංශයේ රාජකරි නැවත සමාලෝචනයකින් පසුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව , ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව මගින් සිදු කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ කටයුතු වල

අධික්ෂණය ප්‍රගති සමාලෝචනය හා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කිරීම අතිරේක ලේකම් ඉදිකිරීම් යටතේ ඉටු විය.

ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අදාල ආයතන වල ප්‍රගතිය සමාලෝචනය කිරීම.
2. අදාල ආයතනවල මූල්‍යමය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම හා උපදේශන සේවා සැපයීම.
4. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධීකරණ කිරීම.
5. අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
6. නිපුණතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ට අගතියක් නොවන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාවයක් සහිත විදේශීය පුද්ගලයින් සඳහා විසා බලපත්‍රයක් ලබා ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.

1.5.6 ඉංජිනේරු සේවා අංශය

2021.07.01 වන දින කාර්ය මණ්ඩල සංශෝධනය සමඟ අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) යටතේ ස්ථාපිත වූ ඉංජිනේරු සේවා අංශය එවකට මුලික වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මඟින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු හා යන්ත්‍රෝපකරණ සේවා සැපයීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.

2022.03.16 දින සිට අමාත්‍යාංශයේ රාජකාරී නැවත සමාලෝචනයකින් පසුව අධ්‍යක්ෂ ඉංජිනේරු සේවා රාජකාරී කටයුතු, තොරතුරු තාක්ෂණ අංශයේ රාජකාරී කටයුතු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන යන ආයතනයන් මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු අනෙකුත් ඉංජිනේරුමය කටයුතු වල අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය හා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කිරීම අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු සේවා යටතේ ඉටු වේ.

ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රාජ්‍ය ආයතන වලට අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති වල ස්ථාවර තාක්ෂණික කමිටුවේ අනුමැතිය සඳහා යොමු කර ඇති ප්‍රමාණ පත්‍රිකාවල මිල ගණන් අවසරලත් සීමාවන් තුල ඇත්දැයි පරීක්ෂා කර කමිටුවේ අනුමැතිය සඳහා නැවත සකස් කිරීම.
2. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
3. අමාත්‍යාංශ ලේකම්ගේ හා අමාත්‍යාංශ බල සීමාව තුල ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වල විචල්‍යයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
4. තාක්ෂණික නොවන රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශවල ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය සහය ලබා දීම සහ සම්බන්ධීකරණය.
5. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධීකරණය.
6. අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිර්දේශ ලබා දීම.
7. තොරතුරු තාක්ෂණ අංශයට අදාලව ඉල්ලීම පරිදි මෘදුකාංග නිර්මාණය කිරීම හා ස්ථාපනය, නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම, යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම, පරිගණක දෘඩාංග හා මුද්‍රණ යන්ත්‍ර වල දෝෂ හඳුනාගැනීම හා අලුත්වැඩියාවට නිර්දේශ ලබා දීම, පරිගණක ජාල පද්ධති ආරක්ෂණය සම්බන්ධ කටයුතු ඇතුළු අමාත්‍යාංශයේ සියලුම තොරතුරු තාක්ෂණ අවශ්‍යතා හඳුනාගැනීම හා ඒවාට විසඳුම් ලබා ගැනීම.
8. අංශය යටතේ පවතින ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන යන ආයතනයන් මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති වල ඉදිකිරීම් හා තාක්ෂණික කටයුතු අනෙකුත් ඉංජිනේරුමය කටයුතු වල අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය හා අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කිරීම.

1.5.7 මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

මූල්‍ය අංශයේ ප්‍රධන කාර්යයන්

1. කාර්යක්ෂම හා ඵලදායී මූල්‍ය කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
3. මූල්‍ය කළමනාකරණ, මූල්‍ය සැලසුම්, අයවැයකරණය, වත්කම් කළමනාකරණය හා මිලදී ගැනීම්, කළමනාකරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශයට හා යටතේ ඇති ආයතන සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම.
4. මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගත හැකි ආකාරයට මූල්‍ය සම්පත් භාණ්ඩාගාරයෙන් ලබාගෙන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අතර බෙදා හැරීම.
5. අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කිරීම පෙරදැරිකොට එම ආයතන සමඟ සාමූහිකව වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම හා වර්ෂය පුරා අයවැය පාලන කටයුතු කිරීම.
6. වාර්ෂික විසර්ජන පනත මඟින් අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට වෙන් කරන මුදල් වියදම් කිරීමේදී නියමිත පරිදි වාර්තා කිරීම හා මාසිකව, වාර්ෂිකව මූල්‍ය වාර්තා අදාල ආයතන වලට ඉදිරිපත් කිරීම.
7. රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් එම අංශ මඟින් යෝජනා කරන අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.
8. අමාත්‍යාංශයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කිරීම.

1.5.8 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කරගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගි වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මඟ පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් සහායවීම.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම.
2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.
3. විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවම කර ගැනීමට සහාය වීම.
4. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම.

1.5.9 නැවත පදිංචි කිරීමේ අංශය

උතුරු හා නැගෙනහිර පළාත් වල දශක තුනකට අධික කාලයක් පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හා විදේශගතව සිට සිය රටට පැමිණෙන සරණාගත ජනතාව නැවත පදිංචි කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා එම ප්‍රදේශවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ස්ථාපිත නැවත පදිංචි කිරීමේ අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ අනුව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමට අදාළව 2022 දෙසැම්බර් 31 දින වන විට උතුරු පළාතේ පවුල් 180,793 කට අයත් පුද්ගලයන් 575,012 ක්ද නැගෙනහිර පළාතේ පවුල් 91,329 කට අයත් පුද්ගලයන් 338,360 ක්ද නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට අමාත්‍යාංශයට හැකිවිය. සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම අමාත්‍යාංශය විසින් පවුල් 272,122 ක පුද්ගලයන් 913,372 ක් 2022 දෙසැම්බර් මස 31 වන දින වන විට උතුරු හා නැගෙනහිර පළාත් වල නැවත පදිංචි සිදුකර ඇත.

2022 දෙසැම්බර් 31 දින වන විට උතුරු හා නැගෙනහිර පළාත් වල දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වාර්තා කර ඇති දත්ත වලට අනුව තවදුරටත් ඥාති හිතමිතුරන් සමඟ හා සුභසාධන මධ්‍යස්ථාන වල සිටින පවුල් 2,626 ක පුද්ගලයන්

7,914 ක් නැවත පදිංචිය අපේක්ෂාවෙන් සිටිති. මොවුන් අතරින් තවදුරටත් යාපනය දිස්ත්‍රික්කයේ සුහසාධන මධ්‍යස්ථාන 15 ක පවුල් 149 කට අයත් පුද්ගලයන් 485 ක්ද අයත්ව ඇත.

2022 වර්ෂය තුළ උතුරු හා නැගෙනහිර පළාතේ පවුල් 2109 කට අයත් පුද්ගලයින් 3059 ක් නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලදී. මෙයට අමතරව ඉන්දියාවේ සිට පැමිණි පවුල් 59 කට අයත් පුද්ගලයින් 117 ක් නැවත පදිංචි කිරීමද සිදු කර ඇත.

උතුරු හා නැගෙනහිර පළාත් වල දශක 03 කට අධික කාලයක් පුරා පැවතුන අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් තම මුල් ගම් බිම් අහිමිව අවතැන් වූ ජනතාවගේ නැවත පදිංචි කිරීමේ කටයුතු වලට අදාළ 2022 වර්ෂයේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ස්ථාපිත නැවත පදිංචි කිරීමේ අංශය වෙත රුපියල් මිලියන 1319.50ක ප්‍රතිපාදන 2022 වර්ෂය ආරම්භයේදී වෙන් කර තිබුණි. කෙසේ වෙතත් රට තුළ ඇතිවූ ආර්ථික දුෂ්කරතා හා වසංගත තත්ත්වයන් හමුවේ මුල් ප්‍රතිපාදන සංශෝධනයට ලක් කරමින් එය රුපියල් මිලියන 1180 ලෙස සංශෝධනය කරන ලදී.

නැවත පදිංචි කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. උතුරු නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ස්ථීර නිවාස ඉදිකිරීම.
2. ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි සුහසාධන මධ්‍යස්ථාන වල වාසය කරන ඉඩම් අහිමි පවුල් සඳහා රාජ්‍ය ආධාර මත ඉඩම් මිල දී ගෙන ස්ථීර නිවාස ඉදිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලබා දීම.
   - පානීය ජල පහසුකම් ලබා දීම.
   - ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබා දීම.
   - හානියට පත් නිවාස අළුත්වැඩියා කිරීම.
   - සනීපාරක්ෂක පහසුකම් ලබා දීම.
   - අවතැන් වූ පවුල් වාසය කරන ප්‍රදේශ වල අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග ඉදිකිරීම.
   - හානියට පත් පාසල් ගොඩනැගිලි හා පෙර පාසල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම.
3. බිම් වෙඩි හා පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මෙහෙයවමින් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු හා සංවර්ධන කටයුතු සඳහා ඉඩම් නිදහස් කිරීම.
4. නැවත පදිංචි කිරීමේ කටයුතු වලට පහසුකම් සපයන දේශීය සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම.
5. අවතැන් වූ ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා ජීවනෝපාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන හා ව්‍යාපෘති ඒකක

1.6.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ නිවාස අංශයේ දැවෙන ගැටළු සඳහා සෘජු විසඳුම් ලබාදීමේ අරමුණු සහිතව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපනය කරන ලද්දේ 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත මඟිනි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ 2, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතල අංක 34 දරණ ස්ථානයේ පිහිටුවා ඇති අතර දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි දීපව්‍යාප්ත කාර්යාල 25 ක් හා කොළඹ නගරය ආවරණය වන පරිදි නගර කාර්යාල 02 ක් මඟින් එහි මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. 2164 ක් පමණ වන අනුමත කාර්යය මණ්ඩලයක් සහිත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි සේවාවන් 2000ක් පමණ වූ සත්‍ය කාර්ය මණ්ඩලයක් සහිතව ''සෞභාග්‍යයේ ඉදිරි දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් හඳුන්වා දී ඇති නිවාස හා ජනාවාසකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පවුලක්ම සතුටින් පිරි සුව පහසු නිවසක් තුල ජීවත්වීම සැබෑවක් බවට පත්කිරීමට ''ඔබට ගෙයක් - රටට හෙටක්'' ආධාර නිවාස වැඩසටහන, ''සපිරි මහල් නිවාස'' වැඩසටහන, ''සපිරි ගම්මාන'' වැඩසටහන, ''සපිරි නිවහන්'', ''මධ්‍යම පාන්තික හරිත මහල් නිවාස'', ''බැංකු හා ඒකාබද්ධ සපිරි නිවාස ණය'' වැනි නිවාස වැඩසටහන් රැසක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

1.6.2 ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම

ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරියෙහි කොටස් ප්‍රාග්ධනයෙන් සමන්විතව 1994 වර්ෂයේ ජූලි 13 වන දින 1982/17 දරණ පනතින් සංස්ථාපනය කරන ලදුව පසුව 2007/7 දරන නව සමාගම් පනත යටතේ ලි.ප.අංක - පීවී 17667 මගින් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත.
රාජ්‍ය සමාගමක් ලෙස දේපල සංවර්ධනය හා දේපල කළමණාකරනයෙහි විශිෂ්ඨත්වයට පත්, රාජ්‍ය ආයතනයක් ලෙස විශ්වාසනීය, පුද්ගලික සමාගමක් ලෙස කාර්යක්ෂමතාවය පදනම් කොටගෙන පාරිභෝගිකයා වෙත කඩිනම්, තත්වයෙන් උසස්, ප්‍රමිතියානුකූල සේවාවක් සැපයීම හා පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයට සරිලන පරිදි තනි නිවාස මෙන්ම නිවාස ව්‍යාපෘති ඉදිකොට වෙළෙඳපල තරගකාරීත්වය මත පදනම් වූ හා සාධාරණ මිලකට අලෙවි කිරීම සිදු කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලැබේ.

1.6.3 මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් වැඩසටහන

2016 වර්ෂයේදී හඳුන්වාදෙන ලද මෙම වැඩසටහන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා සියළු පහසුකම් වලින් සපිරි නිවසක් උරුමකර දීමේ අරමුණින් යුතුව ආරම්භ කර ඇති මධ්‍ය ආදායම්ලාභී පවුල් වලට පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය කිරීම මගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම මෙන්ම ආර්ථික සමෘද්ධිය ලගාකරදීම මෙමගින් සිදු කරනු ලබයි.

1.6.4 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1849 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලෙසින් ආරම්භ වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී " ඒ " කාණ්ඩයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබූ අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් අනතුරුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එකම අධිකාරි ආයතනය සහ උපදේශක ආයතනය ලෙස සළකනු ලැබේ.

ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 07 ක් මඟින් දිවයින පුරා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් වස් විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබේ.

මෙම ආයතනය ISO 9001/2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.

1.6.5 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 1849 වර්ෂයේ එවකට පැවති බ්‍රිතාන්‍ය පාලනය විසින් කොළඹ ගෑස්පහ හංදියේදී ආරම්භ කර ඇත. 1928 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික වැඩපල වශයෙන් දැනට පවතින කොලොන්නාව භූමියේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ සියළුම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් ස්ථාපිත කරන ලදි. 1971 වර්ෂයේදී " ඒ " ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පත් කර ඇත.

දැනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ජල පාලන දිය දොරටු සාදා සැපයීම, සවි කිරීම හා නඩත්තුව, තැපැල් දෙපාර්තමේන්තුවේ දින මුද්‍රා හා දින කැට සාදා සැපයීම, පොලිස් දෙපාර්තමේන්තුවේ අංක තහඩු සහ සාජන් පටි සෑදීම, දැවමය ගෘහ භාණ්ඩ සාදා සැපයීම, ජල සම්පාදන මණ්ඩලයේ ජලය පිරිපහදු ටැංකි සෑදීම, රාජ්‍ය උත්සව සඳහා පිලිගැනීමේ පීයිකා සවි කිරීම, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යකඩ පාලම් සාදා සවිකිරීම, ආයතන වල කාමර වෙන් කිරීම (Aluminium Partition) සහ නාම පුවරු සාදා සවි කිරීම, රාජ්‍ය ආයතනවල වාහන සේවා හා නඩත්තු කිරීම, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත වීනවට්ටි, තිරිංග පලු ඇතුළු වීනවට්ටියෙන් නිම කරන ලද භාණ්ඩ සාදා සැපයීම, දැවමයෙන් හා යකඩයෙන් නිම කරන ලද රෝහල් උපකරණ සාදා සැපයීම, බොයිලේරු සහ ගෑස්නල පද්ධති නඩත්තු කටයුතු සිදු කිරීම. තාක්ෂණික සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ ඉංජිනේරු සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීම ආදී කටයුතු සිදුකරනු ලබයි. අප ආයතනය ISO 9001/2015 තත්ත්ව සහතිකය ලබාගෙන ඇත.

1.6.6 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණු වේ.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් සඳහා අධිකාරිය කටයුතු කරනු ලැබේ.

1.6.7 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශක සේවා ලබාදීම, ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය, පෙරසව්/පෙරැදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබාදීම මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු ද සිදු කරනු ලබයි.

2009 වසරේ සිට ISO 9001/2000 තත්ත්ව සහතිකයෙන් හා ISO 14001/2004 පරිසර කළමනාකරණ සහතිකයෙන්ද පිදුම් ලබා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

1.6.8 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

රාජ්‍ය ආයතන වලට යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 වසරේ දී පිහිටුවන ලදි. 2011 වසරේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශය ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඒ යටතට ගනු ලැබූ අතර 2016 වසරේ ජනවාරි මාසයේ දී නැවත වරක් අමාත්‍යමණ්ඩල තීරණයක් මඟින් රාජ්ය ඉංජිනේරු සංස්ථාව යටතේම කළමනාකරණ මණ්ඩලයක් මඟින් ක්‍රියාත්මක වේ.

වනජීවී, සත්වෝද්‍යාන, වාරිමාර්ග, වෙරළ සංරක්ෂණ සහ දුම්රිය ආදී දෙපාර්තමේන්තු විසින් ප්‍රදානය කරනු ලබන විශේෂිත කොන්ත්‍රාත් මඟින් මෙම ආයතනය ඉදිරියට යමින් සිටියි. මුද්‍රණ වෘත්තිකයින්, පුහුණු සේවකයන් සහ කම්කරු මට්ටමේ සේවකයන්ගෙන් සැදුම්ලත් කාර්යය මණ්ඩලයකින් සමන්විතය. තවද ආයතනය බර යන්ත්‍රෝපකරණ ඇණියක් සහ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා සේවය සපයන ඩිපෝ පද්ධතියකින් මෙන්ම දිවයිනේ සෑම පළාතකම පිහිටි සියළු පහසුකම් වලින් සමන්විත යාන්ත්‍රික වැඩහල් වලින් යුක්තය.

1.6.9 සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා සමාගම

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කරන ලදි. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ 100% රජය සතු සී/ස වගකීම් සහිත සමාගමක් බවට මෙම සංස්ථාව පත්කරන ලදි. 2007 වර්ෂයේදී සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් විය. නැවත 2010 වර්ෂයේ මාර්තු මාසයේදී 2007 සමාගම් පනතේ අංක 07 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

බාහිර ශාඛා 16 කින් සමන්විතව දීප ව්‍යාප්තව ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ඉහල ප්‍රමිතියකින් හා මිල නියාමනයකින් යුක්තව පාරිභෝගිකයන්ට සැපයීමට සහ එකම වහලක් යට සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ විවිධ සැපයුම්කරුවන් අතරින් තෝරාගෙන පාරිභෝගිකයන්ට මිලදී ගැනීමට අවකාශයක් ලබා දී තිබීම මෙමගින් සිදු කරනු ලැබේ.

1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස සංවර්ධන ව්‍යාපෘති 5 ක් මෙම අමාත්‍යාංශය යටතේ පවතී.

ව්‍යාපෘතිය	මූල්‍ය වටිනාකම	ව්‍යාපෘති කාලසීමාව	ව්‍යාපෘති අරමුණු
පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතිය (මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)	1. ඉන්දියානු රජය රු.මි.300 2. ශ්‍රී ලංකා රජය රු.මි.195	පළමු කොන්ත්‍රාත්තුව අවලංගු කර CECB ආයතන මගින් නැවත ආරම්භ කර ඇත. ඉදිකිරීම් නිම වන තුරු කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ඇත.	අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම ග්‍රාම නිලධාරී වසමේ දිළිඳු පවුල් 153 සඳහා නිවාස සැපයීම ඇතුළු මූලික සමාජ යටිතල පහසුකම් සැපයීම
දීප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	රු.මි.300	ඉදිකිරීම් නිම වනතුරු කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ඇත.	දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම
හම්බන්තොට දිස්ත්‍රික් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	රු.මි.300	ඉදිකිරීම් නිම වනතුරු කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ඇත.	දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම
දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	රු.මි.300	ඉදිකිරීම් නිම වනතුරු කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ඇත.	දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම
උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	රු.මි.300	ඉදිකිරීම් නිම වනතුරු කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ඇත.	දිළිඳු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම (අංශ අනුව)

2.1 - පාලන අංශය

2022 ප්‍රගතිය

➢ **පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය**

මෙම අංශයට අදාළ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු කටයුතු එනම් වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම, සේවය ස්ථීර කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම්, වැඩ බැලීම සඳහා පත් කිරීම හා රාජ්‍ය සේවයේ විශ්‍රාම ගැන්වීම යන කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

➢ **මූල්‍ය කළමනාකරණය**

අමාත්‍යාංශ ලේකම් විසින් මුදල් රෙගුලාසි 135 යටතේ පවරන ලද බලතල ප්‍රකාරව පාලන අංශය වෙත ලැබෙන සියලුම වියදම් එනම්, ගෙවීම් වවුචර් , ආපදා ණය / විශේෂ අත්තිකාරම් ඉල්ලීම් අදාළ ගෙවීම් වල නිරවද්‍ය බව පරීක්ෂා කර බලා අනුමැතිය හා නිර්දේශ ලබා දීම ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත.

➢ **අමාත්‍ය මණ්ඩල සංදේශ**

2022 වර්ෂයේ පාලන අංශයට අදාළව සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා සම්බන්ධීකරණය සිදු කළ අතර, අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ 56ක් අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇත. එමෙන්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු වූ පාර්ලිමේන්තු ප්‍රශ්න 10 ක් සඳහා පිළිතුරු යොමු කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කර නියමිත පරිදි පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

➢ **අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කාර්ය සාධන වාර්තා, වාර්ෂික වාර්තා -2022**

විස්තරය	වාර්ෂික වාර්තා/කාර්ය සාධන වාර්තා
පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කර ඇති වාර්ෂික වාර්තා/ කර්ය සාධන වාර්තා	• ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 2021 කාර්ය සාධන වර්තාව • රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 2020 හා 2021 කාර්ය සාධන වාර්තාව • ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය • 2019 වාර්ෂික වර්තාව • රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 2016 හා 2017 වාර්ෂික වාර්තාව • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2018 වාර්ෂික වාර්තාව
පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වර්තා	• ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2020 වාර්ෂික වාර්තාව • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2019 වාර්ෂික වාර්තාව • රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 2018 වාර්ෂික වාර්තාව

➢ **ස්ථාවර වත්කම් කළමනාකරණය**

- **නිවාස හා ඉදිකිරීම් අංශය**

නිවාස සහ ඉදිකිරීම් අංශයේ හා නැවත පදිංචි කිරීම් අංශය, වෙතින් තාවකාලිකව ලබාගත් වාහන ඇතුළුව වාහන 42ක් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කර ඇති අතර, ඒ සඳහා රු.11,821,489.57.ක මුදලක් දරා ඇත.

2022 වර්ෂයේ නිවාස සහ ඉදිකිරීම් අංශයේ වායු සමීකරණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ හා ෆැක්ස් යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, මෘදුකාංග,අභ්‍යන්තර දුරකථන පද්ධති, ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහාත් 2022 වර්ෂයේදී රු. 2,174,596.62 ක මුදලක් වැය කර ඇත.

- **නැවත පදිංචි කිරීමේ අංශය**

නැවත පදිංචි කිරීමේ අංශයේ වාහන 14ක් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කර ඇති අතර, ඒ සඳහා රු. 5,135,963.11ක මුදලක් දරා ඇත.

නැවත පදිංචි කිරීමේ අංශයේ ගොඩනැගිලි නඩත්තු වියදම් සඳහා 2022 වර්ෂයේදී 15,861,050.62 ක මුදලක් වැය කර ඇත.

➢ **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා නිවාස හා ඉදිකිරීම් අංශයේ නිලධාරීන් 58 දෙනෙකු සඳහා දෙමළ භාෂා පුහුණුවද, මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකු සඳහා දේශීය පුහුණුවද ඇතුළුව නිලධාරීන් 92ක් හා නැවත පදිංචි කිරීමේ අංශයේ එක් නිලධාරියකු සඳහා 2022 වර්ෂය තුල දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. එය පිළිවෙලින් එක් එක්

අංශයන්හි සමස්ථ සේවක සංඛ්‍යාවෙන් 1% හා70%ක ප්‍රතිශතයකි. පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තිය හමුවේ වුවද මාර්ගගත ක්‍රමය ඔස්සේ නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබා දී ඇති අතර, මාර්ගගත ක්‍රමවේදය හරහා නිවාස හා ඉදිකිරීම් අංශයේ මාණ්ඩලික නිලධාරීන් එක් අයකු සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. කොවිඩ් වසංගත ව්‍යාප්තිය හමුවේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව සෑම නිලධාරියෙකුටම පැය 12 ක පුහුණු අවස්ථාවක් ලබාදීමට උපරිමයෙන් උත්සාහ කර ඇති අතර, පුහුණු අවස්ථා ඉල්ලුම් කල සෑම නිලධාරියෙකුටම කුමන හෝ එක් පුහුණු අවස්ථාවක් ලබාදීමට කටයුතු කර ඇත.

- **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

2022 වර්ෂයට අදාළව ජනාධිපති කාර්යාලයෙන් හා අගමැති කාර්යාලයෙන් මෙම අංශයේ පාලන අංශයට මහජන ඉල්ලීම් ලිපි 1400 ට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇත, ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ඉල්ලීම් සම්බන්ධයෙන් වන අතර එවැනි මහජන ඉල්ලීම් නිවාස අංශයට යොමු කර ඇත. තව ද මෙම අංශය යටතේ පවතින ආයතනවල සේවක සේවිකාවන්ගේ ආයතනික ගැටළු සහ වෘත්තීය ගැටළු සම්බන්ධව ලිපි 36 ක් ලැබී ඇති අතර එම ලිපි සෘජුවම අදාළ ආයතනය වෙත යොමු කරන අතර ලැබෙන පිළිතුර අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. දේශපාලන පලිගැනීම් සම්බන්ධව 2022 වර්ෂයට අදාළව ලිපි 03 ක් ලැබී ඇති අතර එම ලිපි සම්බන්ධවද අදාළ ආයතනවලින් විමසීම් සිදුකර ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇත. ඉහත මහජන ඉල්ලීම් සඳහා නොපමාව කටයුතු කරනු ලබන අතර ආයතනික හා වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට කටයුතු කරනු ලබයි.

- **අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කළමනාකරණය**

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මානව සම්පත් කළමනාකරණය සඳහා පහත සඳහන් පරිදි සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.

- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ගණයේ (PL කාණ්ඩයේ) අත්‍යවශ්‍ය තනතුරු 77ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කර ඇත.
- අමාත්‍යාංශයේ නිර්දේශ සමඟ යොමු කරන ලද, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර, තාක්ෂණික අධි පන්තිය සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටි 01ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අනුමත ප්‍රමාණ සමීක්ෂණ සහකාර තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත.
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කේ.ජී.එස්.කුමුදුනි මිය පත්කර ඇත.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ජාතික උපදේශක සභාව සඳහා නව සාමාජිකයන් පත් කිරීමට කටයුතු කර ඇත.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී ඇත.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියේ පැවති ගැටළුකාරී තත්වයන් නිරවුල් කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- මැදි ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන් ව්‍යාපෘතිය සඳහා වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකයේ තනතුරුවල සේවා කාලය 2023.03.31 දක්වා දීර්ඝ කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත.
- සීමාසහිත ලංකා ගෙඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් සඳහා අනුමැතිය ලබා ගන්නා තෙක් කොන්ත්‍රාත් පදනම මත අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත. ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කරගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවති.
- ස්වෙච්ඡා විශ්‍රාම ගැන්වීමෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට අවශ්‍ය උපදෙස් අමාත්‍යාංශය විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී ඇති අතර, සංශෝධිත කාර්ය මණ්ඩල කෙටුම්පත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඉදිරිපත් කිරීමට නියමිතය.

- **තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම**

තොරතුරු දැනගැනීමේ පනතට අදාළව ඉල්ලීම් 05ක් අදාළ අංශ වෙත යොමු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

2023 ඉදිරි දැක්ම

මෙම අංශයේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය තොරුතුරු තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇත.

2.2 - සැලසුම් අංශය

2022 ප්‍රගතිය

- **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2022 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතන වලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම නියමිත කාල සීමාව තුල සකස් කරන ලදි.

- **ප්‍රගති සමාලෝචන රැස්වීම්**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ඉදිකිරීම් අංශයේ ආයතන සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 44ක් සංවිධානය කරන ලදී. වසර මැද මුහුනපෑමට සිදු වූ විවිධ අර්බුද හමුවේ වුවද අපේක්ෂිත පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලදී. මාර්ගගත ක්‍රමය ඔස්සේ ද ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

- **ප්‍රගති වාර්තාකරණය**

ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත මාසිකවද අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල ප්‍රගතිය ප්‍රමාදයකින් තොරව වාර්තා කරන ලදී. ඊට අමතරව, ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි ජනතා කේන්ද්‍රීය ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ‘‘ගම සමග පිලිසඳර වැඩසටහන්’’ වලට අදාලව මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වල ප්‍රගතිය මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ‘‘ යටිතල පහසුකම් කමිටුව ’’ වෙත ප්‍රමාදයකින් තොරව මාසිකව වාර්තා කරන ලදී.

- **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබාගැනීම.**

2022 වර්ෂය අවසාන වන විට මෙම අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති 5 ක් පැවතිනි. එම සියළුම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ ඉන්දියානු රජය විසිනි. ඒවාට යටිතල පහසුකම් සැපයීම සහ අත්‍යාවශ්‍ය අතිරේක වැඩ කොටස් සඳහා මුදල් අමාත්‍යාංශයෙන්ද ප්‍රතිපාදන ලබා දෙයි.

2018 ජූලි 26 දින ඉදිකිරීම් ආරම්භ කළ ‘‘පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම නිවාස ව්‍යාපෘතියේ ’’ කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතා හේතුවෙන් අතරමග නැවතුණි. එම නිවාස ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී නැවත ආරම්භ කරන ලදී. නිවාස හා නාගරික සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගේ මැදිහත් වීම මගින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ මුදල් අමාත්‍යාංශය සමඟ කරන ලද සාකච්ඡා කීපයකින් අනතුරුව නව ඇස්තමේන්තු අනුව අතිරේක මුදල් ශ්‍රී ලංකා රජය මගින් ලබා දීමේ එකඟතාවය මත නැවත ආරම්භ කිරීමට හැකිවිය.

නිවාස 153 සම්පූර්ණ කිරීම සහ විහාරස්ථානය ආශ්‍රිත අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා ඉන්දියානු රජය මගින් තව දුරටත් ලබා දියහැකි රු.මි.253 ට අමතරව රු.මි. 40 ක මුදලක් ශ්‍රී ලංකා රජය මගින් යෙදවීමට කටයුතු කරන ලදී.

මෙම සියළුම ඉදිකිරීම් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) මගින් ඉටු කරවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මේ වන විට ශ්‍රී ලංකා රජයෙන් ලබා දෙන මුදලට අදාළ ඉදිකිරීම් සඳහා ගිවිසුම CECB ආයතනය සමඟ අත්සන් කර ඉදිකිරීම් අරඹා ඇත. ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයද CECB ආයතනය සමඟ නිවාස 122ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඉදිකිරීම් සිදු කරමින් යනු ලැබේ.
මීට අමතරව, ‘‘ ශ්‍රී සෝභිත නාහිමි ගම්මානයට ’’ නලජලය සැපයීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය වෙත ලබා දී මේ වන විට ජල ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ප්‍රජා ජල සමිතියක් හරහා නඩත්තු කටයුතු පවත්වා ගෙන යාමට කටයුතු කරමින් පවතියි.

අනෙකුත් ඉන්දියානු නිවාස වැඩසටහන් 04 ද මේ වනවිට සැලකිය යුතු ප්‍රගතියක් ලගාකරගෙන ඇත. නිවාස 2400න් 2086ක වැඩ ආරම්භ කර මේ වන විට නිවාස 607ක වැඩ අවසන් කර ප්‍රතිලාභීන් පදිංචි කර ඇත. වර්තමානයේ පවතින

ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහලයාම සහ ප්‍රතිලාභීන්ගේ ආර්ථික අපහසුතා හේතුවෙන් මේ වන විට ඉදිකිරීම් මන්දගාමීව සිදු වන අතර ආධාර මුදල වැඩිකිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ සාකච්ඡා වට කීපයක් පවත්වා අතිරේක ප්‍රතිපාදන අපේක්ෂාවෙන් ඉදිරි කටයුතු සැලසුම් කරනු ලැබේ.

2023 ඉදිරි දැක්ම

වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ වුවද, මේ වන විට ආරම්භ කර ඇති අත්‍යාවශ්‍ය ඉදිකිරීම් කටයුතු සහ අනෙකුත් අත්‍යාවශ්‍ය සේවාවන් ලැබෙන සීමිත ප්‍රතිපාදන අනුව අඛණ්ඩව පවත්වා ගෙන යෑමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

2.3 - නිවාස හා සංවර්ධන අංශය

2.3.1 නිවාස අංශය

2022 ප්‍රගතිය

- **“ ඔබට ගෙයක් - රටට හෙටක් ” නිවාස වැඩසටහන**

වාර්ෂිකව අඩු ආදායම්ලාභීන් 14,022 දෙනෙකු සඳහා රු.650,000ක උපරිමයකට යටත්ව ඉදිකිරීම් ප්‍රගතිය මත පදනම්ව අදියර වශයෙන් ආධාර මුදල් ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. මේ යටතේ 2022 වර්ෂය තුල නිවාස 5878ක ඉදි කිරීම් අවසන් කර ඇත.

මෙම වැඩසටහනේ ඉලක්ක ගත කණ්ඩායම වන අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථිකයට සවියක් වීම සඳහා එම පවුල් ගෙවතු වගාවට යොමු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය බීජ පැල හා කෘෂි තාක්ෂණික සහාය ලබා දීමටත් කටයුතු කර ඇත.

- **“ මිහිදු නිවහන නිවාස ” ආධාර වැඩසටහන**

බුදු සසුන සඳහා දරුවන් පිදූ ආර්ථික වශයෙන් දුෂ්කර මට්ටමක සිටින නිවසක් අහිමි හෝ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවෙස් හිමි දෙමව්පියන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා රු.600,000ක උපරිමයකට යටත්ව නිවාස ආධාර ලබාදීම මෙමඟින් සිදු කෙරේ.

2022 වර්ෂය තුළ ප්‍රතිලාභීන් 77 දෙනෙකු සඳහා නිවාස ආධාර ලබා දී ඇති අතර ඉන් නිවාස 8ක ඉදිකිරීම් මේ වන විට අවසන් කර ඇත.

- **“ මිහිදුපුර ” නිවාස ව්‍යාපෘතිය**

2013 වර්ෂයේදී අරම්භ කර ඉතා අඩු ප්‍රගතියක් පැවතීම හේතුවෙන් අවසන් කරන ලද මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම ඇතුලු මූලික පියවර ගන්නා ලදී. එහිදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම ව්‍යාපෘතියේ සංවර්ධක ලෙස පුර්වයෙන් කටයුතු කල CDC Industrial Infras ආයතනය නව සංවර්ධක ලෙස තෝරා ගැනිණි. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා සංවර්ධක අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කරමින් පවතින අතර අනතුරුව ඉදිකිරීම් ආරම්භ කිරීමට අපේක්ෂිතය.

- **“ පවර් හයිඩ්” නිවාස ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් අඩු ආදායම්ලාභීන් 25,000ක් සඳහා නිවාස ඉදිකිරීමටත් එසේ ඉදි කෙරෙන සෑම නිවසකම වහලය මත 20 KW සූර්යය පැනල සවි කිරීමටත් අපේක්ෂිතය. මේ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් Bank of Australia මඟින් සපයන අතර ව්‍යාපෘතියේ සංවර්ධක ලෙස Sunpower – Powerhyde Consortium කටයුතු කරයි.

මෙහි පළමු අදියර සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2015/2019 කාලය තුල ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ අර්ධ වශයෙන් නිම කල නිවාස යොදා ගැනීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් වසර 20ක් දක්වා නිවාස වල අයිතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවන අතර සුර්යය පැනල වල අයිතිය සංවර්ධක සතු වේ. වසර 20කට පසු එහි අයිතිය ප්‍රතිලාභියා වෙත ලබාදීමට නියමිතය. ඒ අනුව උත්පාදනය වන විදුලිය සඳහා විදුලි බල මණ්ඩලය විසින් මුල් වසර 20 තුල සංවර්ධක වෙත ගෙවීම් සිදු කරන අතර අනතුරුව ප්‍රතිලාභියා වෙත ගෙවීම් සිදු කෙරෙනු ඇත.

- **“ සොයිසාපුර ” පුනස්ථාපන නිවාස ව්‍යාපෘතියේ අදියර III යටතේ කලාප II හා IIIට අයත් නව ගොඩනැගිලි දෙක ඉදිකිරීම**

මේ යටතේ නිවාස ඒකක 30කින් යුත් ගොඩනැගිලි 2ක් පෙර විකුණුම් පදනම මත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ඉදි කෙරේ. එයින් නිවාස 10ක් මේ වන විට අලෙවි කර ඇති අතර ඉතිරි නිවාස 20 සඳහා ප්‍රතිලාභීන් තෝරා ගනිමින් පවතී.

මීට අමතරව පහත වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- ‘‘සියපත’’ නිවාස වැඩසටහන
- ‘‘හන්තාන’’ නිවාස ව්‍යාපෘතිය
- ‘‘ඔබට ගෙයක් - රටට හෙටක්’’ නිවාස ණය වැඩසටහන

2.3.2 ඉඩම් අංශය

- ඉඩම් සම්බන්ධයෙන් මතුවූ ගැටළු නිරාකරණය සඳහා අග්‍රාමාත්‍ය කාර්යලය හා ජනාධිපති කාර්යාලය වෙතින් ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් 45ක් අදාළ අංශ වෙත යොමු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් වල ලේඛණයක් පවත්වාගෙන යාම.
- ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ දෙපාර්තමේන්තු වෙත ඉල්ලීම් 25ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- 2022 වසරේ දිස්ත්‍රික්ක 25ක් සඳහා ඔප්පු 1400ක් නිකුත් කර ඇත.

මීට අමතරව 2018 අංක 23 දරණ බද්ධ නිවාස (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන යටතේ ඔප්පු ලබා දීම සඳහා අදාළ නිවාස යෝජනා ක්‍රමවල සහාධිපත්‍ය ප්‍රකාශන ලියාපදිංචි කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීම සම්බන්ධීකරණය කෙරේ.

2.3.3 - ජාතික නිවාස කොමසාරිස් අංශය

2022 ප්‍රගතිය

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාලය තුළ කාර්යාලයට පැමිනි මහජනතාවගේ ගැටළු සහ ලිඛිතව ඉදිරිපත් වූ ගැටළු සඳහා විසඳුම් ලබාදීම සිදු කර ඇත. 2022 වර්ෂය තුළ රාජකාරිමය ලිපි 633 ක් ලැබී ඇති අතර, එම ඉල්ලීම්වලට විසඳුම් ලබා දී ඇත. එසේම, දුරකථනය මගින් ද මහජනතාව විසින් මෙම අංශය වෙතින් විමසනු ලබන යම් යම් ගැටළු සඳහා උපදෙස් ලබා දී ඇත. අදාළ ගැටළු නිසි පරිදි හඳුනා ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂණ 06 ක් සිදුකර ඒ පිළිබඳව වාර්තා කර ඇත. එසේම පිඹුරු පිටපත් 23 ක් නිකුත් කර ඇත. තව ද නඩු කටයුතු වෙනුවෙන් විවිධ අධිකරණ ඉදිරියේ සාක්ෂි පිණිස පෙනී සිටීම ද අධිකරණ කටයුතු සඳහා ලේඛන සකස් කිරීම ද, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාළ කටයුතු ඉටු කිරීම ද, ජාතික නිවාස කොමසාරිස්ට අදාළ නඩු කටයුතු සඳහා නිරීක්ෂණ සපයමින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සහයෝගය ලබා දීම ද සිදු කර ඇත.

2023 ඉදිරි දැක්ම

- මෑතක් වනතුරු පුරප්පාඩුව පැවතුණ 1973 අංක 1 දරණ නිවාස දේපල උපරිමය පිළිබඳ නීතිය යටතේ තක්සේරු මණ්ඩලය දැනට පත් වී ඇති අතර, ඒ තුළින් ප්‍රමාද වී පැවතුන ඔප්පු ලබා දීමට අවශ්‍ය තක්සේරු කිරීමේ කටයුතු කඩිනම් කිරීම.
- ස්ථානීය පරීක්ෂණ සහ කාර්යාලීය පරීක්ෂණ පවත්වා නිවාස වල පදිංචිකරුවන්ගේ/කුලී නිවැසියන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීම තුළින් ඔප්පු ලබා දීමට අවශ්‍ය ක්‍රියා මර්ග ගැනීම.
- කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම සඳහා අවශ්‍ය මූලික පියවර ගැනීම.
- නඩු කටයුතු සඳහා අධිකරණ තුළ සාක්ෂි ලබා දීම සඳහා පෙනී සිටීම, නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡාවලට සහභාගී වීම, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අධිකරණ කටයුතු පිළිබඳව අදාලවන කටයුතු ඉටු කිරීම.

2.4 - තාක්ෂණ අංශය

2022 ප්‍රගතිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග 15 ක් සහ රීති 09 ක් අනුමත කල යුතුව ඇත. එයින් නියෝග 13 ක් ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන ඇති අතර, රීති 06 ක් ගැසට් පත්‍රයේ පළකර ඇත. මීට අමතරව තවත් නියෝග 2ක් හා රීති 3ක් පළ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය සඳහා පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර, ඊට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට කටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතන පනත සහ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතන පනත සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත්ව ඇති ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීමේදී පනත් කෙටුම්පත පිළිබඳ අදාළ පාර්ශව වලින් අදහස් ලබා ගෙන ගරු අමාත්‍යතුමාගේ වාර්තාව ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

මීට අමතරව මෙම වසර තුළ ද අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් පිළිබඳ ආරවුල් පිළිබඳ පැමිණිලි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඒ පිළිබඳ මැදිහත්වීම සිදුකරන ලද අතර, ඉදිකිරීම්

ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන මගින් නිරතුරුව ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කර විසඳුම් ලබා දීම සිදුකරන ලදී.

2023 ඉදිරි දැක්ම

- ඉදිකිරීම් උපදේශක සභාව රැස්වීම් සෑම කාර්තුවක් සඳහාම පවත්වා ඉදිකිරීම් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධ නිර්දේශ ලබා ගැනීම.
- 2014 අංක 33 දරණ ඉදිකිරීම් සංවර්ධන පනත සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- 2014 අංක 33 දරණ ඉදිකිරීම් සංවර්ධන පනත යටතේ තව දුරටත් අනුමත කර ගැනීමට ඇති නියෝග දෙකක් හා රීති තුනක් ගැසට් පත්‍රයේ පළ කිරීම හා නියෝග පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගැනීම.
- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතන පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන කටයුතු සිදු කිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්යයන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව විවිධ පාර්ශව වලින් ඉදිරිපත් වන යෝජනා හා ගැටළු සම්බන්ධයෙන් අදාල ආයතන අතර සම්බන්ධීකරණය සිදු කර විසඳුම් ලබා දීම.

2.5 - ඉදිකිරීම් අංශය

2022 ප්‍රගතිය

- **අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම**

- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2019 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) සහන කාලය දීර්ඝ කිරීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ වර්තමාන සීමාව වැඩි කිරීම සඳහා අනුමැතිය.
- වත්මන් ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කර්මාන්තයේ පැවැත්ම උදෙසා සහනදායී ක්‍රියා මාර්ග අනුගමනය කිරීම.
- රට තුල පවතින වත්මන් ආර්ථික තත්ත්වය යටතේ භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තු සැපයීම සම්බන්ධයෙන් මිල විචලනය පිළිබඳ උපදෙස් ලබා දීම.
- වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය බොරැල්ලේ සිට හොරණ, මිල්ලැව ප්‍රදේශයට රැගෙන යාම සහ වැලිකඩ පරිශ්‍රයේ පිහිටි ඉඩම මිශ්‍ර නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම සඳහා යෝජිත උපදේශක සේවාවන් පිරිනැමීම.
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වෙන්ව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම.
- ගාල්ල පළාත්බද මාර්ග කාපට් ඇතිරීමේ ව්‍යාපෘතියේ සහතික කළ බිල්පත් සඳහා අරමුදල් වෙන්කරන ලෙස ඉල්ලා සිටීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවකයින් සඳහා යෝජිත ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයට සමගාමීව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා අවස්ථාව සලසා දීම.
- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා සෘජු ලෙස කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම.
- ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ (SEC) සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO), 2022 අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා හිඟ වැටුප් සහ 2022 ඔක්තෝම්බර් සිට 2023 මාර්තු දක්වා ගෙවිය යුතු වැටුප් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම.
- ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ප්‍රතිසංවිධානය සඳහා අවශ්‍යවන්නා වූ විධිවිධාන සහ මූල්‍ය සම්පත් සැලසීම.

- **අමාත්‍ය මණ්ඩල සටහන් ඉදිරිපත් කිරීම**

- වත්මන් ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කර්මාන්තයේ පැවැත්ම උදෙසා සහනදායී ක්‍රියා මාර්ග අනුගමනය කිරීම.

- **යොමු ගත අනෙකුත් කාර්ය භාරයන්**

- සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ප්‍රතිසංවිධානය සඳහා අවශ්‍යවන්නා වූ විධිවිධාන සහ මූල්‍ය සම්පත් සැලසීම සම්බන්ධව කටයුතු කිරීම.
- අප අංශයට අනුබද්ධිත ආයතන වෙතින් වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සඳහා ගෙවිය යුතු හිඟ මුදල් පියවීමට අවශ්‍ය පියවර ගැනීම.
- අප අංශයට අනුබද්ධිත ආයතනවලට වෙනත් අංශ වෙතින් ලැබිය යුතු හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- මරදගහමුල්ල වී ගබඩා හා වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු කිරීම වෙළඳ සංකීර්ණයේ වෙළඳ කුටි 115 හි ඉදිකිරීම අවසන් බැවින් අදාල අංශ වෙත පැවරීමේ කටයුතු සඳහා අමාත්‍යාංශ මට්ටමින් මැදිහත් වීම.
- කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දෙව්මැදුරෙහි ඉරිදා දහම් පාසල් ගොඩනැගිල්ලෙහි ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කරගැනීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් කටයුතු කිරීම.
- ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වෙන්ව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම.
- රන්පොකුණුගම යෝජිත අඩු ආදායම්ලාභී තෙමහල් නිවස ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධව කටයුතු කිරීම.
- රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත වෙනත් ආයතන වලින් ලබාගත හැකි ව්‍යාපෘති ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
- වැරැල්ලවත්ත නිවාස යෝජනා ක්‍රමයට අදාල ඉදිකිරීම් කටයුතු කිරීමට අවශ්‍ය සහය අමාත්‍යාංශ මට්ටමින් ලබා දීම.
- ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල අඩු ආදායම්ලාභීන්ට ජීවනෝපාය සංවර්ධනය සඳහා අත්වැලක් සැපයීමේ අරමුණින් කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනයට අදාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කිරීම.
- කොළඹ 10 සංඝරාජ මාවතේ අංක 541 දරණ ස්ථානයේ පිහිටි HDFC බැංකුවට අයත් ඉඩම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීම.

2023 ඉදිරි දැක්ම

- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යන ආයතන සමග මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවා සාකච්ඡා කිරීම.
  ඒ තුලින් සෑම ආයතනයක්ම විධිමත් පරිදි ලාභ ලබන ආයතන ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අමාත්‍යාංශ දායකත්වය ලබා දීම.
- දැනට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතීන් කඩිනමින් නිමකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීම.
- උක්ත ආයතන මඟින් සිදු කරනු කාර්යන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අවශ්‍ය වී නම් ඒ සඳහා කඩිනම් පියවර ගැනීම.
- අප ඉදිකිරීම් අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්ය භාරයන් ආවරණය හා ඉලක්ක පරිදි ඉටුවන ලෙස අංශයට අදාලව සුදුසු පියවරයන් ගැනීම.

2.6 - ඉංජිනේරු සේවා අංශය

2022 ප්‍රගතිය

- **ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**

- නිව්හැම් ස්කෙයර් මහල් නිවාස සංකීර්ණයේ නිවාස 105ක් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ලැබීමට ඇති මුදල් නිදහස් කර ගැනීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- රටෙහි ඇතිවූ ආර්ථිකමය අස්ථාවර තත්වය හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල සිදු වූ ගැටළු සඳහා තාක්ෂණික වශයෙන් අවශ්‍ය නිර්දේශ ලබා දීම.

- **ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම**

- කහතුඩුව නිවස ව්‍යාපෘතිය අදියර II යටතේ යෝජිත දෙමහල් නිවාස 36න් 11ක් වැඩ ආරම්භ කර කටයුතු කරගෙන යන අතර ඉන් එක නිවාසක් ආකෘති නිවසක් ලෙස නිම කර පෙර විකුණුම් කටයුතු වලට යොමු වීම සඳහා උපදෙස් ලබා දීම.

- යෝජිත දෙල්කඳ සුඛෝපභෝගී මහල් නිවාස ව්‍යාපෘතිය සඳහා අභිලාශ කැඳවීමට (RFP) නීතිපති උපදෙස් ද ඇතුළුව සියලු කටයුතු සුදානම් කිරීම.
- Ocean Tower ගොඩනැගිල්ලෙහි අලුත්වැඩියා කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරගැනීමේ ප්‍රසම්පාදන කටයුතු වලට සහය ලබා දීම.

➢ **මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන යන ආයතනය**

- රටෙහි ඇති වූ ආර්ථිකමය තත්වය හේතුවෙන් Sea Breeze සහ Lavanya Heights ව්‍යාපෘතීන්ගේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට මුල්‍යමය වශයෙන් ඇති වූ බාධාව මහහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ පෙර විකුණුම් කටයුතු කඩිනම් කිරීමට හා යාවත්කාලීන කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශය සැකසීම සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීම.

➢ **ස්ථාවර තාක්ෂණික කමිටු කටයුතු**

- 2022 වර්ෂයේ ව්‍යාපෘති 66ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීම.
- එක් කොන්ත්‍රාත් විවලනයක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

➢ **තොරතුරු තාක්ෂණ අංශය**

- මෙම අංශය වෙතට රාජකාරී කටයුතු අනුයුක්ත කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයේ සියලුම පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු අමාත්‍යාංශය තුලදීම කරගැනීමට කටයුතු සැලසීම.

2023 ඉදිරි දැක්ම

➢ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන යන ආයතනයන්හි ඉදිරි ප්‍රගති සමාලෝචනයන්ට සහය වී අවශ්‍ය තාක්ෂණික මඟ පෙන්වීම ලබා දීම. බිඳ වැටී ඇති ඇති ආර්ථිකය ගොඩනැංවීමට අවශ්‍ය රුකුල මෙම ආයතනය සඳහා ලබා දීමට, විදේශ විනිමය ගෙන ඒමට හැකි වන පරිදි ක්‍රියාත්මක වන ව්‍යාපෘති යාවත්කාලීන කිරීමට මඟ පෙන්වීම.

➢ අප ඉංජිනේරු සේවා අංශයට අමාත්‍යාංශය යටතේ පැවරී ඇති සියලු කාර්ය භාරයන් ආවරණය හා ඉලක්ක පරිදි ඉටු වන ලෙස අංශයට අදාලව සුදුසු පරිදි පියවරයන් ගැනීම.

2.7 - මූල්‍ය අංශය

2022 ප්‍රගතිය

2022 වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් සලසා දී ඇති මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වලට අදාළ අක්මුදල් ලබාගෙන එම මුදල් උපරිම කාර්යක්ෂමතාවයකට පත් කිරීම සඳහා ආයතනයන් තුළ නිසිකලට බෙදාහරිමින් වාර්තා පවත්වාගෙන යාම හා මාසික, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නිසි වේලාවට ලබාදීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

2022 වර්ෂය සඳහා රු.මි 3713.12 ක් හා 452.456 පිළිවෙලින් මූලධන හා පුනරාවර්තන වියදම් වශයෙන් අයවැය වාර්තාවෙන් වෙන් කර තිබුණි. එම මූල්‍ය ප්‍රතිපාදන වලින් මූලධන සඳහා රු.මි 2684.19 ක්ද පුනරාවර්තන වියදම් සඳහා රු.මි 416.893 ක්ද වැයකර ඇත.

2023 ඉදිරි දැක්ම

අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වස් ඒ ඒ අංශ සමඟ මනා සම්බන්ධීකරණයන් පවත්වා ගනිමින් අමාත්‍යාංශයට අවශ්‍ය වන සියළුම ද්‍රව්‍ය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව ප්‍රසම්පාදනය කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම මඟින් අමාත්‍යාංශ ඉලක්ක වලට ළඟාවීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම සිදු කෙරේ.

එමෙන්ම මනා මූල්‍ය පාලනයන් පවත්වාගෙන යාම සඳහා නව ක්‍රමවේද හඳුන්වා දීමද මූල්‍ය අංශය මගින් සිදු කෙරේ.

2.8 - අභ්‍යන්තර විගණන අංශය

2022 ප්‍රගතිය

2021 වර්ෂයේ විගණන වාර්තා 04 ක කටයුතු අවසන් කර ඇත. 2022.12.31 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. අනුබද්ධිත ආයතනයන්හි විමර්ශන 11 ක් අවසන් කර ඇති අතර විමර්ශන 05 ක කටයුතු සිදු කරමින් පවතී.

2023 ඉදිරි දැක්ම

2023 වර්ෂයේදී විමර්ශන කටයුතු වැඩි ප්‍රමාණයක් ඉටු කිරීමටත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සඳහා වැඩි ඉඩක් ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් කාර්තුමය වශයෙන් පැවැත්වීමට විගණන වැඩසටහනට ඇතුළත් කර ගෙන ඇත.

2.9 - නැවත පදිංචි කිරීමේ අංශය

2022 ප්‍රගතිය

- **නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2022 වර්ෂයේදී නිවාස 1720 ක් ඉදිකිරීම් අවසන් කිරීමටත් නිවාස 1302 ක් වහල මට්ටම දක්වාද, නිවාස 309 ක් බිත්ති මට්ටම දක්වාද, නිවාස 63 ක් අත්තිවාරම් මට්ටම දක්වාද ඉදිකිරීම් අවසන් කිරීමට හැකිවිය.

- **නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

උතුරු නැගෙනහිර පළාත්හි යාපනය, කිළිනොච්චි, මුලතිව්, මන්නාරම, වවුනියාව, ත්‍රිකුණාමලය, අම්පාර හා මඩකළපුව දිස්ත්‍රික්ක වල නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති යටතේ සනීපාරක්ෂක පහසුකම් වල පානීය ජල ව්‍යාපෘති, කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය ජල ව්‍යාපෘති, ගෘහස්ථ විදුලි සම්බන්ධතා ලබා දීම මෙන්ම ඉඩම් අහිමි නැවත පදිංචි කරනු ලබන පවුල් සඳහා ඉඩම් මිලදී ගැනීම ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කලද රට වසා දැමීම හා අක් මුදල් නොලැබීම මත අතැති බිල්පත් වෙනුවෙන් රු.මි 390.347 ක් හා තවදුරටත් වැඩ නිම කිරීම සඳහා ඉතිරිව තිබූ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා රු.මි 41.80 ක ප්‍රමාණයක් අමාත්‍යාංශයේ වගකීම් ලෙස ඉතිරිව තිබුණි.

ඒ අනුව 2022 වර්ෂය සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන අතරින් රු. මි 150.00 ක මුදල ප්‍රමාණවත් නොවූ බැවින් වෙනත් වැය ශීර්ෂ යටතේ පැවති ප්‍රතිපාදනද මාරු කිරීම තුළින් රු.මි 195.51 වැය කොට යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 298 ක් නිම කරන ලදී.

- **නැනෝ සහ RO තාක්ෂණයෙන් යුත් පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

නැවත පදිංචි කරන ලද පවුල් වෙසෙන ප්‍රදේශයන්හි උග්‍ර පානීය ජල හිඟය වකුගඩු රෝගීන් බහුලව සිටින බව වාර්තා වී ඇති බැවින් හා පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට පවතින දුෂ්කරතා සැළකිල්ලට ගෙන නැනෝ සහ RO තාක්ෂණයෙන් යුත් පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2021 වසර තුළ ආරම්භ කරන ලදී. ඒ අනුව උතුරු හා නැගෙනහිර පළාත්හි මෙම ඒකක 50ක් ඉදිකිරීමට කටයුතු කර ඇත. එම ඒකක 50 න් ඒකක 04 ක් මුලතිව් දිස්ත්‍රික්කයේද, ඒකක 23 ක් කිළිනොච්චි දිස්ත්‍රික්කයේද, ඒකක 23 ක් වවුනියාව දිස්ත්‍රික්කයේද ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත. එම පිරිපහදු ඒකක අතුරින් ඒකක 25 ක් නිම කොට ප්‍රජා මූල සංවිධාන වෙත භාරදීමට කටයුතු සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 19,015 කට පිරිසිදු පානීය ජලය ලබා දීමට නියමිතය.

- **අවතැන්ව නැවත පදිංචි කළ පවුල් සඳහා පෙර නිමි කොන්ක්‍රීට් පැනල් නිවාස ඉදි කිරීම.**

ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන්ව තම මුල් ගම් බිම් වල පදිංචි පවුල් සඳහා පෙර නිමි කොන්ක්‍රීට් පැනල් නිවාස ඒකක 300ක් 2021 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නිවාස ඒකක 150 ක් ද

මඩකළපුව දිස්ත්‍රික්කයේ 100 ක්ද අම්පාර දිස්ත්‍රික්කයේ නිවාස ඒකක 50ක් ලෙසද ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අතරින් ත්‍රිකුණාමලය හා මඩකළපුව දිස්ත්‍රික්කයන්හි නිවාස ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත් මෙම ඉදිකිරීම් වල ප්‍රගතිය යම් ප්‍රමාණයක අඩු අගයක් පසුගිය වසර තුළ පෙන්නුම් කර තිබුණ අතර එකී ඉදිකිරීම් 2022 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන තුළින් රු.මි 38.02 ක ප්‍රමාණයක් වෙන් කොට මේ වන විට වියදම් දරා ඇත. මේ වන විට නිවාස 12 ක් ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.

- **බිම් වෙඩි ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය**

උතුරු හා නැගෙනහිර පළාත් වල තවදුරටත් ශේෂව ඇති බිම් වෙඩි හා පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ ක්‍රියාවලිය නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා මහත් රුකුළක් වන අතර එකී බිම් වෙඩි හා පුපුරා නොගිය අවි කොටස් ඉවත් කිරීමේ ක්‍රියාවලියට අදාළ ව්‍යාපෘති වෙනුවෙන් අමාත්‍යාංශය වෙත 2022 වර්ෂය තුළ රු.මි 20 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

එම ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුධ හමුදා මානුෂීය බිම් වෙඩි ඉවත් කිරීමේ ඒකකයේ අවශ්‍යතා හා වියදම් සඳහා යොදාගන්නා අතර ඊට අමතරව බිම්බෝම්බ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන (MRE) එනම් අවධානම් කළාප වල සිටින පුද්ගලයින් දැනුවත් කොට ඔවුන්ගේ එදිනෙදා ජීවිතය සුරක්ෂිත කර බිම් වෙඩි අනතුරු වළක්වා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. තවද මෙමඟින් බිම්බෝම්බ හා පුපුරා නොගිය අවි කොටස් නිසා සිදුවන මරණ හා තුවාල වීම් සහ එමඟින් වන සමාජ හා ආර්ථික බලපෑම අවම කිරීමට අපේක්ෂිතය.

ඊට අමතරව බිම්වෙඩි හි පුපුරා නොගිය අවි කොටස් මඟින් ආපදාවට ලක් වන වින්දිතයන් සඳහා සහන සැළසීමට හා ඔවුන්ට අවශ්‍ය මානසික සුවය ලබා දීම සඳහා වන වැඩසටහන් පිළිබඳවද අවධානය යොමු කරමින් ඒ සඳහා වන වැඩ සැලසුම් සකස් කොට ක්‍රියාවට නැංවීමද මෙම මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන කාර්යයන් අතරට එක් කර ගැනිය හැක.

බිම්වෙඩි ඉවත් කිරීම 2022 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව සිදු කොට ඇති අතර එහිදී බිම්වෙඩි නිසැක කොට භූමිය නිදහස් කළ හා එහිදී සොයාගත් බිම්වෙඩි හා පුපුරා නොගිය අවි කොටස් පිළිබඳව තොරතුරු පහත වගුව තුළ අන්තර්ගත කොට ඇත.

2022 වර්ෂයේ බිම්වෙඩි ඉවත් කිරීමේ ප්‍රගතිය

බිම්වෙඩි නිසැක කර ඇති සම්පූර්ණ භූමිය)ව.මී(	තවදුරටත් නිසැක කිරීමට ඇති ප්‍රමාණය)ව.මී(	පුද්ගල නාශක බිම් වෙඩි (1)	යුධ ටැංකි නාශක බිම්වෙඩි (2)	කුඩා අවි (3)	පුපුරා නොගිය අවි කොටස් (4)	4+3+2+1 එකතුව
5,166,388	14,568,863	24,008	66	22,446	3,810	50,330

2023 ඉදිරි දැක්ම

අංකය	විස්තරය	2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව (රු.මි.)
නැවත පදිංචි කිරීමේ අංශය		10,133.11
මෙහෙයුම් ක්‍රියාකාරකම්		461.00
	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති	
01	නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ වැඩසටහන (නව ව්‍යාපෘති)	1000.00
02	නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ වැඩසටහන (අතැති බිල්පත්)	390.34
03	නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ වැඩසටහන (අවිච්ඡේද වැඩ)	41.80
04	නැවත පදිංචි කිරීමේ කාර්ය සාධන බලකාය මඟින් දීර්ඝ කාලීන අවතැන්වූවන් සඳහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල (අතැති බිල්පත්)	206.85
05	සුභසාධන මධ්‍යස්ථාන වල සිටින පවුල් සඳහා ඉඩම් මිලදී ගැනීම	88.20
06	බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන	130.00
07	උතුරු හා නැගෙනහිර පළාත්වල සිටින ගැටුම් වලින් අවතැන් වූ පවුල් සඳහා ගඩොල් සහ බදාම ආකාරයේ නිවාස ලබා දීමේ වැඩසටහන * (2023 නව ඉදිකිරීම්)	7,390.40
08	උතුරු හා නැගෙනහිර පළාත්වල සිටින ගැටුම් වලින් අවතැන් වූ පවුල් සඳහා ගඩොල් සහ බදාම ආකාරයේ නිවාස ලබා දීමේ වැඩසටහන (අතැති බිල්පත්)	453.95
09	උතුරු හා නැගෙනහිර පළාත්වල සිටින ගැටුම් වලින් අවතැන් වූ පවුල් සඳහා ගඩොල් සහ බදාම ආකාරයේ නිවාස ලබා දීමේ වැඩසටහන (අවිච්ඡේද වැඩ)	116.03
10	උතුරු හා නැගෙනහිර පළාත්වල සිටින ගැටුම් වලින් අවතැන් වූ පවුල් සඳහා නව තාක්ෂණය යොදා ගත් පිරිමැසුම්දායක කොන්ක්‍රීට් පැනල සහිත ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන	273.18
11	නැවත පදිංචි කිරීමේ කාර්ය සාධන බලකාය මඟින් දීර්ඝ කාලීන අවතැන් වූවන් සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල (අතැති බිල්පත්)	36.36
12	සුභසාධන මධ්‍යස්ථාන වල සිටින පවුල් සඳහා වන වැඩසටහන	6.00
	මුළු ප්‍රතිපාදන	**10,133.11**

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

ඩබ් .එස් .සත්‍යානන්ද
ලේකම්

2023.02. 28

03. පරිච්ඡේදය

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

කරුණාකර පිටු අංක 22 බලන්න.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 23 බලන්න.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 24 බලන්න.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

කරුණාකර පිටු අංක 25 බලන්න.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

කරුණාකර පිටු අංක 26 බලන්න.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

කරුණාකර පිටු අංක 27 බලන්න.

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

කරුණාකර ඇමුණුම් අංක 01 බලන්න

04. පරිච්ඡේදය

4. කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම යටතේ දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකම නව නිවසක් ඉදිකිරීම. • **"ඔබට ගෙයක් රටට හෙටක්"** නව වැඩසටහන - නිවාස 1465 ක වැඩ ආරම්භ කර 19ක වැඩ අවසන් කර ඇත. • **"ඔබට ගෙයක් රටට හෙටක්" අවිච්ඡේද වැඩසටහන** - නිවාස 8153 න් 4078ක වැඩ අවසන් කර ඇත. • **"මිහිඳු නිවහන වැඩසටහන" -** නව නිවාස 77ක වැඩ ආරම්භ කර 08ක වැඩ අවසන් කර ඇත. • **"මිහිඳු නිවහන වැඩසටහන" අවිච්ඡේද වැඩසටහන** - නිවාස 557කි න් 208ක වැඩ අවසන් කර ඇත.			✓ ✓ ✓ ✓
අර්ධ වශයෙන් නිම කල නිවාස සඳහා ණය ආධාර ලබා දීම. රු.මි 299 ක ඉලක්කයක් යටතේ රු.මි. 258 ක් දක්වා ලගා වී ඇත.		✓	
උතුරු නැගෙනහිර ප්‍රදේශ වල අවතැන් වූවන් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන නිවාස 3324 ක වැඩ ආරම්භ කර 1720ක වැඩ අවසන් කර ඇත.		✓	
උතුරු නැගෙනහිර සටන් පැවති ප්‍රදේශ වල පුපුරන ද්‍රව්‍ය ඉවත් කර භූමිය නිදහස් කර ගැනීම. ව.කි.මී. 8.50කින් ව.කි.මී 5.16ක් නිසැක කර ඇත.(නව සමීක්ෂණය අනුව ව.කි. 11.21ක් අලුතින් හඳුනා ගෙන ඇත.)			✓

සැ.යු :- අමාත්‍යාංශයට අනුබද්ධිත සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත දර්ශක ඒ ඒ ආයතනය විසින් වෙන වෙනම ඉදිරිපත් කරන කාර්ය සාධන වාර්තා වල ඉදිරිපත් කර ඇත.

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% -74%	75%-100%
• රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව විධිවිධාන යටතේ ඉදිකරන ලද නිවාස සංකීර්ණවල ගැනුම්කරුගේ ආදායම මත පදනම් වූ පහසු ගෙවීමේ ක්‍රමය මත අවශ්‍යතා ඇති අයට නිවාස ලබා දීම.	පළාත් 09 තුළ නිවාස සංකීර්ණ 09ක් ඉදිකිරීම.	බස්නාහිර හා සබරගමු පළාත් 02හි නිවාස සංකීර්ණ 02ක් ආරම්භ කර ඇත.	✓ *		
• දිගු කාලීන පහසු ගෙවීම් සැලසුම් මත නාගරික ප්‍රදේශයකින් නිවසක් මිලදී ගැනීමට තරුණ යුවළකට හැකි වන පරිදි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ විශේෂ නිවාස ව්‍යාපෘති දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.	දිවයිනේ සෑම මැතිවරණ කොට්ඨාසයකම එක් නිවාස ව්‍යාපෘතියක් ලෙස නිවාස සංකීර්ණ 160ක් ඉදිකිරීම.	දිවුලපිටිය මැතිවරණ කොට්ඨාසයේ රණ්පොකුණුගම සහ අනුරාධපුර දහයියාගම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.	✓ *		

*** 03/2022 චක්‍ර ලේඛය මත ඉදිකිරීම් තාවකාලිකව අතරමග නතර කර ඇත.**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණය හා අභියෝග සැකෙවින්

තිරසර සංවර්ධන ජාතික සභාවේ උපදෙස් හා මගපෙන්වීම අනුව අමාත්‍යාංශ විෂය පථයට අදාලව තිරසර සංවර්ධන සැලැස්ම 2022 වසර තුල සකස් කර ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැනිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව		පවතින සේවක සංඛ්‍යාව		සේවක සංඛ්‍යා හිඟය/අතිරික්ත	
	නිවාස ඉදිකිරීම් අංශය	නැවත පදිංචි කිරීමේ අංශය	නිවාස ඉදිකිරීම් අංශය	නැවත පදිංචි කිරීමේ අංශය	නිවාස ඉදිකිරීම් අංශය	නැවත පදිංචි කිරීමේ අංශය
ජ්‍යෙෂ්ඨ	35	19	21	9	14	10
තෘතීයික	06	5	02	01	04	04
ද්විතියික	106	96	90	91	16	05
ප්‍රාථමික	52	27	29	18	23	09

6.2 මෙම අමාත්‍යාංශයේ දීප ව්‍යාප්ත සේවාවල ඇතැම් තනතුරු පුරප්පාඩු පැවති අතර ඒ සඳහා පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමට සහ වැඩ බැලීමට නිලධාරීන් පත් කර තිබූ අතර එම තනතුරු ස්ථාවරව පිරවීමේ අවශ්‍යතාවය රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව නිවාස ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය ඇතුළුව පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව මෙසේ ඉදිරිපත් කරමි.

දීප ව්‍යාප්ත සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටම
නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

සේවය	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2022.01.01-2022.12.31) දිනට
ලේකම්	01
අතිරේක ලේකම් (ශ්‍රී .ලං.පරිපාලන සේවය)	01
අතිරේක ලේකම් (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය)	02
අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය)	01
ජාතික නිවාස කොමසාරිස්	01
අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.සැලසුම් සේවය)	02
අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.පරිපාලන සේවය)	01
අධ්‍යක්ෂ (ශ්‍රී .ලං.ඉංජිනේරු සේවය)	01
අභ්‍යන්තර විගණක (ශ්‍රී .ලං.ගණකාධිකාරී සේවය)	01
ගණකාධිකාරී (ශ්‍රී .ලං.ගණකාධිකාරී සේවය)	01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ශ්‍රී .ලං.පරිපාලන සේවය)	01
ජ්‍යෙෂ්ඨ නැවත පදිංචි කිරීමේ පහසුකම් සපයන්නා	01

තෘතීයික මට්ටම
නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

සේවය	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2022.01.01-2022.12.31) දිනට
පරිපාලන නිලධාරී (කළ. සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය)	01
භාෂා පරිවර්තන සේවය	03
තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සේවය	01
සංඛ්‍යා ලේඛන නිලධාරී	02

ද්විතීයික මට්ටම

නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

සේවය	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2022.01.01-2022.12.31) දිනට
සංවර්ධන නිලධාරී සේවය	02
තාක්ෂණ නිලධාරී සේවය	03
කළමනාකරණ සහකාර සේවය	15
ප්‍රමාණ සමීක්ෂක නිලධාරී	01
ලිපිකරු (නැවත පදිංචි කිරීමේ අංශය)	01

ප්‍රාථමික මට්ටම

නිවාස හා ඉදිකිරීම් අංශය හා නැවත පදිංචි කිරීමේ අංශය

සේවය	පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව (2022.01.01-2022.12.31) දිනට
කාර්යාල සේවක සේවය	18
රියදුරු සේවය	14

6.3 මානව සම්පත් සංවර්ධනය

නිවාස හා ඉදිකිරීම් අංශය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය රු.	විදේශීය		
Seminar on Solutions to Urban Environmental Sanitation Treatment system. (online)	01	02 to 22 November 2022	-	-	විදේශීය	
දැනුම කළමනාකරණය පුහුණුව	05	දින 1	15,000	-	දේශීය	දැනුම කළමනාකරණය කර ගනිමින් රාජකාරි ඉටු කළ යුතු ආකාරය.
ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	03	දින 2	.21,000	-	දේශීය	ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම ලබා දීම.
රියදුරු පුහුණුව (බහුකාර්ය)	05	පැය 2	-	-	දේශීය	රියදුරන් වශයෙන් බඳවා ගත් බහුකාර්ය සේවකයන් සඳහා මූලික පුහුණුවක් ලබා දීම.
ලංසු කැඳවීමේ ලේඛන පිළියෙළ කිරීම	01	දින 2	7,000	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු කැඳවීමේ ලේඛන පිළියෙළ කිරීම පිළිබඳ පුහුණුව.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	01	දින 2	8,500	-	දේශීය	භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිලිබඳ දැනුම ලබාදීම.
ලිපිගොණුකරණය	01	දින 2	7,000	-	දේශීය	ලිපිගොණු සකස් කිරීම පිලිබඳ දැනුම ලබා දීම.

Diploma in Professional English	01	පැය 240	80,000	-	දේශීය	රාජකාරී කිරීමට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දීම.
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	දින 2	7,500	-	දේශීය	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව.
e-procurement seminar	01	දින 1	7,750	-	දේශීය	
නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය	01	දින 2	7,500	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ට හිමි නිවාඩු පිළිබඳ දැනුවත් කිරීම.
අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම	01	දින 2	8,500	-	දේශීය	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීමට අදාල පුහුණුව ලබා දීම.
Transport Management	01	දින 2	7,500	-	දේශීය	වාහන කළමනාකරණය පිළිබඳ දැනුම ලබා දීම.
දෙමළ භාෂා පුහුණුව	01	පැය 200	15,000	-	දේශීය	දෙමළ භාෂාව ලිවීම, කියවීම, කථාකිරීම පිළිබඳ පුහුණුව.
පෞද්ගලික ලිපිගොණුවක් පවත්වාගෙන යාම	01	දින 2	7,500	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොණු සකස් කිරීම හා පවත්වාගෙන යාම පිලිබඳ පුහුණුව ලබා දීම.
දෙමළ භාෂා පුහුණුව	33	පැය 150	රු.56,250/=	-	දේශීය	දෙමළ භාෂාව ලිවීම, කියවීම, කථාකිරීම පිළිබඳ පුහුණුව.
අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම	27	පැය 2	-	-	දේශීය	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීමට අදාල පුහුණුව ලබා දීම.
නවක සංවර්ධන නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව	20	පැය 6	-	-	දේශීය	
රියදුරන් සඳහා න්‍යායික පුහුණුව ලබා දීම	22	පැය 6	2400	-	දේශීය	මාර්ග සංඥා හා මාර්ගනීති, විනය, ආචාරධර්ම හා රියදුරන් සිදු කරන වැරදි සඳහා අයකරන දඩ මුදල් සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය	03	දින 2	22,500	-	දේශීය	භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.
දෙමළ භාෂා පුහුණුව	20	පැය 150	-	-	දේශීය	දෙමළ භාෂාව ලිවීම, කියවීම, කථාකිරීම පිළිබඳ පුහුණුව.

නැවත පදිංචි කිරීමේ අංශය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	01	මාස . 01	රු8,500/=	-	දේශීය	සාර්ථකව සම්පූර්ණ කර ඇත.

අයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා ඔවුන්ගේ රාජකාරි විෂය පථයට අදාලව පුහුණු ලබා දීම මගින් නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වැඩි දියුණු වීම නිසා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් මහජනතාවට ලබා දීමට හැකියාව ලැබේ.

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව

#	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම්**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	යාවත්කාලීන කරමින් පවතී	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරී පාලනය යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම	අනුකූල නොවේ	අදාළ කාලවකවානු තුළ අවසන් කිරීම ප්‍රායෝගික හේතු මත ප්‍රමාද වීම.	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම (නිවාස සහ ඉදිකිරිම් අංශය) වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම (නැවත පදිංචි කිරීමේ අංශය)	අනුකූල වේ අනුකූල නොවේ	ගර්හිත වාහන නැත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත අධ්‍යයන කටයුතු සඳහා මෙම වාහන භාරදීමට අදාල කටයුතු සිදු කරමින් ඇත.	කඩිනමින් අපහරණ කටයුතු අවසන් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම (නිවාස සහ ඉදිකිරීම් අංශය) 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම (නැවත පදිංචි කිරීමේ අංශය)	අනුකූල වේ (පවත්නා ඉන්ධන මිල ගණන් හා ඉන්ධන හිඟය හේතුවෙන් 2022 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නැත) අනුකූල වේ (පවත්නා ඉන්ධන මිල ගණන් හා ඉන්ධන හිඟය හේතුවෙන් 2022 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නැත)		QR කේත හරහා ඉන්ධන ලබාගැනීම ආරම්භ වීමෙන් පසු ඉන්ධන පරීක්ෂාව නැවත සිදු කර නැත. 2023 වර්ෂය සඳහා ඉන්ධන පරීක්ෂාව කිරීම.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදී වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූලවීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදයට අනුව පුරවැසියන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර ඇත.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම්කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

3. වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන අංශය

03. වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන අංශය

(පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)

පිටු අංක

01 පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය..... 116 - 119

1.1. හැඳින්වීම.....
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු.....
1.3. ප්‍රධාන කාර්යයන්.....
1.4. සංවිධාන සටහන.....
1.5. වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන අංශය යටතේ පවතින ආයතන..

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... 120 - 132

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග ඉදිරි ඉලක්ක .....
2.1.1 විශේෂ ජයග්‍රහණ
2.1.2 අභියෝග
2.1.3 ඉදිරි ඉලක්ක
2.1.4 ව්‍යාපෘතිවල ප්‍රගතිය
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

03. පරිච්ඡේදය

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... 133 - 134

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.....
3.3 ප්‍රවාහන මුදල් ප්‍රකාශනය.....
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්.....
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.....
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.....
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව .....

04. පරිච්ඡේදය

4. කාර්ය සාධන දර්ශක ළඟා කර ගැනීමේ ප්‍රගතිය - 2022..... 135 - 136

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්යසාධනය..... 137 - 140

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු.....

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ..... 141 - 146

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2022.12.31 දිනට) ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාරය.....

6.3 මානව සම්පත් කළමනාකරණය.....

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව..... 147 - 154

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ හා ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම හා පහත්බිම් ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ජාතික මට්ටමේ තීරණ ගැනීම හා අදාළ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා 2021.07.07 දිනැති අංක 2235/45 දරන ගැසට් පත්‍රයට අනුව වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. ඒ අනුව මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2022.04.27 දින දක්වා ක්‍රියාත්මක වූ අතර 2022.04.28 දිනැති අංක 2277/53 දරන ගැසට් පත්‍රයට අනුව වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය. වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය 2022.05.26 දින දක්වා ක්‍රියාත්මක වූ අතර 2022.05.27 දිනැති අංක 2281/41 දරන ගැසට් පත්‍රයට අනුව මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අයත් විෂය පථය, ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත පවරන ලදී.

කෙසේ වුවද 2022 වර්ෂයේ පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ (දැනට අංශයක් ලෙස ක්‍රියාත්මකවන) වැය විෂය අනුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතන තුනෙහි ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස වෙන් වූ රු.මි.1523.34න් 92.4 %ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කරමින් සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම හා පහත්බිම් ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා විශේෂ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදය හා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම හා පහත්බිම් ක්ෂේත්‍රයේ පමණක් නොව සමස්ථ ක්ෂේත්‍රයේම අරමුණු කරගත් ඉලක්ක වෙත ළඟා වීමේ බාධා ඇති වුවද, එය අවම මට්ටමක් දක්වා කළමනාකරණය කිරීමට උපරිම උත්සාහයක් දරන ලද වසරක් ලෙස 2022 වර්ෂය හඳුන්වා දිය හැක.

කෙසේ වුවද මෙම සියළුම බාධක හමුවේ සමුද්‍රීය සම්පත් ආරක්ෂා කිරීම හා පහත්බිම් ක්ෂේත්‍රයට අයත් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය හා සහභාගීත්වය බෙහෙවින් ඉවහල් කර ගනිමින් මෙම අමාත්‍යාංශය 2022 වර්ෂයේදී අත්කර ගත් කාර්යසාධනය පිළිබඳව සංක්ෂිප්තයක් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

1.2 පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වෙරළ, සාගර සම්පත් සංරක්ෂණය සහ පහත්බිම් සංවර්ධනය කිරීම සඳහා කලාපයේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම

මෙහෙවර

පරිසර හිතකාමී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් තිරසර අනාගතයකට සහ ජීවන තත්ත්වය උසස් කිරීමට කැපවී කටයුතු කිරීම

අරමුණු

- පරිසර හිතකාමී සංවර්ධන ව්‍යාපෘති මගින් වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.
- වෙරළ උද්‍යාන වැනි අලංකරණ පද්ධති එක් කිරීමෙන් වෙරළ තීරය සංවර්ධනය කිරීම හා කළමනාකරණය මගින් ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම.
- වෙරළ සම්පත් උපයෝගි කොට ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- වෙරළබඩ ප්‍රජාවෙගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම හා සමාජ, ආර්ථික තත්ත්ව ඉහළ නැංවීම.
- වෙරළබඩ වැසියන්ට ආපදා හේතුවෙන් සිදුවන බලපෑම අවම කිරීම.
- පහත්බිම් ප්‍රදේශ වාණිජමය මට්ටමෙන් ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු ලෙස සකස් කිරීම මඟින් රටේ ආර්ථිකය ඉහළ නැංවීම.
- ඇළ මාර්ග තුළ අපද්‍රව්‍ය එකතුවීම වැළැක්වීම, නිසි ලෙස සකස් කිරීම, වැඩි දියුණු කිරීම හා පාලනය කිරීම මඟින් ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්ව දියුණු කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- සමුද්‍ර ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් හදුන්වා දීම.
- සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මුහුදු තීරයට සහ මුහුදු පතුලට සිදුවි ඇති හානිය වළක්වා ගැනීම සඳහා සමුදුරු පවිත්‍රතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ගංවතුරෙන් තොර වාසස්ථාන ඇතිකිරීම හා පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරගත් පහත්බිම් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

1.4 සංවිධාන සටහන

පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය



1.5 පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

01. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

➢ පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ යටතේ පවතින ආයතන

01. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
02. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1.1 විශේෂ ජයග්‍රහණ

	දෙපාර්තමේන්තු/ ආයතන	විශේෂ ජයග්‍රහණ
01	**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**	❖ 2022 වර්ෂයේ ඇති වූ ඉන්ධන අර්බුදය සහ ආර්ථික ගැටළු හමුවේ ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ මීටර් 3430ක් වෙරළ බාදනයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදි කිරීම වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 45ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කිරීම.
02	**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**	❖ අධිකාරියේ වාර්ෂික ආදායම රු.මිලියන 146.4 දක්වා වැඩිකර ගැනීමට හැකිවීම. ❖ ප්‍රාග්ධන වියදම් සඳහා පුද්ගලික අංශයෙන් රු මිලියන 9.86 අනුග්‍රහක දායකත්වයක් ලබා ගැනිමට හැකිවීම. ❖ ඩම්පින් බලපත්‍ර නිකුත් කිරීම මගින් රු මිලියන 70 ක වාර්තාගත ආදායමක් ලබාගැනිම. ❖ ලෝක ආහාර සංවිධානයයෙන් (WFP) රු මිලියන 4 ක ප්‍රදානයක් ලබා ගැනිම, එමගින් ප්‍රාදේශීය මට්ටමේ ධාරිතා ප්‍රවර්ධනය කිරීම, හා ජාතික තෙල් හා රසායනික විසිරීමේ දී ක්‍රියාත්මක හදිසි සැලැස්ම ක්‍රියාත්මක (NOSCOP) අදාල දිස්ත්‍රික්ක දැනුම්වත් කිරීමේ වැඩසටහන් මන්නාරම, ගාල්ල, මඩකලපුව, මාතර හා කළුතර පැවැත්වීම. ❖ MV X-PRESS HOOGLY නෞකාවෙන් 2022.07.02 වන දින බංකර් තෙල් විසිරීම පාලනය හා අපරාද වගකිම යටතේ රු. මිලියන 15ක් ලබාගැනිම ❖ MT New Diomaon නෞකා අනතුරේ සිවිල් වගකීම වෙනුවෙන් පවරන නඩුව, අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ 2022.09.02 වන දින නීතිපති දෙපාර්තමේන්තුව හරහා කොලඹ අද්මිරල්ටි මහාධිකරණයේ දී ගොනු කරන ලදී. ❖ Commonwealth Litter වැඩසටහන ප්‍රදානයක් වශයෙන් ලැබුණු ක්ෂුද්‍ර ප්ලාස්ටික් විද්‍යාගාර විවෘත කිරීම. ❖ මාතර දිස්ත්‍රික්කයේ කොරල්පර වර්ග මීටර් 200ක් ප්‍රතිස්ථාපනය කිරීම හා තලවිල හා මුලතිව් මඩකලපුව පුද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් කොරල්පර ප්‍රතිස්ථාපනය සිදුකිරීම. ❖ යාපනය, මන්නාරම, පුත්තලම, කිලිනොච්චි, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි කඩොලාන අක්කර 8.2 ක් ප්‍රතිස්ථාපනය කිරීම. ❖ අනුග්‍රහකයන්ගෙන් ලබාගත් ප්‍රතිපාදන යොදාගනිමින් දෙනිකව වෙරළ තීරයන් කිලෝමීටර් 91 පමණ පවිත්‍රව තබාගැනීම. ❖ “සයුර රකින රැල්ල” වැඩසටහන, ජගත් සාගර දිනය හා අන්තර් ජාතික වෙරල පිරිසිදු කිරීමේ දිනයට සමගාමීව අනුග්‍රහකයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන හා ද්‍රව්‍යමය ආධාර යොදාගනිමින් වෙරල පිරිසිදු කිරීම් ,දිය යට පිරිසිදු කිරීම හා ධිවර වරාය පිරිසිදු කිරීමේ වැඩසටහන් 268 පැවැත්වීම. ❖ අනුග්‍රහකයන්ගෙන් මගින් කළුතර-ආබෑ ඇල, ගාල්ල සමනල පාලම අසල හා ගාල්ල -මාවකඩ ඇල කසල පෙරහන සවිකිරීම

		❖ MV X-Press Pearl නෞකාව අනතුර අදාලව අබණ්ඩව දින 465වෙරළ පිරිසිදු කිරීම (මිනිස් දින 103,532, අපද්‍රව්‍ය 1,725 Mt එකතුකිරීම) , විශේෂඥ කමිටුව මගින් පාරිසරික හානි තක්සේරු දෙවන අතුරු වාර්තාවක් සැකසිම.මුහුදු පත්ලේ පවතින අපද්‍රව්‍ය , කන්ටේනර් බහාලුම් හා හානි වූ නෞකාව ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම.
03	**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**	2022 වර්ෂය තුලදී පහත දැක්වෙන සේවායෝජක ව්‍යාපෘති සාර්ථකව නිමකර තිබේ. 1. යෝජිත අම්බලන්ගොඩ ඇවිදින මංතීරුව ඉදිකිරීම 2. මොණරාගල, නෙළුම්වැව නගර සංවර්ධන හා අලංකරණ කටයුතු සිදුකිරීම 3. යක්කල දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ඇවිදීමේ මාර්ගය ඉදිකිරීම 4. ගම්පහ, හෙනරත්ගොඩ ඇවිදීමේ මාර්ගය ඉදිකිරීම 5. බලපිටිය, කිරිල්ල-ඇළ ඇවිදීමේ මාර්ගය සංවර්ධනය කිරීම 6. නුවරඑළිය, ග්‍රෙගරි වැවේ ඇවිදීමේ මාර්ගය සංවර්ධනය කිරීම 7. බෙලිඅත්ත, අම්පිටිය වැව අවට ඇවිදීමේ මංතීරුව ඉදිකිරීම 8. මොරගොඩ ඇලේ ඇවිදීමේ මාර්ගය සංවර්ධනය කිරීම 9. නෙළුම්විල, මා(ර්)කේවිට යෝජිත ඇවිදින මංතීරුව ඉදිකිරීම – අදියර I 10. නෙළුම්විල, මා(ර්)කේවිට යෝජිත ඇවිදින මංතීරුව ඉදිකිරීම – අදියර II 11. පේරලන්ද තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය අදියර II 12. කොටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය අදියර II

2.1.2 අභියෝග

දෙපාර්තමේන්තු/ ආයතන		අභියෝග
01.	**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**	• රටේ පැවති ඉන්ධන හිහතාවය සහ ඉන්ධන මිල ඉහළයාම හේතුවෙන් වෙරළ ආරක්ෂක ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන ලෝඩර් සහ එස්කැවේටර් යන්ත්‍ර ලබා දෙන සැපයුම්කරුවන් ඒවා ලබාදීමට මැලිකමක් දැක්විය. විශේෂයෙන් ටෙන්ඩර් සඳහා දීප ව්‍යාජ්ත ප්‍රචාරයක් ලබා දුන්නද ඇතැම් විට සැපයුම් යන්ත්‍ර සඳහා සැපයුම්කරුවන්ගෙන් ප්‍රතිචාරයක් නොලැබුණු අතර ප්‍රධාන වශයෙන් ලුණු සහිත පරිසරය සැපයුම්කරුවන් යන්ත්‍ර සැපයීමට මැලිකමක් දැක්විය.එසේම QR කේතය මගින් පෞද්ගලික යන්ත්‍ර සැපයුම් කරුවන් ඉන්ධන ලබා ගැනිමේදි ඉන්ධන සිමිත ප්‍රමාණයක් ලැබීම හේතුවෙන් ගැටළු ඇති විය. • හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු සහ සැලසුම්ගත වැඩ සඳහා අවශ්‍ය භූ සළු අත්‍යවශ්‍ය ඉදිකිරීම් අමුද්‍රව්‍ය වලින් එකක් වන අතර ඒවා සැම විටම ආනයනය කිරීමට සිදු වේ. එබැවින් රටේ පවතින ඩොලර් ගැටළුව හේතුවෙන් සැපයුම් කරුවන්ට LC විවෘත කර ගැනිමට නොහැකිවීම සහ නියමිත වේලාවට ද්‍රව්‍ය සැපයීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. මෙය විශේෂයෙන් හදිසි ආරක්ෂණ කටයුතු වලදී ගැටළු ඇති කරයි. • වෙඩිබෙහෙත් හිහතාවය සහ ඒවායේ මිල ඉහල යාම හේතුවෙන් කළුගල් සපයා ගැනිමේ දුෂ්කරතා • මානව සම්පත් හිහතාව (ඉංජිනේරුවරුන්, සහකාර අධ්‍යක්ෂකවරුන්, ජල විද්‍යා මිනින්දෝරු, තාක්ෂණ නිලධාරීන් සහ පුහුණු සහ නුපුහුණු සේවක මහතුන්ගේ හිහතාව)
02.	**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**	• කාර්යය මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු (උදා:ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලයේ තනතුරු 21න් 10ක්ම පුරප්පාඩුව පැවතීම) • පනත සංශෝධනයට පවතින බාධා

	• MV X-Press පර්ල් සම්බන්ධ ගැටළු, ○ වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම. ○ හානි තක්සේරුව සම්බන්ධ විශේෂඥ කමිටුවේ වියදම් - කැබිනට් අනුමැතිය ලබා ගැනීම. ○ විදේශීය රසායනාගාර වෙත සාම්පල යැවීම. • ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා පළමු කාර්තුව සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා නොදීම. • වෙරළබඩ රෝහල් මගින් සායනික අපජලය වෙරළබඩ ප්‍රදේශවලට නුසුදුසු ලෙස බැහැර කිරීම. (ත්‍රිකුණාමලය රෝහල, යාපනය ශික්ෂණ රෝහල, මාතර මහ රෝහල, තංගල්ල මහ රෝහල) • සමුද්‍රීය ආපදා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අනෙකුත් ආයතනවල සහාය ලබා ගැනීම. • කොළඹ මහනගර සභාව විසින් දිගු දුර නල හරහා පිරිපහදු නොකළ අපද්‍රව්‍ය සහ අපජලය බැහැර කිරීම. • වෙරළබඩ කලාපය - වෙරළබඩ පළාත් පාලන ආයතනවල නිසි අපද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් නොමැති වීම. • ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන පරිසර දූෂණය නිසි ලෙස පාලනය නොකිරීම. (ධීවර වරායන්, නැංගුරම් ලෑම, කුඩා යාත්‍රා, කරවල සහ ටින් කිරීමේ කර්මාන්ත ආශ්‍රිතව)
03. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	❖ **මූල්‍යමය අභියෝග :** 2022 වර්ෂය මුලදී වෙන් වූ ප්‍රතිපාදන වර්ෂය මැද වන විට අඩු කිරීම හේතුවෙන් වාර්ෂිකව සිදුවන ව්‍යාපෘති ස්ථිර ක්‍රියාකාරී සැලැස්මකට ක්‍රියාත්මක කිරීමට පහසුකම් නොලැබිණි. ❖ **වෙනත් අභියෝග - ඉඩම් පවරා ගැනීමේදී ඇතිවන ගැටළු :** 1. ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බදු වශයෙන් ලබා දීමේදී ඉඩම් තක්සේරු කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම. 2. අනවසර ඉදිකිරීම් සඳහා පළාත් පාලන ආයතන විසින් වරිපනම් අංක ලබාදීමත්, ජලය හා විදුලිය ලබාදීමත් හේතුවෙන් මෙම අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම ගැටළුවක් වීම. - එබැවින් අනවසර ඉදිකිරීම් සඳහා ජලය සහ විදුලිය ලබානොදීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. 3. ඉඩම් අත්කරගැනීමේදී ඉඩම් හිමිකරුවන් වෙත ලැබෙන වන්දි මුදල ඉතා අඩු මට්ටමක පවතින බැවින් මහජනතාවගේ විරෝධතාව හා අධිකරණ ක්‍රියාදාමයන් සඳහා යොමුවීමේ වැඩි ප්‍රවනතාවයක් පැවතීම - අදාල කාර්යයන්ට අදාල ආයතන සියල්ලන්ගෙන්ම සමන්විත නිළධාරින්ගෙන් සමන්විත කමිටුවක් හරහා තීරණ ගැනීමට යෝජනා කිරීම. (දැනට මාර්ග සංවර්ධනය සඳහා යොදා ගැනෙන (LARC) ලාර්ක් (SUPER LARC) සුපර් ලාර්ක් ක්‍රමවේදය වැනි ක්‍රමවේදයක්) 4. තෙත්බිම් හා ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීමේ කටයුතුවලදී ප්‍රාදේශීය ලේකම්වරුන් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී සිදුවන ප්‍රමාදයන් 5. ඉඩම් අත්කරගැනීමේ කටයුතු වලදී ඉඩම් අමාත්‍යාංශයේ සාමුහික ප්‍රතිපාදන වලින් (මූ.රෙ.53 යටතේ) වන්දි ගෙවනු ලබන අවස්ථා වලදී මුදල් අමාත්‍යාංශයේ නිර්දේශය ලබාදීමේ ඇති ප්‍රමාදයන් (කොළොන්නාව ව්‍යාපෘතිය සඳහා නිර්දේශය ඉල්ලා මේ වන විට වසරකට අධික කාලයක් ගතවී ඇත)

2.1.3 ඉදිරි ඉලක්ක

	දෙපාර්තමේන්තු/ ආයතන	ඉදිරි ඉලක්ක
01	**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**	• දෙපාර්තමේන්තුවට ආදායමක් උපයන පරිදි රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) ශ්‍රී ලංකාවේ වෙරළ තීරය තුල සංචාරක විභව ස්ථාන සංවර්ධනය කිරීම.
02	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය	• අපද්‍රව්‍යය ප්‍රතිග්‍රහණ සේවා සැපයීමට රෙගුලාසි සංශෝධනය කිරීම සහ ආදායම ඩොලර්වලින් ලබා ගැනීම. • ශ්‍රී ලංකාවේ සිදු වන තෙල් විසිරීම් පිළිබඳ චන්ද්‍රිකා පාදක කර සිදු කරන නිරීක්ෂණ සේවය පිළිබඳ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. (විදෙශීය අරමුදල් ව්‍යාපෘති (FFP)-601, 810.00 €) • ගෝලීය ව්‍යාපෘතිවල ප්‍රතිඵල අනුවර්තනය සහ ක්‍රියාවේ යෙදවීම. (GloFouling, GloLitter, Green Voyage) • තෙල් සහ රසායන ද්‍රව්‍ය විසිරීම පිළිබඳ ජාතික සුහුණු වැඩමුළුවක් පැවැත්වීම (SPILLEX) සහ දිස්ත්‍රික්ක මට්ටමින් NOSCOP පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 06ක් පැවැත්වීම. • MV Xpress Pearl නෞකා අනතුරු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන පාරිසරික වාර්තා සැකසීමට අවශය සහය නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දීම. • වැල්ලවත්ත, මුත්වාල් සහ කොග්ගල යන දිගු දුර නල ආශ්‍රිතව ජල තත්ත්ව නිරීක්ෂණ කටයුතු කිරීම. • ක්ෂුද්‍ර ප්ලාස්ටික් ව්‍යාපෘතිය - දිස්ත්‍රික්ක 14හි ක්ෂුද්‍ර ප්ලස්ටික් සමීක්ෂණ කටයුතු කිරීම, ජාතික සුන්බුන් ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය සකස් කිරීම. • වෙරළ රැකබලා ගන්නන් පුද්ගලික ආයතනවල දායකත්වයෙන් දැඩි ලෙස දූෂණයට ලක් වූ වෙරළ ප්‍රදේශ සඳහා සේවයේ යෙදවීම. • සමුද්‍රීය පරිසර පද්ධති තක්සේරුව (ESI ව්‍යාපෘතිය) - ගොවියපන සිට වෙරුගල් දක්වා සිතියම්ගත කිරීම. • කොරල් -600 m2 ප්‍රතිස්ථාපනය කිරීම හා කඩොලාන අක්කර 7 ක් ප්‍රතිස්ථාපනය කිරීම • පනත සංශෝධනය සහ රෙගුලාසි සකස් කිරීම. • MEPA අභ්‍යාස ආයතනය - සුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම
03	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	1. දැනට වැඩ කටයුතු ආරම්භ කර ඇති වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින්හි හැකි ඉක්මනින් වැඩ අවසන් කර එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම. • වේරස්ගහ ව්‍යාපෘතිය • ඔලියමුල්ල ව්‍යාපෘතිය • කොලොන්නාව ව්‍යාපෘතිය 2. දැනට සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකරමින් පවතින වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින්හි අදාළ සැලසුම් හා නිර්මාණ හැකි ඉක්මනින් වැඩ අවසන් කර ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම. • මාදිවෙල දකුණු හැරවුම් ව්‍යාපෘතිය • මුදුන් ඇල ව්‍යාපෘතිය • රත්මලාන - මොරටුව ව්‍යාපෘතිය • පිළියන්දල ව්‍යාපෘතිය 3. දැනට නිර්මාණ කටයුතු සිදුකරන කැළනි ගඟ ආශ්‍රිත කළු පාලම අසල යෝජිත පොම්පාගාරයෙහි නිර්මාණ කටයුතු අවසන් කිරීම.

		4. 2021 වර්ෂය තුලදී වැඩ කටයුතු අවසන් කර ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙහි නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් පවත්වාගෙන යෑම. මේ වන විට එම පොම්පාගාර සියල්ලටම සංස්ථා කාර්‍ය මණ්ඩල යොදවා තිබේ. පසුගිය දින වලදී ඇතිවූ අධික වර්ෂාපතන තත්වයේදී එකී පොම්පාගාර ක්‍රියාත්මක කරවා ගංවතුර ආපදා තත්වයන් ඇති නොවීමට කටයුතු කර ඇත. 5. රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) මඟින් මුහුදු වැලි කැනීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. මේ වන විට මේ සඳහා පහත ක්‍රියාමාර්ග ලබා ගෙන තිබේ. • වැලි කැණීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගේ දෛනික ජීවනෝපාය කටයුතු සඳහා බලපෑමක් ඇති වේ. මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇත. • ඒ අනුව ප්‍රදේශයේ ධීවර වරායන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදනයක් පිළිබඳව එකී දෙපාර්තමේන්තුව ඉල්ලීමක් සිදු කර තිබේ. • මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ මුළු මාලාවක් සංවිධානය කෙරිණි. එහි පළමු පියවර ලෙස වැලි කැනීම් ව්‍යාපෘතිය හා සම්බන්ධ වන රජයේ ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව 2022.12.28 දින පැවැත්වුනි.ඒ සඳහා රජයේ නිලධාරීන් 120 ක පමණ ප්‍රමාණයක් සහභාගී විය. ඊලඟ පියවර ලෙස අදාළ ප්‍රදේශයෙහි ආගමික නායකයින් දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2023 ජනවාරි මස තුන්වන සතියේදී සිදු කිරීමට සැලසුම් කර ඇත. ඉන් අනතුරුව ධීවර ජනතාව හමුවීමට නියමිතය. • මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු, අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කල යුතුව ඇත. 6. කිරිමණ්ඩල මාවත, රාගම සහ පිටකෝට්ටේ පිහිටි සංස්ථාව සතු ඉඩම් ආයෝජන අවස්ථාවන් සඳහා විධිමත් අයුරින් ලබා දීම. සමස්ථයක් වශයෙන් සලකා බැලූ විට ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා වැසි ජල අපවහනය, තෙත්බිම් කළමනාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ජාතික සංවර්ධන ප්‍රතිපත්තිවලට සමගාමීව පරිසර හිතකාමී සහ තිරසාර පරිසරයක් නිර්මාණය කිරීමට සහ කළමනාකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

<u>පෙර පැවති වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය</u>

පැවති රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන වන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර සංරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතන සඳහා වෙන් වන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන සහ පැවති රාජ්‍ය අමාත්‍යාංශයේ වැය විෂය යටතේ වෙන් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන වල ප්‍රගතිය පහත පරිදි වේ.

අනු අංකය	වැය විෂය	ආයතනය	2022 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.)	2022.12.31 දිනට ප්‍රගතිය (රු.මි.)
01.	123-1-19	පැවති රාජ්‍ය ඇමති කාර්යාලය	0.543	0.543
02.	123-1-20	පැවති රාජ්‍ය අමාත්‍යාංශ කාර්යාලය	12.923	10.55
03.	291-1-01	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	191.09	165.767
04.	123-2-21-007	සමුද්‍රීය පරිසර සංරක්ෂණ අධිකාරිය	20.00	14.1
05.	123-2-21-002	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	500.00	500.00
05.1	123-2-21-003	වේරස් ගංගා කුණාටු ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.	480.00	480.00
05.2	123-2-21-004	බේරේ වැවේ ජලයේ ගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කිරීම.	20.00	19.53
05.3	123-2-21-005	ඔලියමුල්ල කුණාටු ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	200.00	155.00
05.4	123-2-21-005	කොළොන්නාව ඇළ ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	100.00	61.69
		එකතුව	**1,524.53**	**1,407.18**

2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය

❖ **වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (291)**

ව්‍යාපෘතිය	ව්‍යාපෘති කාලය	ඇස්තමේන්තුගත මුළු වියදම (TEC) (රු.මි.)	2022 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මි.)	2022.12.31 දිනට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (වචනයෙන්)	2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස)
මීටර් 115ක් රිවර්ට්මන්ට් බැම්ම ඉදි කිරීම - මුතුපන්තිය උතුර - පුත්තලම - 2021 සිට	2021.08.02-2022.12.31	8.3	3.0	8.2	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%
මීටර් 400 රිවර්ට්මන්ට් බැම්ම ඉදි කිරීම - කැලිඩෝ - කළුතර - - 2021 සිට	2021.02.01 2022.12.31	44.2	8.0	48.0	ඉන්ධන ගැටළුව හේතුවෙන් තාවකාලිකව නවත්වා තිබූ ඉදිකිරීම් නැවත ආරම්භ කර ඇත.	55%
මීටර් 120ක ඇවිදින මංතීරුව ඉදිකිරීම - මිරිස්ස, බණ්ඩාරමුල්ල - මාතර - 2021 සිට	2021.02.08 2022.12.31	2.92	0.02	2.92	මීටර් 40ක දිගක් අවසන් කර ඇත. ඉඩම් දෙකේ හිමිකරුවන් විසින් අභියාචනාධිකරණයේ රිට් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත.ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. දැනට පවතින නඩුවෙහි තීන්දුව ලබා ගැනීමෙන් පසුව තීරණය කරනු ලැබේ	30%
මීටර් 260ක් රිවර්ට්මන්ට් බැම්ම ඉදි කිරීම දෙවන අදියර - මැඩිල්ල, තංගල්ල, හම්බන්තොට- 2021 සිට	2021.08.02 2022.04.30	18.27	5.77	18.27	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%
මීටර 40 ග්‍රොයින 06ක් ඉදි කිරීම - මහවැව තොඩුවාව උතුර (අවසන් අදියර), පුත්තලම - 2021 සිට	2021.02.01 2022.05.31	27.4	2.1	27.40	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%
මීටර් 400 දිග රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම - තලෛයිමන්නාරම - මන්නාරම - 2021 සිට	2021.05.01 2022.04.30	55.8	5.4	55.80	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%

ඉවුරු ආරක්ෂණය - දික්වැල්ල මහජන ක්‍රීඩාංගනය අසල	2022.11.01 2022.12.31	4.0	4.0	3.0	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%
මීටර් 30ක් දිග ග්‍රොයින 06ක් ඉදි කිරීම - නින්තවූර්, අම්පාර	2022.11.01 2022.12.31	9.0	9.0	0.26	ඉදිකිරීම් ආරම්භ කර ඇත	5%
ගේබියන් පෙට්ටි 500ක් මිලදී ගැනීම	2022.04.01 2022.12.31	7.0	7.0	7.05	ගේබියන් පෙට්ටි සපයා ඇත	100%
භූසළු ව.මී.40,000 මිලදී ගැනීම	2022.03.07 2022.12.31	23.2	23.2	23.7	භූ සළු සපයා ඇත	100%
හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු	2022.01.01 2022.12.31	50.0	50.0	44.97	හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු 12 ක් අවසන් කර ඇත.	100%
මීටර් 500ක රිවර්ට්මන්ට් බැම්ම නැවත ගොඩනැගීම - ලුනාව - කොළඹ - 2021 සිට	2021.02.01 2022.12.31	19.3	12.0	17.91	ඉන්දන ගැටළුව හේතුවෙන් තාවකාලිකව නවත්වා තිබූ ඉදිකිරීම් ඉදිරි සතියේදී දෙපාර්තමේන්තු යන්ත්‍ර යොදා නැවත ආරම්භ කිරීමට නියමිතව ඇත.	35%
අම්බලන්ගොඩ තානායම අසල නාන ස්ථානය සංවර්ධනය කිරීම - 2021 සිට	2021.10.01 2022.12.31	5.65	5.65	3.5	භූ සළු බෑග භාවිතා කරමින් පැනි බැම්ම දෙක ඉදිකරමින් පවතී.	60%
මීටර් 200 රිවර්ට්මන්ට් බැම්ම ඉදි කිරීම - මෝරවල - පිටිපන - 2021 සිට	2021.03.02 2022.04.30	18.3	10.4	18.3	ඉදිකිරීම් අවසන් කර ඇත.	100%
මීටර් 80 දිග රිවට්මන්ට් බැම්ම සහ ග්‍රොයින 03 ක් අළුත්වැඩියා කිරීම -පොරුතොට - ගම්පහ - 2021 සිට	2021.02.01 2022.12.31	8.7	3.5	6.32	ග්‍රොයින 02 ක වැඩ අවසන් කර ඇත.	70%
මීටර් 110 ගේබියන් බැම්ම අලුත්වැඩියා කිරීම - .නිරුක්කෝවිල්, අම්පාර	2022.11.01 2022.12.31	7.0	7.0		අමුද්‍රව්‍ය සඳහා ටෙන්ඩරය ප්‍රධානය කර ඇත.	05%
වෙරළ ඉංජිනේරුමය නිර්මාණ	2022.01.01 2022.06.30	0.1	0.1	0.1	නිර්මාණ හා සැලසුම් අවසන් කර ඇත	100%
වෙරළ ඉංජිනේරු විමර්ශන	2022.01.01 2022.11.30	5.7	5.7	4.92	මුතුපන්තිය සහ උඩප්පුව වෙරළ තීරයේ අගාධමිතික සමීක්ෂණය අවසන් කර ඇත	100%
වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	2022.06.01 2022.11.30	0.2	0.2		අවසන් කර ඇත	100%
බලපත්‍ර ක්‍රියාවලිය	2022.01.01	4.86	4.86	1.57	අයදුම්පත් 1831 කින් බලපත්‍ර 1496 ක්	82%

	2022.12.31				නිකුත් කර ඇත.	
අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම, අනවසර වැලි ඉවත් කිරීම,අධීක්ෂණය	2022.01.01 2022.12.31	0.8	0.8	0.51	ගාල්ල යාකොටුවැල්ල හා දෙවට ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් 28ක්, මාතර මිදිගම හා දික්වැල්ල ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් 05ක් කඩා ඉවත් කරන ලදී.	
වෙරළබඩ දූෂණය අවම කිරීම/වෙරල පිරිසිදු කිරීම්	2022.01.01 2022.12.31	0.7	0.7	2.59	2022 අගෝස්තු මස සිට මේ දක්වා පුත්තලම, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ යාපනය යන දිස්ත්‍රික්ක වල වෙරළ තීර ආවරණය වන පරිදි වැඩසටහන් 45ක් සිදු කර ඇත.	100%
කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම	2022.01.01 2022.12.31	0.2	0.2	0.04	කළුතර, ගාල්ල, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ යාපනය දිස්ත්‍රික්ක වල වෙරළ තීර ආවරණය වන පරිදි වැඩසටහන් 06ක් සිදු කර ඇත.	100%
අධ්‍යාපන/දැනුවත් කිරීමේ වැඩසටහන්	2022.01.01 2022.12.31	1.0	1.0	0.18	මීගමු නගර සභාවේදී රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය සඳහා එක් දින දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022.02.22 දින පැවැත්විය. කෙටි රූපවාහිනී වාර්තාමය වැඩසටහන් ,මීට අමතරව වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කර ඇත	100%
වෙරළ සංරක්ෂණ සහ වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම සංශෝධනය	2022.05.01 2022.12.31	5.6	5.6	3.35	මූලික වාර්තාව ලබා දී ඇත.	70%

❖ **සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (123)**

- නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාළ අනෙකුත් ආයතනික කටයුතු සිදු කිරීම හා පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම.
- කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම හා අදාළ ආයතන වෙත බෙදා හැරීම.
  ආයතනයේ මානව සම්පත් සැලැස්ම සැකසීම.
  තොරතුරු දැනගැනීමේ පනතට අනුව කටයුතු කිරීම.
- නිලධාරීන්ගේ නිවාඩු ආශ්‍රිත ලේඛන, ලිපිගොනු නඩත්තු කිරීම.
- නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු සම්බන්ධව කටයුතු සිදු කිරීම.
- වාහන සංචිතය පවත්වාගෙන යාම හා වාහන නඩත්තුව.
- වතු නිවාස අංශය යටතේ පවතින ආයතන අතර සම්බන්ධීකරණය, අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා වෙනත් අණපනත් අනුව කාර්ය මණ්ඩලය මෙහෙය වීම.
- මානව සම්පත් කළමනාකරණය.
- නඩත්තු කිරීම් හා සම්බන්ධ පාලන කටයුතු.
- කාර්යාල ක්‍රම කළමනාකරණ තුළින් ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම.
- නව තොරතුරු තාක්ෂණික ක්‍රම ගුණාත්මකව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම.
-

1.5.3 සංවර්ධන අංශය

වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා වතු නිවාස අංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා ප්‍රාදේශීය සභා ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම හා සම්බන්ධීකරණය පිළිබඳ සියලු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල් ද යොදවමින් වතු නිවාස අංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය මෙන්ම සැලසුම් අංශය ද සංවර්ධන අංශයට සහාය දක්වනු ලබයි.

1. **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**
    - පේලි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම.
    - සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම.
    - සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති.
    - ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම.
    - වතු සහ වතු රෝහල් සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය (මාර්ග, අඩි පාරවල්, පියගැට පේළි සහ පාලම් ආදිය).
    - පොදු පහසුකම් සංවර්ධනය

-අනෙකුත් ප්‍රජා/සංස්කෘතික මධ්‍යස්ථාන

-ක්‍රීඩාපිටි

-පෙර පාසැල් වැඩිදියුණු කිරීම

2. **වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**
    - නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
    - ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
    - නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
    - වතු නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ඔප්පු ලබාදීම.
    - නව ජීවන නිවාස වැඩසටහන්වලට අදාළ ණය වාරික අයකර ගැනීම.
3. **තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති, හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E–kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ත අධීක්ෂණය.**
4. **විදේශ ආධාර යටතේ හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම.**

- සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, නියාමනය කිරීම හා ප්‍රගතිය අනුව ගෙවීම් නිර්දේශ කිරීම.

- ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රගති වාර්තා හා ප්‍රසම්පාදන වාර්තා ඉදිරිපත් කිරීම.

1.5.4 සැලසුම් අංශය

වතු නිවාස අංශයේ සමස්ත සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රධාන වශයෙන් පහත කර්තව්‍යයන් සැලසුම් අංශය මගින් ඉටු කරයි.

- වැවිලි ප්‍රජාවේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනාගැනීම හා වතු නිවාස අංශයේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.
- සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම.
- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේ දී සහාය ලබාදීම හා වතු නිවාස අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම.
- ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම හා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- වතු නිවාස අංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම.
- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, ශක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුළත් ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම .
- ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අදාළ ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැළසීම.
- වතු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳ තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම.
- වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන නිලධාරීන් හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වීම
- වතු නිවාස අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- වතු නිවාස අංශයේ සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා වතු නිවාස අංශය වෙනුවෙන් නියෝජනය කිරීම.
- ග්‍රාමීය ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන කමිටු කටයුතු සම්බන්ධීකරණය හා power point ඉදිරිපත් කිරීම් සකස් කිරීම.

1.5.5 ගිණුම් අංශය

වතු නිවාස අංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාළ ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියලු කටයුතුවල වගකීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.

- වතු නිවාස අංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතනවල මූල්‍ය කළමනාකරණය.
- ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා කළමනාකරණය.
- වත්කම් කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.
- මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ පුහුණු හා සංවර්ධන කටයුතු
- විගණනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

1.5.6 අභ්‍යන්තර විගණන අංශය

වතු නිවාස අංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීමත්, වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහාය වීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී අදාළ කරුණු අනාවරණය කිරීමත්, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීමත්, විගණන විමසුම් මඟින් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමත්, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය, වතු නිවාස අංශයේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම් කිරීම හා වතු නිවාස අංශය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මෙන් ම වතු නිවාස අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණ මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.

1.5.7 ඉංජිනේරු අංශය

- Architectural හා Design Drawings සඳහා අනුමැතිය ලබා දීම.
- පිරිවිතරයන් හා ඇස්තමේන්තුවලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විවිධ අරමුදල් ප්‍රභවයන් හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා උපදේශන සේවාවන් සැපයීම.
- ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු හා තාක්ෂණික විගණනයන්වලට සහභාගී වීම.
- ඉදිකිරීම් ව්‍යාපෘතිවලට නව ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම හා ඇස්තමේන්තු සැකසීම.

1.6 වතු නිවාස අංශය යටතේ පවතින ආයතන

1.6.1 සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

සියලු ප්‍රජාව අතර සාමය, හොඳ හිත, අවබෝධය සහ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම, ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම, ආගමික, අධ්‍යාපනික, වෘත්තීමය, සමාජයීය, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා අවබෝධය නංවාලීම ආදී කරුණු තුළින් යහපත් ජන සමාජයක් බිහිකිරීම උදෙසා "සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම" 2005 අංක 19 දරන පාර්ලිමේන්තු පනත මගින් එම වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

08 දෙනෙකුගෙන් සැදුම්ලත් කළමනාකරණ මණ්ඩලයකින් මෙම පදනම පාලනය වන අතර පදනම යටතේ ආයතන 04 ක් ක්‍රියාත්මක වේ. මෙම ආයතන 04 හි කාර්ය මණ්ඩල වැටුප් ඇතුළු සමස්ත මෙහෙයුම් කර්තව්‍යන් සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 136.20ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2022.12.31 දිනට වෙන් කර ඇති අතර ඉන් මිලියන 136.15ක මුදලක් 2022.12.31 වන විට වැය කර ඇත.

1.6.1.1 හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සතුව වසරකට සිසුන් 400ක් පමණ පුහුණු කිරීම් සඳහා ඉඩකඩ පවතින අතර පුහුණුව සඳහා සහභාගීවන සිසුන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් (අභ්‍යාසලාභීන් 200කට පමණ) හා ආහාරපාන රජය මගින් දරනු ලබයි. වර්තමානයේ දී වාර්ෂික පාඨමාලා 04 ක් හා අර්ධ වාර්ෂික පුහුණු පාඨමාලා 13ක් ද ඇතුලත්ව වෘත්තීය පුහුණු පාඨමාලා 17ක් මේ වන විට ක්‍රියාත්මක වේ. ඒ අනුව මෙම

වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් හා යටිතල පහසුකම් ධාරිතාවය සහිතව (NVQ) මෙම විෂය ධාරාවන් 17 යටතේ වසරකට කුසලතා සහතික 500 ක් පමණ නිකුත් කරන අතර එම සිසුන් අතරින් 60%ක පමණ පිරිසක් ස්වයං රැකියාවන් ආරම්භ කර ඇති අතර 40%ක පිරිසක් නිපුණතාවයන් සමඟ රැකියා වෙළෙඳ පොළට පිවිසේ.මෝටර් රථ කාර්මික

- විදුලි කාර්මික
- ICTT
- විදුලි උපකරණ නඩත්තු කිරීමේ කාර්මික (රූපවාහිනී රේඩියෝ අලුත්වැඩියා කිරීම)
- විදුලි උපකරණ නඩත්තු කිරීමේ කාර්මික ශිල්පී (ගෘහ විද්‍යුත් කාර්මික)
- පෑස්සුම් ශිල්පින්
- ඇලුමිනියම් ෆැබ්රික්ටර්
- මෝටර් රථ කාර්මික
- මැහුම් ශිල්පී
- හෝටල් පාඨමාලා (කාමර සේවක/භාරකරු)
- ලී කාර්මික ශිල්පින්
- යන්ත්‍රෝපකරණ ශිල්පී
- ෆාමසි පුහුණුව (අලුතින් ආරම්භ කරන ලද)
- පෙර පාසල් ගුරු පුහුණුව (අලුතින් ආරම්භ කරන ලද)
- රූපවාහිනී ශිල්පියා / කොන්ඩා මොස්තරකරු (අලුතින් ආරම්භ කරන ලද)
- ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම (අලුතින් ආරම්භ කරන ලද)
- හෙද සහකාර කිරීම (අලුතින් ආරම්භ කරන ලද)

සියලු ම පුහුණු පාඨමාලා සඳහා සහභාගී වන සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම සිදුකරනු ලබන අතර සියලු ම පාඨමාලාවන් අවසානයේ දී පරීක්ෂණයක් පවත්වා නිසි පරිදි පාඨමාලාව අවසන් කරන ලද සිසුන් සඳහා පාඨමාලාව අනුව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ Level) 2, 3 හා 4 මට්ටමේ සහතිකපත් ලබාදීම සිදුකරනු ලැබේ.

රැකියා අපේක්ෂකයින් සඳහා වෘත්තීය හා තෘතීයික කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ Level) මට්ටම් අනුව පාඨමාලාවන්හි NVQ මට්ටම ඉහළ වෘත්තීය පුහුණු සහතිකලාභීන් සඳහා දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළට ප්‍රවේශවීම පහසුවන බැවින් ඉදිරියේ දී මෙම පාඨමාලාවල NVQ මට්ටම් උසස් කිරීමට ද අපේක්ෂිතය.

2016 සිට 2022 දක්වා පුහුණුව ලද සිසුන් පහත පරිදි වේ.

#	වසර	පාඨමාලා සංඛ්‍යාව	පුහුණුව ලද සිසුන් සංඛ්‍යාව	පුහුණුව ලද කාණ්ඩ සංඛ්‍යාව (Batches)
1	2016	12	263	2
2	2017	12	335	2
3	2018	12	228	2
4	2019	12	276	2
5	2020	12	211	1
6	2021	17	287	1
7	2022	17	248	2
එකතුව			1848	

1.6.1.2 රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය

අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික අභිමතාර්ථයන් හා පිළිවෙත් වර්ධනය කිරීමේ අදහසින් මෙම සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවා ඇත. ඉදිරියේ දී මෙහි ඉගැන්වීම් විධිමත් හා අවිධිමත් ලෙස බෙදා වෙන් කිරීමට නියමිතව ඇති අතර විධිමත් පුහුණුව යටතේ ජාතික අධ්‍යාපන ආයතනය (NIE) හා එක්ව එහි විෂය නිර්දේශයන්ට අනුව පූර්ණ කාලීන පුහුණු පාඨමාලා පැවැත්වීමටත් අර්ධ කාලීන පාඨමාලා පැවැත්වීමටත් අදහස් කරනු ලැබේ. අවිධිමත් පුහුණුව යටතේ වයස් භේදයකින් තොරව ඕනෑම අයෙකුට රසාස්වාදය උදෙසා සාම්ප්‍රදායික කලා හැකියාවන් ඔප් නංවා ගැනීමට අවස්ථාව සැලසේ. මෙමගින් දෛනිකව පීඩාකාරී රැකියාවන්හි යෙදෙන වැවිලි ප්‍රජාවගේ මානසික ආතතිය අවම කර ගැනීමටත්, ඔවුන්ට ස්වභාවයෙන් ම උරුම වී ඇති සෞන්දර්යාත්මක අගයන් ප්‍රවර්ධනය කර ගැනීමටත් අවස්ථාව හිමි වේ. මීට අමතරව, විවිධ උත්සව හා සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම සඳහා ශාලා පහසුකම් සැපයීම ද රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානයෙන් සිදු කෙරේ.

ජනවාරි මස සිට ඔක්තෝම්බර් මාසය දක්වා රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථාන හරහා පහත පරිදි සිසුන් පුහුණුව ලබා ඇත.

#	විෂය	සිසුන් සංඛ්‍යාව
01	නැටුම්	99
02	සංගීතය	58
03	කලා	29
04	වීණා	19
05	වයලීනය	30
06	මිරුතංගම්	04
07	Harmonium	12
	එකතුව	**251**

1.6.1.3 නෝර්වුඩ්හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය

ක්‍රීඩාව තුළින් ප්‍රතිලාභ ලබන තරුණ තරුණියන්ගේ භෞතික සංවර්ධනය මෙන් ම මානසික සංවර්ධනය හා විනෝදාස්වාදය වර්ධනය කිරීමේ අරමුණු පෙරදැරිව, මෙම ක්‍රීඩා සංකීර්ණය පවත්වාගෙන යනු ලබන අතර එයට අමතර වශයෙන් අවට පාසල් හා රාජ්‍ය ආයතන රාශියකටද විවිධ ක්‍රීඩා තරඟ හා ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා එහි පහසුකම් සලසා දී ඇත. එමෙන්ම එහි කොටසක් නෝර්වුඩ් ද්‍රවිඩ පාසලේ ප්‍රාථමික පන්ති පවත්වාගෙන යාම සඳහා ලබා දී ඇත.

ක්‍රීඩා සංකීර්ණය සතුව ප්‍රධාන වශයෙන් ම කාය ශක්ති මධ්‍යස්ථානයක් සතු වන අතර, ටෙනිස්, බැඩ්මින්ටන්, දැල්පන්දු, අත්පන්දු හා බාස්කට් බෝල් ආදී ගෘහස්ථ ක්‍රීඩා සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ද, ක්‍රිකට් වැනි ක්‍රීඩා සඳහා එළිමහන් ක්‍රීඩාගාරයක් ද ක්‍රියාත්මක වේ. දැනට පාපන්දු සම්මේලනයට ලබා දී තිබෙන තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය නවමු ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව ජාත්‍යන්තර තලයට ගැළපෙන අයුරින් ක්‍රීඩා සංකීර්ණය සංවර්ධනය කිරීමේ අරමුණින් සංරචක තුනක් යටතේ ක්‍රීඩා වැඩසටහන් මෙහෙයවීමට කටයුතු යොදා ඇත.

- **ශාරීරික ශක්තිය හා විනෝදාස්වාදය වර්ධනය වන ක්‍රීඩා**

මේ යටතේ කායවර්ධන පුහුණුකරුවන් 44 දෙනෙකු පුහුණුකර ඔවුන් සෑම ප්‍රජා ශක්ති මධ්‍යස්ථානයකටම අනුයුක්ත කොට වතු ප්‍රදේශ ආශ්‍රිත තරුණ තරුණියන් කායවර්ධන පුහුණුවට යොමු කිරීමට අපේක්ෂා කරනු ලබයි. එමෙන් ම ගෘහස්ත ක්‍රීඩා වෙත තරුණ තරුණියන් යොමු කිරීම ප්‍රවර්ධනය කිරීම ද මේ යටතේ සිදු කරනු

ලබයි. මෙහි ඉලක්කය වන්නේ වාර්ෂික තරඟාවලි 12ක් පැවැත්වීමත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2000ක් දක්වා වැඩි කිරීමත්ය.

- **තරග අරමුණු කරගත් ක්‍රීඩා**

ක්‍රීඩා සඳහා දක්ෂතා දක්වන ක්‍රීඩකයන් සඳහා අවශ්‍ය සියලු පහසුකම් හා මගපෙන්වීම් සිදුකරමින් එම ක්‍රීඩකයින් ක්‍රීඩා තරඟ සඳහා යොමුකර ජාතික තලයේ ජයග්‍රහණයන් ලබා ගැනීමට මග විවර කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙහි ඉලක්කය වන්නේ වාර්ෂික තරඟාවලි 100ක් පැවැත්වීමත් තෝරාගත් තරඟකරුවන් 5 දෙනෙකු ආසියානු හා ඔලිම්පික් තරඟ වලට යොමු කිරීමත්ය.

- **වාණිජ්‍ය අරමුණු කරගත් ක්‍රීඩා**

නුවරඑළිය දිස්ත්‍රික්කය බොහෝ විදේශකයින්ගේ සිත්ගත් ප්‍රදේශයක් බැවින් හා මේ දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කය සතුව ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා සංකීර්ණයක් නොමැති බැවින් තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සියලු පහසුකම් සපිරි ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා සංකීර්ණයක් බවට පත්කොට ඒ තුළින් ඉපැයීම් කිරීමට මෙහි දී බලාපොරොත්තු වේ.

1.6.1.4 ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය (E- KIOSK Centers)

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිත කරමින් අඩු වරප්‍රසාද ලත් ජන කොටස් වෙත පූර්ණ වූත්, විස්තීර්ණ වූත් සමාජ ආර්ථික සංවර්ධනයක් හිමිකර දීම මෙම ව්‍යාපෘතියේ අභිලාෂය වේ. ඒ සඳහා ප්‍රජාවට තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය ලබාදීම අරමුණු කොට ගනිමින් වැවිලි ප්‍රදේශ ආවරණය වන පරිදි 2006 වසරේ දී ආරම්භ කරන ලද ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය, නුවරඑළිය, බදුල්ල, මහනුවර, කෑගල්ල, රත්නපුර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති ප්‍රජාශක්ති මධ්‍යස්ථාන (E- KIOSK Centers) 44ක් හරහා ක්‍රියාත්මක වේ.

වතු ප්‍රදේශයන්හි පළමු වසරේ සිට උසස් අධ්‍යාපනයන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද, පාසල් හැර ගිය තරුණ තරුණියන්ට ද තොරතුරු තාක්ෂණ සන්නිවේදනය ලබාදීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ක්‍රියා කරනු ලබයි. එසේ ම අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වන අයට නොමිලේ එම පහසුකම් ලබා දීමට ද පුස්තකාල පහසුකම් සැපයීම තුළින් ඔවුන්ගේ කියවීම හා දැනුම වර්ධනයට ද කවි නාට්‍ය හා කථික තරඟ තුළින් පෞරුෂත්ව සංවර්ධනයට ද මෙම මධ්‍යස්ථානය හරහා පහසුකම් සලසා තිබේ. එමෙන්ම විවිධ වැඩමුළු හා දේශන පැවැත්වීමත් විවිධ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙමගින් සිදුකරනු ලබයි.

එමෙන් ම සෞඛ්‍ය හා කාන්තා සවිබල ගැන්වීම, පාරිසරික ගැටලු, ස්වයං රැකියා, වතුකරයේ ළමුන් සම්බන්ධයෙන් බලපාන විවිධ ගැටලු, අභිප්‍රේරණ ක්‍රියාකාරකම්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් (ප්‍රජා මුළුතැන්ගේ වැඩසටහන), කොරෝනා මර්දන විශේෂ වැඩසටහන්, වගා වැඩසටහන් යනාදී විවිධ තේමාවන් ඔස්සේ වතු ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතිය මගින් විවිධ ප්‍රජා මූලික ක්‍රියාකාරකම් දියත් කෙරෙන අතර විශේෂයෙන් ම ඔවුන්ගේ ආදායම් උත්පාදනය, ආදායම් මාර්ග වැඩි කිරීම (ස්වයං රැකියා) සඳහා ද, නායකත්ව කුසලතා හා භෞතික සංවර්ධනය සඳහා ද ඇවැසි ක්‍රියාකාරකම් මෙමගින් සිදුකරනු ලබයි.

එසේ ම අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වන්නන් සඳහා නොමිලේ එම පහසුකම් ලබාදීම ද මේ හරහා සිදු වේ. ප්‍රජාශක්ති මධ්‍යස්ථානය හරහා තොරතුරු තාක්ෂණයට අදාළව පහත විෂයයන් උගන්වනු ලැබේ.

1. තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම
2. දෘඪාංග
3. Windows
4. මෘදුකාංග - Paint, Microsoft Word,
   Microsoft Excel, Microsoft Power

Point, Microsoft Access
5. අන්තර්ජාලය සහ විද්‍යුත් තැපෑල
6. Graphic Design - CorelDraw, Photoshop, HTML, PageMaker
7. Scanning
8. Printing

2022 වර්ෂය තුළ ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය හරහා සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත පරිදි ඉදිරිපත්කළ හැක.

	වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
1	අධ්‍යාපන වැඩසටහන්	4	254
2	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්	9	158
3	සමාජ සහ ප්‍රජා මූලික වැඩසටහන්	7	460
4	සෞඛ්‍ය වැඩසටහන්	10	498
	එකතුව		**1370**

1.6.2 වැවිලි මානව සංවර්ධන භාරය

වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1992 සැප්තැම්බර් මස 18 වන දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ, ලියාපදිංචි සමාගමක් වශයෙන් "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" පිහිටුවන ලදී.

1992 දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තියකට අනුව JEDB (ජනතා වතු සංවර්ධන මණ්ඩලය), Elkaduwa සහ SLSPC (ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව) යටතේ ඇති වැවිලි සමාගම්, ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් යටතේ ඔවුන්ගේ කළමනාකාරීත්වය පැවරීම හරහා පෞද්ගලීකරණය කරන ලදී.

පෞද්ගලීකරණයෙන් පසු කෙටි කාලයක් තුළ JEDB සහ SLSPC ආයතන, වැවිලි ප්‍රජාවේ සෞඛ්‍ය, සමාජ සුභසාධන සහ ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම සඳහා PHSWT (වතු නිවාස හා සමාජ සංවර්ධන අරමුදල) ලෙස ඒකාබද්ධ කරන ලදී. 2002 ඔක්තෝබර් 25 වන දින මෙම සංවිධානය වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) ලෙස ප්‍රතිනාමගත කරන ලද අතර මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

වතු ප්‍රජාවගේ යහපත උදෙසා පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, ව්‍යෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

PHDT හි කාර්යයන් සිදු කරනු ලබනුයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් හරහා ය. ඊට මහා භාණ්ඩාගාරයේ හා ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මෙන් ම ව්‍යෘත්තීය සමිතිවල නියෝජිතයින් ද ඇතුළත් වේ. මෙහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ලේ පිහිටා ඇති අතර ප්‍රාදේශීය කාර්යාලයන් ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් හා නුවරඑළිය පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් 7ක් හරහා බලගැන්වෙන අතර ප්‍රාදේශිකයන්හි කටයුතු ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකුගෙන් හා තාක්ෂණික, සෞඛ්‍ය, මූල්‍ය හා පරිපාලන කාර්යය මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක වේ.

වතු නිවාස අංශයේ ප්‍රතිපාදන හරහා වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු

වතු නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය

වතුකරයේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා 2022 වර්ෂයේදී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 275ක් වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත වෙන් කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

2022.12.31 දිනට නව නිවාස ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය

ප්‍රාදේශිකය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	මූලික කටයුතු සහ අත්තිවාරම්	බිත්ති මට්ටමට සම්පූර්ණ කළ	වහළ මට්ටමට ඉදිකිරීම් සම්පූර්ණ කළ	අවසාන අදියරේ පවතින නිවාස	සම්පූර්ණ කළ නිවාස	මුළු නිවාස ඒකක සංඛ්‍යාව
ගාල්ල	15	15	0	21	2	53
රත්නපුර	0	9	4	18	35	66
බදුල්ල	0	0	0	0	0	0
කෑගල්ල	18	19	0	0	55	92
මහනුවර	58	36	90	61	71	316
හැටන්	165	137	78	62	113	555
නුවර එළිය	86	125	43	95	50	399
කළුතර	0	17		0	16	33
එකතුව	342	358	215	257	342	1514

2022 වර්ෂය තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 120 ක් වැවිලි මානව සංවර්ධන භාරයට වෙන් කරන ලදී. මෙම ප්‍රතිපාදන වලින් රු. මිලියන 104.9 ක් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැය කරන ලදී

ව්‍යාපෘතිය	ව්‍යාපෘති සංඛ්‍යාව	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව	සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව
වතු ප්‍රවේශ මාර්ග සංවර්ධනය	24	1	23
ජල සැපයුම් ව්‍යාපෘති ආරම්භකිරීම / සංවර්ධනය	3	0	3
ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පහසුකම් සැළසීම	6	1	5
අබලන් ලැයින් කාමර වල වහළ නැවත සෙවිලි කිරීම්	2 (5 ලැයින් කාමර ඒකක)	0	2 (5 ලැයින් කාමර ඒකක)
සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	1	0	1
ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය	5	2	3
ක්ෂේත්‍ර විවේකාගාර	3	0	3
ආගමික ස්ථාන	31	8	23
රෝහල්	1	0	1

පැති බැමි ගොඩනැගිලි සංවර්ධන ආදිය	8	1	7
එකතුව	**84**	**13**	**71**

1.6.3 වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

වැවිලි ප්‍රජාවගේ උන්නතිය සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන කටයුතු කඩිනමින් ඉටු කිරීමේ අරමුණින් අමාත්‍යාංශයට අනුබද්ධිතව රාජ්‍ය ආයතනයක් පවත්වාගැනීමේ අවශ්‍යතාව මත 2018.06.25 වන දින, "වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය" පිහිටුවීමට ක්‍රියාකළ අතර ඊට අදාළ 2018 අංක 32 දරන පනත, පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදුව එහි මෙහෙයුම් කටයුතු 2019 වර්ෂයේ පෙබරවාරි 7 වැනි දින සිට ආරම්භ කරන ලදී.

අධිකාරියේ කළමණාකාරීත්වය 13 දෙනෙකුගෙන් සැදුම්ලත් කළමණාකරණ මණ්ඩලයකින් සමන්විත වන අතර අතිගරු ජනාධිපතිතුමන් විසින් මෙහි සභාපතිතුමන්ව පත් කරනු ලැබේ. එසේම "අධ්‍යක්ෂ ජනරාල්" අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වේ. කාර්යය මණ්ඩලය සඳහා කාණ්ඩ 13ක් යටතේ තනතුරු 27කි.

2022 වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය සඳහා රු. මිලියන 11 ක් වෙන් කරන ලදී. මෙම ප්‍රතිපාදන වලින් රු. මිලියන 7.95ක් මෙමඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා වැය කරන ලදී

වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය හරහා 2022 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යභාරයන් පහත පරිදි ඉදිරිපත් කළ හැක.

- නිවාස සහ අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ තක්සේරු සමීක්ෂණය
- UNFPA සමඟ හවුල්කාරිත්වය
- oDoc සමඟ හවුල්කාරිත්වය
- වතුවල අවදානමට ලක්විය හැකි පාසල් සිසුන්ට සහල් මෙට්‍රික් ටොන් 1000ක් ලබාදීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම
- බ්‍රිතාන්‍ය සහාය ඇතිව පොත් පරිත්‍යාග කිරීම

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1.7.1 ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

වැවිලි ප්‍රජාව සඳහා පූර්ණ ප්‍රදාන පදනම යටතේ නිවාස ඒකක 14,000 ක් ලබාදීමට ඉන්දීය රජය විසින් එකඟතාවය ලබා දී ඇත.

මෙය අදියරයන් තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර (Stage 01) හා දෙවන අදියර (අදියර 02) යටතේ නිවාස ඒකක 4,000 ක් හා තෙවන අදියර (Stage 03) යටතේ නිවාස ඒකක 10,000ක් ක්‍රියාත්මක කරනු ලබයි. එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති මෙම ව්‍යාපෘතියෙහි අදියර I සහ අදියර II සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රු. 950,000ක්ද, අදාළ වැවිලි සමාගම විසින් රු. 30,000ක් හා ප්‍රතිලාභියා විසින් රු. 20,000ක ශ්‍රම දායකත්වයක් සපයනු ලබයි. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ප්‍රථම අදියරයෙහි නිවාස සඳහා එක් නිවාස ඒකකයකට රු. 120,000ක් හා එහි දෙවන අදියර සඳහා එක් නිවසකට රු. 150,000ක් වන ලෙසට ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන සැපයීමට එකඟ වී ඇත.

ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

(අ) පළමු හා දෙවන අදියර (Stage I & II) - නිවාස 4000

2016.01.08 දිනැති කැබිනට් අනුමැතිය මත ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමග 2016.04.01 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දියානු නිවාස වැඩසටහනේ පළමු අදියර හා දෙවන අදියර ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය විසින් තෝරාගත් පහත සඳහන් ආයතනයන් මගින් සිදු කරනු ලබයි

1. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat)

2. අන්තර්ජාතික රතු කුරුස සම්මේලනය (IFRC)

3. මනුෂ්‍යත්වය සඳහා නිවහන (Habitat for Humanity)

4. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA)

2022 අයවැය ප්‍රතිපාදන හරහා නිවාස සහ යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. මිලියන 260ක මුදලක් (ශ්‍රී ලංකා රජයේ දායකත්වය - රු. මිලියන 165 සහ ඉන්දියානු රජයේ අරමුදල්-රු. මිලියන 95) වෙන් වූ අතර 2022.12.31 වන විට නිවාස 3819ක කටයුතු සම්පූර්ණ කර ඇත. මින් නිවාස 3323ක් දැනටමත් ප්‍රතිලාභීන් වෙත භාර දී ඇති අතර නිවාස 496ක් භාර දීමට නියමිත ය.

(ආ) III - තෙවන අදියර (Stage III) - නිවාස10,000

III වන අදියර යටතේ ඉන්දීය රජය විසින් නව නිවාස 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත ලබා දීමට එකඟ වී ඇත. එයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය 2018.08.16 දින ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමග 2018.08.12 දින ඊට අදාළ එකඟතා ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව, බදුල්ල, හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල, රත්නපුර සහ ගාල්ල යන වතු කලාප හතේ ම වතු ප්‍රජාව සඳහා පියවර තුනකින් යුක්තව නිවාස ඒකක 10,000ක් වතු ප්‍රතිලාභීන්ගේ මූලිකත්වයෙන් හා වතු සේවක සමුපකාර සමිති හරහා ඉදිකිරීමට සැළසුම් කර ඇත.

- පියවර I (Phase II) - මේ යටතේ නිවාස 3,525ක් ඉදිකිරීම සඳහා ස්ථාන හඳුනාගෙන ඇත.
- පියවර II (Phase II) - මේ යටතේ නිවාස 3,944ක ඉදිකිරීමට වතු නම් කර ඇති නමුත් ස්ථාන හඳුනාගත යුතුව ඇත.
- පියවර III (Phase III) - මේ යටතේ නිවාස 2,531ක ඉදිකිරීමට වතු නම් කර ඇති නමුත් ස්ථාන හඳුනාගත යුතුව ඇත.

1.7.2 තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

ඉන්දීය රජය විසින් හැටන්හි තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමත් පවතින ගොඩනැගිලි නවීකරණයකිරීමත් වෙළෙඳපල ඉල්ලුමට සරිලන පරිදි නව පුහුණු පාඨමාලා ඇති කිරීම හා ඊට අවශ්‍ය නව තාක්ෂණික උපකරණ ලබාදීමත් අරමුණු කොටගෙන මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයනු ලබයි.

ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017.05.02 දින ලැබී අතර ඒ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම 2017.09.20 දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමග අත්සන් තබා ඇත. මෙම ව්‍යාපෘතියට අදාළව ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කර ඇති අතර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් සඳහා ලංසු තැබීමේ කටයුතු සම්පූර්ණ කර ඇත.

1.8 වතු නිවාස අංශයේ සංවර්ධන ප්‍රවේශය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

1.8.1 සංවර්ධන ප්‍රවේශය

ප්‍රාදේශීය ජන කණ්ඩායම් අතර පවතින සමාජ හා ආර්ථික විෂමතාවයන් අවම කරගත් සංවර්ධන ප්‍රවේශයන් ඔස්සේ රජයේ තිරසර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීම උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කොට ක්‍රියාත්මක කිරීමේ අරමුණින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ මෙම වතු නිවාස අංශය, වැවිලි ප්‍රදේශ කේන්ද්‍ර ගත කරගනිමින් ජීවත්වන පවුල් 250,000 ක පමණ (මිලියනයකට අධික ජනගහනයක් ඇති) වැවිලි ප්‍රජාව සඳහා ප්‍රජා සහභාගිත්වය හා රාජ්‍ය මැදිහත්වීම තුළින් වැවිලි ප්‍රජා නායකත්වය සහ සහභාගීත්වය දායක කරගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමත්, වාසස්ථාන හා ඉඩම් පිළිබඳ ගැටලු, මූලික යටිතල පහසුකම් අවමවීම පිළිබඳ ගැටලු, අඩු ආදායම් තත්ත්වය සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීම සඳහා සක්‍රිය ලෙස දායක වෙමින් ඔවුන්ගේ අධ්‍යාපන, සමාජ හා ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීමත් සිදුකරනු ලබයි.

එමගින් ප්‍රමුඛතාව ලබා දී ඇති නිවාස, පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළුව මූලික යටිතල පහසුකම් සංවර්ධනය, සෞඛ්‍ය හා පෝෂණය, මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා නිපුණතාවය, ප්‍රජාව සවිබල ගැන්වීම යනාදී ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන කැබිනට් අමාත්‍යාංශයන්, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පළාත් අමාත්‍යාංශයන් ඇතුළු සියලු ම ආයතනයන්හි පූර්ණ දායකත්වය ලබාගනිමින් පහසුකම් සපිරි සෞභාග්‍යමත් වැවිලි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා, මෙම අමාත්‍යාංශය පෙර ගමන්කරු වෙමින් සිටී.

1.8.2 අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රමුඛතා

1. වතු ප්‍රජාව අග්‍රිතව නිවාස හා අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස ඉදිකිරීම
2. වතු ප්‍රජාව අග්‍රිතව මූලික යටිතල පහසුකම් සංවර්ධනය
3. වතු ප්‍රජාව අග්‍රිතව ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීම
4. වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන පහසුකම් හා සෞඛ්‍ය පහසුකම් තහවුරු කිරීම
5. වතු ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය

1.8.3 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

වතු නිවාස අංශය මගින් මෙහෙයවනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය මූලික වශයෙන් වතු නිවාස අංශයේ විෂය පථය යටතේ ඇති ආයතන වන

- වැවිලි මානව සංවර්ධන භාරය
- සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය හා ඊට අමතර වශයෙන්
- දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන මගින් සිදු කරනු ලබයි

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 වතු නිවාස වැඩසටහන

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැළකීමේ දී ද වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාසයක් ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැකි ය. වැවිලි ප්‍රජාව ජීවත් වන නිවාස වලින් අධික ප්‍රමාණයක් පේළි නිවාස වන අතර එම නිවාස ''ලැයින් කාමර'' වශයෙන් හඳුන්වනු ලබයි. මෙම නිවාසයන්හි වෙසෙන වැවිලි ප්‍රජාව ගැටලු රැසකට මුහුණ පා සිටී.

- නිවාස ඉතා පැරණි වීම නිසා අබලන් තත්ත්වයට පත්වීම.
- හිරු එළිය හා වාතාශ්‍රය අවමවී ම.
- අධික තදබදය
- පෞද්ගලිකත්වයක් නොමැති වීම.
- අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයක් එක ම නිවස තුළ ජීවත් වීම සහ ඒ හේතුවෙන් විවිධ අපචාරයන්ට ගොදුරු වීම.
- අනාරක්ෂිත බව.
- පිළිගැනීමක් නොමැති වීම.
- සෞඛ්‍යයට සහ ළමුන්ගේ අධ්‍යාපනයට සුදුසු වටපිටාවක් නොමැති වීම.

වැවිලි ක්ෂේත්‍රය තුළ මෙවැනි නිවාස වර්ග 3කි.

I. තනි බැරක්ක

වර්ග අඩි 264කින් යුත් මෙම නිවස ඉදිරිපස ආලින්දයක් සහ තනි කාමරයකින් සමන්විතය.

II. යුගල බැරක්ක

ඉදිරිපස ආලින්දයක් සහිත කාමර පේළි නිවාස වේ. එක් නිවසකට වර්ග අඩි 145-175ක් පමණ අයත් වේ. පේළියකට කාමර 10-12 ක් තිබිය හැකි අතර මෙම එක් බැරක්කයක් ඉහත පරිදි සැකසුන පේළි 02කින් යුක්ත වේ.

III. තාවකාලික නිවාස

වැවිලි ක්ෂේත්‍රය තුළ ක්‍රමිකව පවුල් සංඛ්‍යාව වර්ධනය වීමත් සමග පවතින පේළි නිවාස ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම නිවාසවලට යාබදව මෙම නිවාස ඉදිකර තිබේ. ටකරන් තහඩු සහ ඉටිරෙදි යොදා තනා ඇති මෙම නිවාස ඉතා අඩු පහසුකම් වලින් යුක්ත වේ.

වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව අත්විඳින්නා වූ මෙම දුෂ්කරතා මගහරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමිකර දීමේ අදිටනින්, වතු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ යටතේ ඉඩම් ඔප්පු හිමිකම සහිත පර්චස් 07ක බිම් අයිතිය ද සමග සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය, විදුලිය හා සංවර්ධනය කරන ලද ප්‍රවේශ මාර්ග ආදී යටිතල පහසුකම් ද සහිතව වර්ග අඩි 550කින් සමන්විත යාබද වැසිකිළි සහිත තනි නිවාසයක් ලබාදීම සිදුකරන ලදී. මීට අමතරව සත්ත්ව පාලනය සහ ගෙවතු වගාවන් පවත්වා ගැනීමට හැකි වන ලෙස අමතර පර්චස් 03ක් ලබා දීමට ද 2021 ජනවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබීම විශේෂ වේ. (අංක: MUD&H/2021/CP/06 දරන 2021.01.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය)

2022.12.31 දිනට නිවාස වැඩසටහනෙහි සමස්ත ප්‍රගතිය (රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ නිවාස වැඩසටහනකි)

2022 වර්ෂය සඳහා අවිච්ඡේද සහ අනුමත නව නිවාස සංඛ්‍යාව		1495
2021.12.31 දිනට නිම කිරීමට අපේක්ෂා කළ සංඛ්‍යාව	නිම කිරීමට අපේක්ෂිත	522
	බිත්ති මට්ටම දක්වා නිම කිරීමට අපේක්ෂිත	305
2021.12.31 දිනට නිම කළ නිවාස සංඛ්‍යාව		323
2021.12.31 දිනට වහළ මට්ටම දක්වා නිම කළ නිවාස සංඛ්‍යාව		472
2021 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන		275
2021.12.31 දිනට වෙන් කළ ප්‍රතිපාදන රු.මි.		275
2021.12.31 දිනට වියදම් කළ ප්‍රමාණය රු.මි.		164.69

2.2 යටිතල පහසුකම් සංවර්ධනය

වැවිලි ප්‍රදේශයන්හි පවතින යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනාගනිමින් ඒ සඳහා සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මේ යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව එම ජනතාව දැනට මුහුණ පා ඇති,

- ආරක්ෂිත පානීය ජලය පිළිබඳ ගැටලු
- සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ගැටලු
- ගමනාගමන දුෂ්කරතා පිළිබඳ පිළිබඳ ගැටලු
- ආගමික හා සංස්කෘතික පහසුකම් නොමැති වීම පිළිබඳ ගැටලු
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා අධ්‍යාපනික පහසුකම් නොමැති වීම පිළිබඳ ගැටලු

ක්‍රීඩා පහසුකම් හා අනෙකුත් පොදු පහසුකම් අවශ්‍යතා සැපයීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන් ම ආපදා තත්ත්වවල දී වැවිලි ප්‍රජාව සඳහා සහන සැළසීම වැනි ව්‍යාපෘතීන් ද මේ යටතේ සිදු කරයි. අමාත්‍යාංශය යටතේ පවතින වැවිලි මානව සංවර්ධන භාරයට අයත් ප්‍රාදේශීය කාර්යාලයන් හරහා සහ එයට අමතරව දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා මගින් ද එම ප්‍රජාව වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදුකරයි.

2022 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතියෙහි සාරාංශය

(2022.12.31 දිනට)

ව්‍යාපෘතිය	වාර්ෂික ප්‍රතිපාදන (වාර්ෂික සැලැස්මට අනුව) රු. මි.	2022.12.31 දිනට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි.	2022.12.31 දිනට තත්‍ය වියදම රු. මි.	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව	සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව
අබලන් ලැයින් කාමර වහළ නැවත සෙවිලි කිරීම	6	6	5.16		2 (ව්‍යාපෘති) 5 (ඒකක)
ජල සැපයුම් ව්‍යාපෘති ආරම්භ කිරීම / සංවර්ධනය	5	5	3.84		3
වතු ප්‍රවේශ මාර්ග සංවර්ධනය	35	35	27.99	1	23
ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය	10	10	7.27	2	3
ළමා සංවර්ධන /ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පහසුකම් සැළසීම	15	15	8.31	1	5
සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	2	2	0.34		1
ක්ෂේත්‍ර විවේකාගාර	48	48	55.42	9	34
ආගමික ස්ථාන රෝහල් පැති බැම්/ ගොඩනැගිලි සංවර්ධනය ආදිය					
ජීවනෝපාය සංවර්ධනය	29	29	21.89	7	12
එකතුව	150	150	130.22	20	83

2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් (2022.12.31 දිනට)

- **වහළ දිරාපත්වීම හේතුවෙන් වාසස්ථානයකට නුසුදුසු තත්ත්වයේ ඇති පේළි නිවාසයන්හි පියසි නැවත සෙවිලි කිරීම.**

  වැවිලි ප්‍රජාව වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම දීර්ඝකාලීන ව්‍යාපෘතියක් බැවින් එම ව්‍යාපෘති නිමවන තෙක් දැනට ජීවත්වන නිවාසයන්හි තත්ත්වය ඉහළ නැංවීමේ අතුරු පියවරක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. 2022.12.31 දිනට ලැයින් කාමර 5ක් නිමකර තිබේ.

- **සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම.**

ජල උල්පත් ආශ්‍රිත කඳුකර ප්‍රදේශ වල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවකි. එම අවධානමෙන් ජනතාව මුදවා ගැනීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. 2022 වර්ෂයේ දී ව්‍යාපෘති සෞඛ්‍යාරක්ෂිත පානීය ජල ව්‍යාපෘති 3ක් නිමකර තිබේ. මීට අමතරව ලෝක බැංකු ආධාර යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින් නුවර හා හැටන්හි ගෘහ ඒකක ඉලක්ක කරගනිමින් මෙන් ම අමාත්‍යාංශය මගින් ලබාදෙන නව නිවාස සඳහා ද සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දීමට කටයුතු කරයි.

- **සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම**

වැවිලි ප්‍රජාවගෙන් බොහෝ පිරිසක් සනීපාරක්ෂක පහසුකම් අවම වීමේ ගැටලුවට මුහුණ පා සිටී. ඒ අනුව සෑම නව නිවසක් සඳහා ම ජල පහසුකම් සහිත නව වැසිකිළියක් සහ ලැයින් කාමර වැසියන් සඳහා අවශ්‍යතාවය මත නව වැසිකිළි ලබාදීම සිදුකරයි. ඒ අනුව 2022.12.31 දිනට මෙවැනි ව්‍යාපෘතියක් සම්පූර්ණ කර තිබේ.

- **ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම**

මේ යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා වතු පාසැල් සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. රැකියාවෙහි නියුතු වතු කම්කරුවන්ගේ වයස අවුරුදු 2 සිට 5 දක්වා වූ දරුවන් දිවා කාලයේ රැකබලාගැනීම ළමා සංවර්ධන මධ්‍යස්ථාන මගින් සිදුවන අතර දැනට පවතින ළමා සංවර්ධන මධ්‍යස්ථාන 550කට අධික සංඛ්‍යාවක් එනම් 38%ක ප්‍රමාණයක් පහසුකම් ඉතා අවම මට්ටමේ පවතින ඒවා වේ. එම මධ්‍යස්ථාන සංවර්ධනය සඳහාත් වතු පාසල්වල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහාත් රු. මි. 15ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. ඒ යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 5ක් 2022.12.31 දිනට සම්පූර්ණ කර තිබේ.

- **වතු ප්‍රවේශ මාර්ග සංවර්ධනය**

භූ විෂමතාව අනුව පවතින දුෂ්කරතාවයන්ට අමතරව වතු මාර්ග බොහොමයක් ඉතා අබලන් තත්ත්වයේ පවතී. මේ හේතුවෙන් වතු ප්‍රදේශයන්හි ජනතාව සිය ගමනාගමන හා ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමේදී සමාජීය ආර්ථික ගැටලු රාශියකට මුහුණ පා ඇත. වතු ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා මෙම වර්ෂයේ රු. මි 35ක් වෙන් කර ඇති අතර 2022.12.31 දින වන විට වතු ප්‍රවේශ මාර්ග 23ක් සම්පූර්ණ කර ඇත .

- ක්‍රීඩා පහසුකම් සැපයීම

වතු ආශ්‍රිත තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන්ට ක්‍රීඩා පුහුණු වීම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව 2022.12.31 දිනට ක්‍රීඩා පිටි 3ක් සංවර්ධනය කර තිබේ.

- **පොදු පහසුකම් සංවර්ධනය**

වැවිලි ප්‍රදේශයන්හි,

- කාණු පද්ධති සංවර්ධනය කිරීම
- ආරක්ෂිත බැම් හා බෝක්කු ඉදිකිරීම
- ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන නගා සිටුවීම
- සුභසාධක සංගම් වෙත අවශ්‍ය උපකරණ ලබාදීම
- හදිසි ආපදා තත්ත්වයන් යටතේ වැවිලි ප්‍රජාවගේ අවශ්‍යතා සැපිරීම.
- ග්‍රාමීය රෝහල් සංවර්ධනය

- ක්ෂේත්‍ර විවේකාගාර

වැනි ව්‍යාපෘති රැසක් මේ යටතේ ක්‍රියාත්මක කරයි. මේ යටතේ ව්‍යාපෘති 34ක් 2022.12.31 දිනට නිම කර තිබේ. **මේ සඳහා වෙන් කළ වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි. 48කි.**

2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්හි භෞතික ප්‍රගතිය

2022 ඉලක්කය **(වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව)**	**2022.12.31 දිනට ප්‍රගතිය**	**භෞතික ප්‍රගතිය %**	**විශේෂ ගැටලු**
(01) නිවාස 522ක් සම්පූර්ණ කිරීම හා නිවාස 573ක් බිත්ති මට්ටමට සම්පූර්ණ කිරීම. **(02) ඉන්දියානු නිවාස අදියර (1) යටතේ නිවාස 1403ක් සඳහා යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම**	නිවාස 323ක් සම්පූර්ණයෙන්ම නිම කර නිවාස 358ක් බිත්ති මට්ටමට සම්පූර්ණ කිරීම. වහළ මට්ටම දක්වා නිවාස 215ක් සම්පූර්ණ කිරීම. නිවාස ඒකක 1898 සඳහා යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම.	62% 87%	-අමුද්‍රව්‍ය හිඟතාව -අමුද්‍රව්‍ය මිල ඉහල යාම -සෙවිලි තහඩු නොමැති වීම.
(03)අබලන් ලැයින් කාමර 2ක වහළ නැවත සෙවිලි කිරීම **ජල සැපයුම් ව්‍යාපෘති 3ක් ආරම්භ කිරීම සහ සංවර්ධනය** **වතු ප්‍රවේශ මාර්ග 24 ක් සංවර්ධනය** **ක්‍රීඩා පිටි 5ක් සංවර්ධනය** **ළමා සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පහසුකම් සැළසීමේ ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කිරීම.** **සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම.** **පොදු පහසුකම් ව්‍යාපෘති 44ක් ක්‍රියාත්මක කිරීම.**	අබලන් ලැයින් කාමර 34ක වහළ නැවත සෙවිලි කිරීම ජල සැපයුම් ව්‍යාපෘති 6ක් ආරම්භ කිරීම සහ සංවර්ධනය කිරීම වතු ප්‍රවේශ මාර්ග 93 ක් සංවර්ධනය කිරීම. ක්‍රීඩා පිටි 25ක් සංවර්ධනය ළමා සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා පහසුකම් සැළසීමේ ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කිරීම. සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති (ඒකක) 220ක් සම්පූර්ණ කිරීම. පොදු පහසුකම් ව්‍යාපෘති 118ක් ක්‍රියාත්මක කිරීම.	100% 100% 96% 60% 83% 100% 77%	-අමුද්‍රව්‍ය හිඟතාව -අමුද්‍රව්‍ය මිල ඉහල යාම -සෙවිලි තහඩු නොමැති වීම.

2.3 ජීවනෝපාය සංවර්ධනය

ශ්‍රමය වෙනුවෙන් නිසි වැටුපක් උපයා ගැනීමට වැවිලි ක්ෂේත්‍රයේ නිරත කම්කරුවන් අපොහොසත් වීම හේතුවෙන් ප්‍රජාව මෙන්ම වැවිලි කර්මාන්තය ද අද මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. එබැවින් එම ප්‍රජාව ක්ෂේත්‍රයේ රඳවා තබා ගනිමින් අමතර ආදායමක් උපයාගැනීම සඳහා ඇති අවස්ථා පුළුල් කිරීම තුළින් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනයත්, නුපුහුණු ශ්‍රමිකයන් ලෙස සේවයට ඇදී යන තරුණ පරපුර පුහුණු ශ්‍රමිකයන් වශයෙන් රැකියාවන්හි නිරතවීමට අවශ්‍ය,

- නිපුණතා සංවර්ධනය හා වෘත්තිය පුහුණුව ලබාදීම.
- ස්වයං රැකියා උත්පාදන මාර්ග හඳුන්වා දීමත් (දැනුම, තාක්ෂණික දැනුම, පුහුණුව හා උපකරණ සැපයීම) සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

2.3.1 නිපුණතා සංවර්ධනය

අමාත්‍යාංශය යටතේ පවතින තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හරහා පාඨමාලා 17ක් විධිමත්ව පවත්වාගෙන යන අතර NVQ මට්ටම ඉහළ වෘත්තීය පුහුණු සහතිකපත්ලාභීන් සඳහා දේශීය සහ විදේශීය රැකියා වෙළඳපොළට ප්‍රවේශ වීමට අවස්ථාවන් සැළසීමට අපේක්ෂිතය.

සෞම්‍යාමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ පිහිටුවා ඇති හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙන් සත්‍ය වශයෙන්ම පාඨමාලා සාර්ථකව නිමකළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ 2019,2020 හා 2021 වර්ෂයන්හි තොරතුරු පහත පරිදි වේ.

වර්ෂය	පුහුණුව සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව	පුහුණුව සාර්ථකව නිම කළ සිසුන් සංඛ්‍යාව
2019	282	197
2020	211	97
2021	287	179

2022 වර්ෂයේ දී සිසුන් 248 දෙනෙකු කාණ්ඩ 2ක් යටතේ ඉහත පාඨමාලාවල අධ්‍යනයේ නිරත වේ.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි 2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය - සාරාංශය

ව්‍යාපෘතිය / වැඩසටහන	ප්‍රතිපාදන (රු.මි.) 2022.12.31 දිනට	වියදම (රු.මි.) 2022.12.31 දිනට (අතැති බිල්පත් සමග)	මූල්‍ය ප්‍රගතිය (%)
වතු නිවාස වැඩසටහන	275	164.69	60
ඉන්දියානු ආධාර නිවාස ව්‍යාපෘතිය - යටිතල පහසුකම් සැපයීම	260	188.03	72
යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්	150	138.13	92
තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය (TVTC)	55	4.29	7
එකතුව	**740**	**495**	**67**

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

ඩබ් .එස් .සත්‍යානන්ද
ලේකම්

2023.02. 28

03. පරිච්ඡේදය

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

කරුණාකර පිටු අංක 22 බලන්න

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 23 බලන්න

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

කරුණාකර පිටු අංක 24 බලන්න

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

කරුණාකර පිටු අංක 25 බලන්න

3.5 ආදයම් එකතු කිරීමේ කාර්ය සාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

කරුණාකර පිටු අංක 26 බලන්න

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

කරුණාකර පිටු අංක 26 බලන්න

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

කරුණාකර පිටු අංක 27 බලන්න

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

කරුණාකර ඇමුණුම් අංක 01 බලන්න

4. පරිච්ඡේදය

4. කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත ඉලක්කය - 2022 වර්ෂය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) තත්‍ය නිමවුම		
			100%-90%	75%-89%	50% - 74%
නිම කරන ලද නව නිවාස සංඛ්‍යාව	ශ්‍රී ලංකා රජය මගින් ඉදිකරන ලද නිවාස (යටිතල පහසුකම් සමග)	522			62%
	ඉන්දියානු ආධාර යටතේ ඉදිකරන ලද නිවාස	180			14%
වහල සෙවිලි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව		ලයින් කාමර 4 ව්‍යාපෘති 2			100%
ප්‍රධාන ජල සම්පාදනය ව්‍යාපෘති සංඛ්‍යාව		ජල ව්‍යාපෘති 3			100%
සම්පූර්ණ කරන ලද නව වැසිකිළි සංඛ්‍යාව		1			100%
සංවර්ධනය කරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථාන/ පෙරපාසල් සංඛ්‍යාව		6			83%
අලුත් වැඩියා කරන ලද සංවර්ධනය කරන / ලද වතු මාර්ග සංඛ්‍යාව		24			96%
ලබාදුන් පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව		44			77%
පවත්වන ලද ප්‍රජා පුහුණු දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව		-			100%
වෘත්තීය පුහුණුව ලබා දුන් සංඛ්‍යාව		-			100%

05.පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක		මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%7 4%	75% 100%
තිරසර සංවර්ධන ඉලක්කය 11 **2030 වනවිට සියලු දෙනාට ම ප්‍රමාණවත්, ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම තහවුරු කිරීම**	ලයින් කාමරවල වෙසෙන පවුල් 4,500 ක් සඳහා නව නිවාස හා ඉඩම් හිමිකම ලබාදීම අඩලන් වූ ලයින් කාමර 1000 ක වහල නැවත සෙවිලි කිරීම	1. ඉදි කරන ලද නව නිවාස සංඛ්‍යාව හා ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු ප්‍රමාණය 2 සෙවිලි කරන ලද ලයින් කාමර සංඛ්‍යාව		**8%** **0.4%**		
තිරසර සංවර්ධන ඉලක්ක 6 වසර 2030 වනවිට සියලු දෙනාට ම ප්‍රසස්ථ මට්ටම් යටතේ පානීය ජලය ලබාගැනීමට සමාන අවස්ථා තහවුරු කිරීම. වසර 2030 වනවිට ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් හා ස්වස්ථතාවක් ලැබීමේ අවස්ථා සියලු දෙනාට ම අත්පත් කර ගැනීම	පානීය ජල පහසුකම් නොමැති පවුල් 4000 ක් සඳහා ජල පහසුකම් සම්පාදනය ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් 3500 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම	1 පානීය ජල පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව 1 සනීපාරක්ෂක පහසුකම් ලැබූ පවුල් සංඛ්‍යාව/			**62%** **61%**	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ශ්‍රී ලංකාවේ වාසය කරන මිලියන එකක් පමණ වන වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

වැවිලි ප්‍රජාව යනු, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේ දී, වඩාත් පහළ ජීවන තත්ත්වයකට උරුමකම් කියනු ලබන ජන කොට්ඨාසයක් වන අතර ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්තවලට අනුව ලංකාවේ අනෙකුත් ජන කොටස් හා සැසඳීමේ දී ඔවුන් උපයන මාසික ආදායම පහළ මට්ටමක පවතින අතර ප්‍රජාවගේ විශේෂයෙන් වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. ජනගහණයෙන් වැඩි ප්‍රතිශතයක් සඳහා ආරක්ෂිත පානීය ජල සම්පාදනය ගැටලුවක් වී ඇත. ඉතා අවම පහසුකම් සහිත වර්ග අඩි 200 ට පමණ සීමාවූ ටකරන් සෙවිලිකල ලැයින් කාමර සිය වාසස්ථාන කොට ජීවත් වේ. තිරසර ලෙස සංවර්ධිත වූ ශ්‍රී ලංකාවක් සඳහා වන තිරසර සංවර්ධන අරමුණු අතරට ගැනෙන දිළිඳුකම අවම කිරීම තහවුරු කිරීම ළමා මන්ද පෝෂණ තත්ත්ව දර්ශක වලට ලහාවීම සහ ආරක්ෂිත හා වැඩිදියුණු කළ වාසස්ථාන හිමිකර දීම, සැමට ප්‍රශස්ථ මට්ටමේ පානීය ජලය ලබා ගැනීමේ අවස්ථා හිමිකර දීම යන ඉලක්ක සාක්ෂාත් කිරීම සඳහා ක්‍රියා කිරීමේ දී, එම පහසුකම් අවම මට්ටමේ පවතින වැවිලි ප්‍රජාව කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව තිබේ.

ඒ අනුව වැවිලි ප්‍රජාව සඳහා සිය ආරක්ෂිත වාසස්ථාන හිමිකර ගැනීමේ අයිතිය තහවුරු කිරීම උදෙසා ඔවුන් වෙත සින්නක්කර අයිතිය හිමිවූ පර්චස් 7 ක භූමි භාගයක් හා පානීය ජල පහසුකම් සමඟ වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් වලින් යුක්ත තනි නිවහන් ලබා දීමට හැකි වීම මෙම අමාත්‍යාංශය ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස සැළකිය හැකිය.

එසේ නමුත්, විවිධ පාරිසරික හේතු හා තාක්ෂණික හේතූන් මත අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම අභියෝගයක් වී ඇත.

නිවාස ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති වීමත්, නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් සපයා ගැනීම අසීරු වීමත්, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත්, විශේෂයෙන් නිවාස ඉදි කිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයේ පවතින දුර්වලතාත් හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් වී ඇත.

වැවිලි ප්‍රජාවගෙන් හරි අඩකට පමණ ආරක්ෂිත පානීය ජල පහසුකම් නොමැති වීමත්, ශ්‍රී ලංකාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ කාර්යභාරයේ දී වැවිලි ප්‍රජාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ නොකොට එම ඉලක්ක වෙත ලඟාවීම අභියෝගයක්ව ඇති අවස්ථාවක, වැවිලි ප්‍රජාව ඉලක්ක කොට ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීමත් විශේෂයෙන්ම ආරක්ෂිත පානීය ජලය සපයා ගැනීම සඳහා සුදුසු ජල මූලාශ්‍ර නොමැති වීමත්, පවතින ජල මූලාශ්‍ර පාදක කර ගනිමින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විශාල මුදලක් වැයවීමත් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු නොකිරීමත් හේතුවන් අපේක්ෂිත ඉලක්ක සපරා ගැනීම ගැටලුක් වී ඇත.

වැවිලි ප්‍රදේශ බොහොමයක් කඳුකරයට සීමාවී ඇති අතර එහි භූමි විෂමතාව සැලකිල්ලට ගැනීමේදී ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීමත්, එම ප්‍රදේශ බොහොමයක් අධි ආරක්ෂිත සංවේදී කලාප වශයෙන් හඳුන්වා දීමත් හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් කල් ගත වීමත් එසේ නොමැති අත්‍යවශ්‍ය ස්ථාන සඳහා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පාරිසරික හේතු නිසා අනුමත නොකිරීමද ගැටළුවක් වී ඇත.

06.පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2022.12.31 දිනට)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	23	14 1* } 15	ඇබෑර්තු - 09
තෘතීයික	08	01	ඇබෑර්තු - 07
ද්විතියික	269	291**	අතිරික්ත - 20***
ප්‍රාථමික	22	23	අතිරික්ත - 01
එකතුව	322	330	37

සටහන :

* - රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වීම මත නිලධාරියාට පෞද්ගලික වන සේ තාවකාලික පදනමින් ශ්‍රී ලං.ක්‍ර.සේ. විශේෂ ශ්‍රේණියේ ඩී.ඩී. මාතරආරච්චි මහතා අතිරේක ලේකම් තනතුරට පත් කර ඇත.

** - පවතින ද්විතියික සේවක සංඛ්‍යාව 291 තුළ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු ද (02) ඇතුළත් වේ.

*** - ද්විතියික මට්ටමේ අතිරික්ත තනතුරු 20, 2019 හා 2020 උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් වන අතර, එම අතිරික්ත තනතුරු මු.රෙ. 71 යටතේ අනුමත කරගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාරය

ඉහත දක්වා ඇති වගුවේ සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතීයික මට්ටමේ ඇබෑර්තු 16ක් පැවතුන ද, නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව මත රාජකාරී සළුලදායිව ඉටු කර ඇත.

.63 මානව සම්පත් සංවර්ධනය

2022වර්ෂය තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු හා රැස්වීම් පිළිබඳ තොරතුරු

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය රු.	විදේශීය		
1	දැනුම කළමනාකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩමුළුව	01	දින 01	3000.0		දේශීය	දැනුම කළමනාකරණය පිළිබඳ
2	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව	56	දින 01	31,168.0		දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ
3	රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය (Government Payroll System)	02	දින 03	30,000.0		දේශීය	රජයේ වැටුප් ක්‍රියාවලිය පිළිබඳ
4	ලිපිගොනුකරණය	05	දින 01	25,000.0		දේශීය	නිවැරදිව ලිපි ගොනු කිරීම පිළිබඳව
5	නිවාඩු විෂයභාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	5000.0		දේශීය	නිවාඩු විෂය සම්බන්ධව
6	නිවාඩු විෂයභාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	5000.0		දේශීය	නිවාඩු විෂය සම්බන්ධව
7	ගිණුම් කටයුතු ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව	02	දින 01	8,000.0		දේශීය	ගිණුම් කටයුතු ප්‍රවර්ධනය
8	රජයේ රියදුරෙකුගේ වගකීම් හා කාර්යභාරය පිළිබඳ පුහුණු වැඩමුළුව	15	දින 01	11,900.0		දේශීය	රජයේ රියදුරෙකු ගේ වගකීම් හා කාර්යභාරය පිළිබඳ
9	පැය 150 දෙමළ භාෂා පාඨමාලාව	55	මාස 05	112,500.0		දේශීය	දෙමළ භාෂාව පිළිබඳ

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	CIGAS පරිගණක වැඩසටහන මගින් සිදු කෙරේ.	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මූදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් -ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	සංචිත වාහන කිහිපයක ඉන්ධන දහනය පරීක්ෂා කර ඇත. දැනට ඉන්ධන නිකුත් කිරීම සීමා කර ඇති බැවින් ඉන්ධන දහනය පරීක්ෂා කිරීම නවතා ඇත	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ	අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලබයි.	
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සළසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සළසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ	අනුකූල නොවේ	සේවය අත ඇර ගිය නිලධාරිනියගේ හිඟ	එවැනි අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීම

	නිරවුල් කර තිබීම		හිටි ශේෂ පැවතීම.	සඳහා අවශ්‍ය සියලු පෞද්ගලික තොරතුරු ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවලට ඇතුළත් කිරීම.
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක්		අධ්‍යක්ෂ ජනරාල) සැලසුම් (විසින් SMEHCI/4/39 හා 2020.10.21දිනැති අභ්‍යන්තර සටහන මඟින් විමසා ඇති	

	සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම		පරිදි පුරවැසි ප්‍රඥප්තියට අදාළව පාලන අංශයේ තොරතුරු සැලසුම් අංශය වෙත 2020.12.15දින යොමු කරන ලදී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම		එම	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම අනුව පූර්ණ පාඨමාලා සඳහා සීමා සහිත ප්‍රතිපාදන ලැබී තිබූ බැවින් අපේක්ෂිත පාඨමාලාවන් පැවැත්වීමට නොහැකි විය. එබැවින් සැලසුම් කල පරිදි පැය 12ක පුහුණුවක් ලබා දීමට නොහැකි විය. කෙසේ වෙතත්, අමාත්‍යාංශ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම තුළින් කාර්යක්ෂමතාවය හා සඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත	

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HUD/D/MUDH/FA/02/2022/A/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 123 - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත්කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු. මිලියන 117.15 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එම අගය රු. මිලියන 74.78 ක් ලෙසත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු. මිලියන 105.91 ක් ලෙසත් දක්වා තිබීමෙන් එකී වටිනාකම් එකිනෙකට නොසැසඳුනි.

1.6.2 අග්‍රිම ගිණුමේ ශේෂය

1996 වර්ෂයේ සිට නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය යටතේ නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවති රු. මිලියන 20 ක නොපියවූ අග්‍රිම හර ශේෂය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ අග්‍රිම ගිණුමට මාරු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මු.රෙ. 108 පරිදි මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන ජාතික අයවැය ප්‍රතිපාදන සලසා ගෙන මු.රෙ. 109 පරිදි ලියා හැරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

	ලේඛණ වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
i.	නැන්පතු ලෙජරය	මුදල් රෙගුලාසි 565(2)	2022 අංක 21 දරණ විසර්ජන (සංශෝධිත) පනතින් අහෝසි කර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතට අන්තර්ගතනය

විස්තරද ඇතුලත් කර නැන්පත් ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුනරාවර්ථන වැය විෂයන් 11 ක එකතුව රු. මිලියන 2.33 ක ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන වැයවිෂයයන් 20 ක එකතුව රු. මිලියන 313.06 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිවී තිබුණු බැවින් මෙම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට අපේක්ෂා කරන ලද, ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැඩිදියුණු කිරීම, නිවාස ඉදිකිරීම් සහ ස්මාට් පන්තිකාමර ඉදිකිරීමේ වැඩසටහන ආදී කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ආ) වැය විෂයය අංක 123-1-1-0-1401-0/11 සඳහා සංශෝධිත අයවැය මගින් රු. මිලියන 2 ක් වෙන්කර තිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු මගින් තවත් රු. මිලියන 0.77 ක් ලබාගෙන තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.45 ක් ඉතිරිව පැවති අතර පරිපූරක ඇස්තමේන්තුව මගින් ලබාගත් මුදල් අදාල කාර්යය සඳහා වැය කර ද නොතිබුණි.

(ඇ) වැය විෂයයන් 7 ක් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර තිබුණු රු. මිලියන 176.60 ක් වූ සම්පූර්ණ මුදලම උපයෝජනය නොකර වෙනත් වැය විෂයයනට මාරු කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 3 ක් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර තිබුණු රු. මිලියන 31 ක මුදලින් රු. මිලියන 27.27 ක් එනම් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් උපයෝජනය නොකර වෙනත් වැය විෂයයනට මාරු කර තිබුණි.

(ඉ) පුනරාවර්ථන වැය විෂයයන් 76 ක් යටතේ ප්‍රතිපාදිත රු. මිලියන 241.72 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 39 ක් යටතේ ප්‍රතිපාදිත රු. මිලියන 2,819.53 ක ප්‍රතිපාදන වලින් සියයට 10 සිට සියයට 99 අතර පරාසයක එනම් පිළිවෙලින් රු. මිලියන 60.10 ක් හා රු. මිලියන 1,203.08 ක් ලෙස එකතුව රු. මිලියන 1,263.18 ක් ඉතිරි වී තිබුණි. ඒ හේතුවෙන් මෙම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට අපේක්ෂා කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම් සහ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අංශ 04 විසින් 2022 වර්ෂය තුළ ඇතිකරගෙන තිබුණු රු. මිලියන 20.59 ක් වටිනා බැරකම් 77 ක් ,මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශනය තුල ඇතුලත් කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ණිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව අමාත්‍යාංශය විසින් වැයවිෂයයන් 06 ක් වෙනුවෙන් සලසා තිබුණු රු. මිලියන 3.43 ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. මිලියන 396.57 ක බැරකම් වලට එළඹ තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
01	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
i	මු. රෙ. 1647(ආ)	වාහනයක භාරය වෙනස්කල සෑම අවස්ථාවකදීම වහාම සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් වතු නිවාස හා ප්‍රජා යටතල පහසුකම් අංශය විසින් එලෙස භාරය වෙනස් කළ වාහන සම්බන්ධයෙන් එසේ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.
ii.	මු.රෙ.751	රජයේ ආයතනවලට ලැබෙන සියලුම භාණ්ඩ වහාම

බඩුලේඛන පොතෙහි ඇතුලත් කල යුතු වුවද, අහෝසි වූ අමාත්‍යාංශවලින් මාරු කරන ලද රු. මිලියන 1,876.26 ක වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිලිබඳ විස්තර අමාත්‍යාංශ බඩුලේඛන පොත්වල ඇතුලත් කර නොතිබුණි.

iii. මු.රෙ. 755 (1) හා (2)

රජයේ දේපලවල භාරය වෙනත් පාර්ශවයක් වෙත පැවරීමේදී තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපල භාරදී ඒවා භාරදෙන ලද නිලධාරියාගෙන් ලද බවට කුවිතාන්සි ලබාගත යුතු අතර එම භාණ්ඩ භාරගැනීමේදී තොග ලෙජරයෙහි දැක්වෙන භාණ්ඩ ශේෂයෙහි නිවැරදිබව පරීක්ෂාකර භාරගත යුතු අතර විෂමතා පවතී නම් වාර්තාවක් සකසා එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. නමුත් 2022 සැප්තැම්බර් 30 දින අහෝසි කරන ලද රාජ්‍ය අමාත්‍යාංශවල මූල්‍ය නොවන වත්කම්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත මාරු කිරීමේදී ඉහත මුදල් රෙගුලාසි ප්‍රකාරව ලෙජරයෙහි දැක්වෙන භාණ්ඩ ශේෂයේ නිවැරදි බව පරීක්ෂා කර භාරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස 493 ක යටිතල පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 75 ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු නිවාසයක් වෙනුවෙන් යටිතල පහසුකම් සපයා නොතිබුණි.

(ආ) ඉන්දියානු නිවාස 10,000 ක වැඩසටහන යටතේ, නිවාස සඳහා මූලික යටිතල පහසුකම් සැපයීම සහ සමීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය යටතේ රු.මිලියන 40 ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන්හි කිසිදු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) සුහුරු පංති කාමර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ තුවරළිය, මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්කවල තෝරාගත් පාසල් සඳහ

ඉන්දියානු ආධාර යටතේ රු. මිලියන 100 ක් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් රු. මිලියන 5 ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන්හි කිසිදු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) හැටන් තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් ඉන්දියානු ආධාර යටතේ රු. මිලියන 50 ක මුදලක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන්හි කිසිදු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

3.1.2 අනුමත කර ඇතත් ආරම්භ නොකර අතහැර දැමූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශේෂ ව්‍යාපෘති යටතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ලෙස වැවිලි මානව සංවර්ධන භාරය යටතේ අනුමත කර තිබූ රු. මිලියන 20.69 ක ව්‍යාපෘති 08 ක් හා ප්‍රාදේශීය සභා හා නගර සභා යටතේ අනුමත කර තිබූ රු. මිලියන 13.39 ක ව්‍යාපෘති 21 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) විශේෂ ව්‍යාපෘති යටතේ බලන්ගොඩ ප්‍රදේශයේ දිළිඳු ළමුන් සඳහා පාසැල් උපකරණ ලබාදීමේ ව්‍යාපෘතියක් ලෙස 2022 මාර්තු 29 දින අනුමත කල ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 0.29 ක් වූ ව්‍යාපෘතිය ආරම්භ නොකොර අතහැර දමා තිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 21,045 ක් වැය කර තිබුණද, ව්‍යාපෘතිය නිම කල යුතු දිනය ඉක්මවා වසර 03 ක කාලයක් ගත වී තිබුණද, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකි වී තිබුණි. තවද අරුවක්කාලු සනීපාරක්ෂක කසල රැඳවුම් මධ්‍යස්ථානය ගංවතුර ආපදා තත්වයන්ට මුහුණදීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් නොකිරීම මත 2021 වර්ෂයේ ඇතිවූ ගංවතුරෙන් යටවී අක්‍රිය තත්වයට පත්ව තිබූ යන්ත්‍රෝපකරණ සමාලෝචිත වර්ෂය අවසන් වන විටද යථා තත්වයට පත්කර නොතිබුණි.

(ආ) වතු අංශය මඟින් ක්‍රියාත්මක කර තිබුණු "හරිත රන් නිවාස වැඩසටහන" යටතේ නිවාස 466 ක් සම්පූර්ණ කිරීමට රු. මිලියන 65 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 61 ක් පමණක් විය. එමෙන්ම 2021 නොවැම්බර් වන විට ඉදිකිරීම් සම්පූර්ණ කළ යුතු හැටන්, නුවරඑළිය, මහනුවර, රත්නපුර, කෑගල්ල හා

ගාල්ල යන කලාප 06 හි නිවාස ඉදිකිරීම් සඳහා වෙන්කල රු. මිලියන 451 ක මුදලින් රු. මිලියන 227 ක් එනම් සියයට 50 ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉදිකිරීම් කටයුතු වල වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) වතු අංශය මගින් ක්‍රියාත්මක කර තිබුණු හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ, වතුකරයේ පවුල් 1,000 ක ඉඩම් අයිතිය තහවුරු කිරීමට රු. මිලියන 2.5 ක ප්‍රතිපාදනයක් කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 30 ක පහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) ඉන්දියානු නිවාස 10,000 ක වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුලදී නිවාස 3,525 ක් ඉදිකිරීම් සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීම්, ඉදිකිරීම් සම්පූර්ණ කිරීම්, ඉඩම් නිදහස් කිරීම් සහ වැඩ කණ්ඩායම් පිහිටුවීම් සඳහා ඉන්දියානු ආධාර යටතේ රු. මිලියන 400 ක මුදලක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් ලබා නොතිබුණි. එමෙන්ම ඉන්දියානු ආධාර නිවාස 4,000 වැඩසටහන යටතේ නිවාස 180 ක් සම්පූර්ණ කිරීම් වෙනුවෙන් රු.මිලියන 95 ක ප්‍රතිපාදන වෙන්කර තිබුනද, 2022 දෙසැම්බර් 31 දිනට ඉන් රු. මිලියන 35 ක් වැයකර නිවාස 26 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. අපේක්ෂිත නිමවුම් සමග සැසඳීමේදී මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් හා භෞතික ප්‍රගතිය සියයට 14 ක පහළ මට්ටමක පැවතුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) සියක් නගර ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 496 ක් වැයකර වැඩ අවසන් කල ව්‍යාපෘති 15 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල ආයතන වෙත භාරදීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) රු. මිලියන 153 ක් වැයකර ඉදිකර තිබූ බුලත්සිංහල, ඇඟල්ඔය බහු මාදිලි ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකි පරිදි සම්පූර්ණ කර නොතිබීම නිසා 2018 වසරේ සිට වසර 4 කට අධික කාලයක් නිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) වතු ප්‍රජාව සඳහා නිවාස ඉදිකර, අදාල නිවාස හිමියන්ගෙන් අයවිය යුතු නිවාස ණය ප්‍රමාණය වාරික වශයෙන් අයකර ගැනීම් යටතේ 2017 හා 2018 වර්ෂවල වැඩ අවසන් කර නිවාසලාභීන්ට යතුරු භාරදී තිබූ ඇස්තමේන්තුගත වටිනාකම් රු. මිලියන 2,308 ක් වූ නිවාස 2,300 ක් හා යතුරු භාරදී නොතිබූ ඇස්තමේන්තුගත වටිනාකම් රු. මිලියන 897 ක් වූ නිවාස 886 ක් වෙනුවෙන් ණය වාරික අයකරගැනීමේ වගකීම් වැවිලි මානව සංවර්ධන භාරය වෙත භාර දී තිබුණු අතර එම ආයතනය වෙත කළමණාකරණ ගාස්තු වශයෙන් රු. මිලියන 223 ක් ගෙවා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන්

අයවිය යුතු රු. මිලියන 1,656 ක් අය කර ගැනීමට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ක්‍රියාත්මක කර වැඩ අවසන් කර නිවාසලාභීන්ට භාරදී තිබූ හා භාරදී නොතිබූ ඇස්තමේන්තුගත වටිනාකම් පිළිවෙලින් රු. මිලියන 612 ක් හා රු. මිලියන 49 ක් වූ නිවාස 1016 ක් වෙනුවෙන් ණය අයකර ගැනීමේ කළමණාකරණ ගාස්තු වශයෙන් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු. මිලියන 46 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු රු.මිලියන 340 ක ණය වාරික අය කර ගැනීමට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය අපොහොසත් වී තිබුණි.

(ඉ) වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය විසින් 2020 හා 2021 වර්ෂවල ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම් රු. මිලියන 1,039 ක් වූ නිවාස ව්‍යාපෘති 42 ක වැඩ අවසන් කර ප්‍රතිලාභීන්ට නිවාස භාරදී ණය වාරික අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) නව ජීවන නිවාස ව්‍යාපෘති වල නිවාස ණය වාරික අයකිරීම් ප්‍රගතිය සියයට 01 සිට සියයට 68 ක පරාසයක පවතින අතර, නිවාස ව්‍යාපෘති 14 කට අදාල නිවාස 282 ක් වෙනුවෙන් අයවිය යුතු නිවාස ණය රු. මිලියන 77 ක සම්පූර්ණ ණය ප්‍රමාණයම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය අපොහොසත් වී තිබුණි.

3.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) ඡේදය අනුව ඉඩම් අත්පත් කර ගෙන, වන්දි ගෙවීමේ සහ නැවත පදිංචිකිරීමේ කටයුතු අවසන් කර ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කළහැකි බවට කරුණු සනාථ කර ගැනීමෙන් අනතරුව කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කල යුතු වුවත්, රු. මිලියන 563 ක් වටිනා පිටිපන තලගල අදියර 1 මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉහත උපදෙස් පරිදි කටයුතු නොකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර, ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළුවක් ඇතිවීම හේතුවෙන් අදාල මාර්ගයේ වැඩ නිම කිරීමට නොහැකිව අතරමග නතර කර තිබුණි. එබැවින් අදාල මාර්ගය ඉදිකිරීමෙන් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ ආරම්භ කරන ලද රු. මිලියන 3,437.63ක් වටිනා ව්‍යාපෘති 16 ක් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 3.4.5/2022 චක්‍රලේඛ පරිදි නවතා දමා තිබුණි. මෙහි ඇතැම් ව්‍යාපෘති සඳහා සියයට 1 සිට සියයට 53 දක්වා පරාසයක වියදම් දරා

තිබුණු අතර එම ව්‍යාපෘති අත්හිටවුවහොත් ඒ සඳහා දරන ලද රු. මිලියන 178 ක මුදල අනාර්ථික වියදමක් විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4 ක් වූ, 2020 දෙසැම්බර් 10 දින වැඩ ආරම්භ කර තිබූ තලවකැලේ සාම්ප්‍රදායික අවන්හල් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන්, රු. මිලියන 1 ක් ගෙවා තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අතහැර දමා ඇති බවත් ගෙවන ලද මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද රු. මිලියන 9 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත, 2020 අප්‍රේල් 12 දින ආරම්භ කර තිබූ වටගොඩ ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන මගින් සිදු කරන කුකුළු පාලනය, එළු පාලනය, බිම්මල් වගාව හා පොලිතින් ආශ්‍රිත වගා ව්‍යාපෘතීන් වෙනුවෙන් රු. මිලියන 1.8 ක් ගෙවා තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අතහැර දමා ඇති බවත් ගෙවන ලද මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඈ) නිවාස අංශය විසින් 2017 - 2020 කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 4,989 ක් වූ නිවාස ව්‍යාපෘති 05ක් යටතේ නිවාස 27,555ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා රු. මිලියන 4,025 ක් වැය කර තිබුණු අතර ඉන් නිවාස 5,604 ක පමණක් වැඩ නිමකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිවල වැඩ සම්පූර්ණ නොකොට අතරමග නවතා දමා තිබුණි.

3.1.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) වතු අංශය යටතේ, නිවාස ව්‍යාපෘති 10 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 162 ක ඇස්තමේන්තුගත වටිනාකමින් රු. මිලියන 31.39 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ආ) එමෙන්ම ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් 2019 වර්ෂයේ ආරම්භ කරන ලද "වැලිඔය නිවාස" යෝජනා ක්‍රමය සඳහා රු. මිලියන 32 ක් වියදම් දරා ඉදිකිරීමට ඉලක්කගත නිවාස 256 කින් කිසිදු නිවාසයක සම්පූර්ණයෙන් වැඩ නිමවා නොතිබුණු අතර 2019 වසරේදී ආරම්භ කරන ලද මුලතිව්, කිළිනොච්චි නිවාස වැඩි දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 530 ක් වියදම් දරා තිබුණද කිසිදු නිවසක ඉදිකිරීම් සම්පූර්ණයෙන් අවසන්ව නොතිබුණි. තවද 2021 වර්ෂයේ ආරම්භ කරන ලද "හිඹුටු උයන නිවාස" යෝජනා ක්‍රමය සඳහා රු. මිලියන 26 ක් වියදම් කර තිබුණ ද කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර 2021 වර්ෂයේ ආරම්භ කර රු. මිලියන 5 ක වියදම් දරා තිබූ කොළඹ ප්‍රදේශයේ නිවාස යෝජනා ක්‍රම වල ජල පොම්ප සවිකිරීම හා පොම්පාගාර අළුත්වැඩියාව සඳහා වූ ව්‍යාපෘතියෙහිද කිසිදු ප්‍රගතියක් ලබාකර ගෙන නොතිබුණි.

(ඇ) උතුරු නැගෙනහිර පළාත්වල වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශවල ජනතාව සඳහා ජල පිරිපහදු ඒකක 115 ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් රු. මිලියන 481 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හරහා පෞද්ගලික සමාගමකට පිරිනමා තිබුණි. මූලික අදියරේ පිරිපහදු පද්ධතීන් 50 හි මුළු ඇස්තමේන්තුගත වටිනාකම් වන රු. මිලියන 209 කින් රු. මිලියන 111 ක් ජාතික ප්‍රජා ජලසම්පාදන දෙපාර්තමේන්තුව මගින් වැය කර තිබුණද, ජල පවිත්‍රකරණ පද්ධති ක්‍රියාකාරී තත්ත්වයකට පත්කර නොතිබුණි.

(ඈ) ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් උතුරු නැගෙනහිර පළාත්වල පවුල් සඳහා කොන්ක්‍රීට් පැනල් නිවාස ඒකක 300 ක් ඉදිකිරීම සඳහා වෙන්කල රු. මිලියන 384 ක මුදලින් රු. මිලියන 106 ක් අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත ද, රු. මිලියන 3 ක් උපදේශක ආයතනය වෙතද ගෙවා තිබුණු නමුත්, සත්‍ය වශයෙන්ම ඉදිකළ නිවාස ගණන 12 ක් පමණක් විය. එසේම 2022 දෙසැම්බර් 31 දිනට නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස ඉදිකර ඇති පෞද්ගලික ඉඩම් 50 ක් පවරාගත යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට වන්දි ගෙවා පවරාගත් ඉඩම් ගණන 08 ක් පමණක් විය.

3.2. **විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUDP)**

(i) ඇස්තමේන්තුගත වටිනාකම් රු. මිලියන 353 ක් වූ නොරිස් ඇල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට එරෙහිව ඒ අවට ඇති මහල් නිවාස ඒකකවල නිවැසියන් විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබීම හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ව්‍යාපෘතිය ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (IFMS) ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 77.4 ක් වැය කර තත්‍ය කාලීන පාලන පද්ධති මධ්‍යස්ථානය (RTC) ස්ථාපිත කර තිබුණද, අධීක්ෂණ පාලන සහ දත්ත රැස් කිරීමේ පද්ධතිය (SCADA) සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර නොතිබුණි.

(ආ) උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP)

(i) ගාල්ල නගරයේ ගංවතුර පාලන ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා වෙනුවෙන් රු. මිලියන 21.49 ක් ගෙවා තිබුණු නමුත් මෙම ව්‍යාපෘතිය අතරමග නතර කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට නොහැකිව තිබුණි.

(ii) ගාල්ල මොරගොඩ ප්‍රධාන ඇල සහ පන්සල් අතුරු මාර්ගය ඉදිකිරීමේ (Temple by pass) ව්‍යාපෘතියේ මුල් කොන්ත්‍රාත් වියදම රු. මිලියන 845 ක් වූ අතර ඇල මාර්ගයේ මුලු දිග මීටර් 4250 කින් මීටර් 1850 ක් පමණක් නිම කිරීම හේතුවෙන් එහි සම්පූර්ණ ප්‍රතිලාභ ජනතාවට අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම් වලට අදාල ඉඩම් නිසි පරිදි පවරා නොගැනීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

(iii) එටිනාකම ඩොලර් මිලියන 202 ක්වූ උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහනේ එක් සංරචකයක් වන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය (Kandy Multimodal Transport Terminal - KMTT) කාලීනව ආරම්භ කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ඒ සඳහා වෙන්කළ ඩොලර් මිලියන 92 ක ණය ප්‍රමාණය ලබාදීම ණය නියෝජිත ආයතනය අවලංගු කිරීමෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය (SCURP)

(i) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතියේ, කොන්ත්‍රාත්තු 4 ක් සඳහා දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේදී ඇමෙරිකන් ඩොලර්වලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් විවිධ වූ ප්‍රතිශතයන් පදනම් කර ගෙවීමේ අවාසිදායක කොන්දේසිවලට ව්‍යාපෘතිය එකඟවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට බිල්පත් සියවීමේදී, ගෙවන දිනට පවතින විදේශ විනිමය අනුපාතය මත ගෙවන ලද ඩොලර් එටිනාකම ශ්‍රී ලංකා රුපියල් මගින් ගෙවීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට එකඟ වූ කොන්ත්‍රාත් එටිනාකමට වඩා රු. මිලියන 970.67 ක් ගෙවීම් කර තිබුණි.

(ii) ඇපල් වන්න අදියර (ii) නිවාස ඒකක 700 ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමස්ථ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 31 ක වැඩ නිමකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ගෙන්වීමේ ප්‍රමාදය හා අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් එහි භෞතික ප්‍රගතිය සියයට 22 ක පහළ අගයක් ගෙන තිබුණි.

(iii) නිවාස ඒකක 300 ක් ඉදිකිරීම් සඳහා වූ ඔබේසේකරපුර නිවාස ව්‍යාපෘතිය 2022 මාර්තු 29 දින, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් වැඩ නවතා දමා තිබුණු අතර ඒ අවස්ථාව වන විට එහි භෞතික කාර්යසාධනය සියයට 14 ක්

පමණක් විය. නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු නැවත ආරම්භකර නොතිබුණි.

(iv) ව්‍යාපෘතියේ ණය ගිවිසුමේ උපලේඛණ 02 අනුව,ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිනට මාස 06 කට නොඅඩු කාලයකදී බැංකුවට සැහීමකට පත්විය හැකි කොන්දේසි සහිතව ප්‍රමාණවත් සුදුසුකම්ලත් උපදේශකයින් සංඛ්‍යාවක් පත්කර ප්‍රතිපත්ති යෝජනා පිළියෙල කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට වසර 3 ½ ක කාලයක් ඉකුත්ව ගොස් නිබුණද, ව්‍යාපෘතිය විසින් උපදේශකයින් පත්කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ හේතුවෙන් පාරිසරික සහ සමාජ කළමනාකරණ රාමුව (Environmental and Social Management Planning Framework) සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව (Resettlement Policy Framework) පිළියෙල කර නොතිබුණු අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක්ද (Resettlement Action Plan) පිළියෙල කර නොතිබුණි.

(v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ 2 වන සංරචකය යටතේ ඉඩම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් 11 ක් යටතේ 2022 වර්ෂය අවසන් වන විට ඉඩම් අක්කර 111.5 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතව තිබුණද 87 වත්නෙහි අක්කර 4 ක ඉඩම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පමණක් සිදුකර තිබුණි.

(ඇ) නාගරික ව්‍යාපෘති පිලියෙල කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය (UPPF)

(i) 2020 අගෝස්තු 18 දින සිට නාගරික ව්‍යාපෘති පිලියෙල කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ සියලුම මෙහෙයුම් කටයුතු නවතා දැමීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් ඉටුකිරීමට අපේක්ෂිත උපදේශන වාර්තා 68 ක් ලබාගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය නතර කරන විට ලබා තිබූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 42 සහ 68 ක පරාසයක විය.

(ii) 2022 අප්‍රේල් 27 දිනැති ආසියානු සංවර්ධන බැංකුවේ ලිපියට අනුව ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)

අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය විසින් 2022 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 2,123 ක් වූ පැකේජ 5 ක වැඩ ආරම්භ කර තිබූ අතර ඉන් 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළ යුතු පැකේජ 4 කින් පැකේජ 2 කට අදාල වැඩ පමණක් නිමකර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් පිරිනමා නොතිබුණු ව්‍යාපෘති පැකේජ 7 ක් වූ අතර එම ව්‍යාපෘතීන් සඳහා ලබා දීමට එකඟ වූ ණය මුදල රු. මිලියන 5,025 ක් විය. එය මුළු ණය මුදලින් සියයට 62 ක් වන අතර ව්‍යාපෘති කාලීනව ආරම්භ නොකිරීම හේතුවෙන් මෙම ණය මුදලින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා කර ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි.

3.3 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1(ඇ) ඡේදය ප්‍රකාරව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීමකින් තොරව එවකට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අංශය විසින් සුහුරුපාය ගොඩනැගිල්ලේ 17 සහ 18 වන මහල්හි කාර්යාල ස්ථාපිත කිරීම සහ ලේඛනාගාරය සැකසීමේ කාර්යය හදිසි ප්‍රසම්පාදන ක්‍රමය භාවිතයෙන් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන 2021 දෙසැම්බර් 27 දින ඉදිකිරීම් වැඩ අවසන්කර තිබුණද මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 5.95 ක් ගෙවා නිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 (අ) ඡේදයට පටහැනිව මෙම කාර්යය සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන තිබුණේ අදාල කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතුද අවසන් කල පසුව බව නිරීක්ෂණය විය.

3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අංශය යටතේ පැවති වාහනයක් 2022 අප්‍රේල් 21 දින රාජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා අනුයුක්ත කර තිබුණු අතර පසුව එම රාජ්‍ය අමාත්‍යවරයා වෙනත් අමාත්‍යාංශයකට මාරුවී ගොස් තිබුණු නමුත් වාහනය නැවත අමාත්‍යාංශයට භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වතුනිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය සතුවූ වාහන 08 ක් හා නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අංශය සතු වාහනයක් සෞම්‍ය මූර්ති කොන්ඩමන් අනුස්මරණ පදනම් හා වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය සහ පැවති මැණික් හා ස්වර්ණාභරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබූ නමුත් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව එම මෝටර්රථ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැවත අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි.

3.5 ඌන උපයෝජිත වත්කම්

(අ) ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අංශය සතුව පැවති සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ලබා දී ඇති වාහන 03 ක් ඌන උපයෝජිතව එම පරිශ්‍රයේ ගාල් කර තිබූ අතර මෙම වාහන අමාත්‍යාංශය වෙත භාරගෙන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 උපදෙස් අනුව අපහරණ කිරීමට හෝ නැවත අළුත්වැඩියා කොට පරිහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තවද අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම නිසා රු. මිලියන 7 ක් වටිනා මෝටර් රථයක් වසර 1 ½ ක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙනූ නිෂ්කාර්යව පැවතුනි.

3.6 පාඩු හා අත්හැරීම්

මූ.රෙ. 109 අනුව පොතෙන් කපාහැරීම් හා අයකර ගැනීම් පිලිබඳ ප්‍රකාශනයෙහි රු. මිලියන 5.31 ක් වටිනා අලාභහානි 13 ක් පිලිබඳව වාර්තා කර නොතිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වතුනිවාස හා ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ පැවති රිය අනතුරු වලට භාජනය වූ රු. මිලියන 4 ක අලාභ සිදුවී ඇති වාහන සම්බන්ධයෙන් මූ.රෙ.105 අනුව කටයුතු කර අලාභය අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 දරන අයවැය වක්‍රලේඛයේ 18 ඡේදය පරිදි අහෝසිවී ගිය රාජ්‍ය අමාත්‍යාංශවලට අදාළ නිල බැංකු ගිණුම් වසා දැමීමේ කාර්යයේ වගකීම අහෝසි වූ රාජ්‍ය අමාත්‍යාංශවල ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගේ වගකීම වූවද, එම රාජ්‍ය අමාත්‍යාංශ නමින් විවෘත කරන ලද බැංකු ගිණුම් විගණිත දිනය දක්වාම වසාදැමීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කටුබැද්ද වෙළෙඳපොල ගොඩනැගිල්ලේ මුළු පිරිවැයෙන් සියයට 15 ක් එනම් රු. මිලියන 29.73 ක් මොරටුව මහ නගර සභාව විසින් දැරිය යුතු වූවද, නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අංශය විසින් එම මුළු මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා නිබුණු නමුත් මොරටුව මහ නගර සභාවෙන් අයකරගත යුතු ඒකී මුදල 2023 මාර්තු 31 දින දක්වාම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

4. නිරසර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට සියලු දෙනාටම ප්‍රමාණවත් ආරක්ෂිත නිවාස ලැබීම හා වාසස්ථාන වැඩිදියුණු කිරීම නිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී ලබාගෙන තිබූ ප්‍රගතිය සියයට 8 කට වඩා පහළ මට්ටමක පැවතුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු නොකිරීම

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අංශය විසින් පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණු අතර එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් නිවාසවල නීත්‍යානුකූල අයිතිය නිවාසලාභීන්ට ලැබී නොතිබුණි. තවද වන්දි මුදල් ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ගෙන් මීට වසර 20 කට පෙර ඉඩම් අත්පත්කර ගෙන නිවාස ඉදිකර තිබුණු නමුත් අදාළ ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගෙවා නොතිබුණි.

5.2 පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

අංක 05/2008 හා 05/2008 (1) දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පුරවැසි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසාන වන විට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙහි අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් 67 ක අතිරික්තයක් හා පුරප්පාඩු 162 ක් වාර්තා වී තිබුණු අතර එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 43 ක් පැවතීම නාගරික සංවර්ධනය හා නිවාස ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සැකසීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය ලබාදීමේ කාර්යයන් කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත් : 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව